Funded by
the European Union

Implemented by

National Peace Council of Sri Lanka

In partnership with

PAFFREL

# පුරවැසි ඡන්දදායක අධ්‍යාපනය පිළිබඳ පුහුණු අත්පොත



Funded by the European Union

Implemented by

ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය
National Peace Council of Sri Lanka

In partnership with

PAFFREL

# පුරවැසි ඡන්දදායක අධ්‍යාපනය පිළිබඳ පුහුණු අත්පොත සහ මෙවලම් කට්ටලය

**- පැෆ්රල් -**


**එම්.එම් මොහොමඩ් මහතා**

විශ්‍රාමික මැතිවරණ කොමසාරිස් ජනරාල්,

මැතිවරණ කොමිසමේ හිටපු සාමාජික

**මහාචාර්ය මොහොමඩ් මහීස්**

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

## Disclaimer

**"This publication was funded by the European Union. Its contents are the sole responsibility of PAFFREL (People's Action for Free and Fair Elections) and do not necessarily reflect the views of the European Union. "**

## දැනුවත් පුරවැසියෙකු වෙමු

සර්වජන ඡන්ද බලය ලැබී වසර සියයකට ආසන්න කලක් ගත වුවද පුරවැසියන් ලෙස අප ජනතා පරමාධිපත්‍ය හා භාවිතය, මැතිවරණ ක්‍රම, පුරවැසි වගකීම, වැනි කරුණු පිළිබඳ තව දුරටත් දැනුවත් විය යුතු බව පැෆ්රල් සංවිධානයේ විශ්වාසයයි.

එවැනි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂයෙන්ම ඡන්ද දායකයන් දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් පැෆ්රල් සංවිධානය මෙම පොත් පිංච ඔබ අතට පත් කරන අතර ඒ සඳහා දායකත්වය දැක්වූ හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල් සහ කොමිෂන් සභා සාමාජික එම්.එම්.මොහොමඩ් මහතා සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යානාංශයේ මහාචාර්යය මොහොමඩ් මහීස් මහතාටත් එම කටයුත්ත සාර්ථක ලෙස මහජන සම්බන්ධීකරණය කළ පැෆ්රල් සංවිධායේ ජ්‍යේෂ්ඨ ව්‍යාපෘති නිලධාරි ශිවකුමාර් සත්‍යරාජ් මහතාටත්, ජ්‍යේෂ්ඨ ව්‍යාපෘති නිලධාරි ඉදුවර අර්ථනායක මහතාටත් ව්‍යාපෘති නිලධාරි ඉස්සත් ඉන්හාම් මහතාටත් ස්තූතිවන්ත වෙමි.

මෙම පොත පරිශීලනය කිරීම හරහා ඔබ දැනුවත් හා සක්‍රිය පුරවැසියකු වනු ඇතැයි අප විශ්වාස කරමු.

**රෝහණ හෙට්ටිආරච්චි**
විධායක අධ්‍යක්ෂක
පැෆ්රල්

## අන්තර්ගතය

## ඡන්දදායක අධ්‍යාපනය


| අංකය | | පිටු අංකය |
|---|---|---|
| 1. | ජනතා පරමාධිපත්‍යය හා ප්‍රජාතන්ත්‍රවාදය | 01 |
| 2. | ඡන්දය අපේ අනාගතය තීරණය කරයි | 03 |
| 3. | මැතිවරණ යාන්ත්‍රණය | 06 |
| 4. | ඡන්ද හිමියා | 22 |
| 5. | අපේ අපේක්ෂකයා | 25 |
| 6. | අපේක්ෂකයකු පිළිබඳ මාර්තු 12 නිර්ණායක | 27 |
| 7. | නිවැරදිව ඡන්දය දීම | 29 |
| 8. | අපිත් එක්ක එකතු වෙමුද | 32 |


## ප්‍රජා අධ්‍යාපනය


| | | |
|---|---|---|
| 01 | හැඳින්වීම | 38 |
| 02 | අරමුණු | 39 |
| 03 | පුහුණුවේ අපේක්ෂිත ප්‍රතිඵලය | 39 |
| 04 | ඡන්ද දායකයින්ගේ අධ්‍යාපන පුහුණුවේ අන්තර්ගතය | 40 |
| 4.1 | ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත්කම | 40 |
| 4.2 | ක්‍රියාශීලී පුරවැසියෙක් යනු කවුරුන් ද? | 41 |
| 4.3 | හරිත නායකත්වය | 42 |
| 4.4 | විධිමත් අධ්‍යාපනයේ මැතිවරණ (දේශපාලන) සාක්ෂරතාව | 44 |
| 4.5 | ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම | 46 |
| 4.6 | ඇතුළත් සහභාගීත්වය සඳහා ඡන්දදායක අධ්‍යාපනය | 48 |
| 4.7 | දේශපාලන සහභාගීත්වය කෙරෙහි බලපාන දේශපාලන නොවන සාධක | 50 |
| 4.8 | මැතිවරණ කාලසීමාව තුළ සිදුවන දූෂණ අක්‍රමිකතා | 51 |
| 05 | පුහුණු කිරීමේ ක්‍රමවේදය | 52 |
| 06 | පුහුණුව සඳහා දේශන අන්තර්ගතය | 52 |
| 07 | පුහුණු වැඩමුළුව සැලසුම් කිරීම | 52 |
| 08 | වැඩමුළුව සැලසුම් කිරීමේදී සහ සංවිධානය කිරීමේදී විශේෂයෙන් සැළකිලිමත් විය යුතු කරුණු කිහිපයක් | 54 |
| 09 | ඡන්දදායක අධ්‍යාපනය පුහුණු කිරීම සඳහා පහසුකම් සපයන්නන්ගේ මාර්ගෝපදේශය | 55 |
| 10 | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 58 |

ඡන්දදායක අධ්‍යාපනය

# 1.

# ජනතා පරමාධිපත්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදය

පුරවැසියාටත් රාජ්‍යයටත් අතර පවතින සම්බන්ධතාව විදහා දක්වන ජනතා පරමාධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදය යන කාලීන හා වැදගත් සංකල්ප දෙකක් පිළිබඳව මේ පරිච්ඡේදයේදී සාකච්ඡා කිරීමට අපේක්ෂිතයි.

## 1.1. රාජ්‍යයක අයිතිකරුවෝ

නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක අයිතිය පවතින්නේ ජනතාව සතුව යැයි පිළිගැනීමක් පවතී. රාජ්‍යයක ඉහළම අයිතිය හෙවත් පරම අයිතිය ජනතාව සතුව පවතින්නේ යැයි යන අදහසින් ජනතා පරමාධිපත්‍යය යන සංකල්පය බිහි වී ඇත. ජනතාවට රාජ්‍යයක අයිතිය පවතින්නේ යැයි සාමාන්‍යයෙන් පැවසුවද, සැබවින්ම රාජ්‍යයක අයිතිය පවතින්නේ පුරවැසියන්ටය. පුරවැසියන් යනුවෙන් හඳුන්වන්නේ රාජ්‍යයක් විසින් තමන්ගේ රාජ්‍යයට අයත් ජනතාව ලෙස පිළිගත් ජනතාව වේ. ඒ අනුව විදේශිකයන් සහ එම රටේ පුරවැසිභාවය හිමි නොවන පුද්ගලයන්ට අදාල රාජ්‍යයේ පරමාධිපත්‍යය අයිතිය පූර්ණ වශයෙන් නොමැත.

## 1.2. පරමාධිපත්‍යය

ඉහත කී ආකාරයේ රාජ්‍යයකට පවතින හිමිකාරත්වය පිළිබඳ සංකල්පය පරමාධිපත්‍යය ලෙස සලකනු ලැබේ. නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් ජනතාවට හිමි බැවින් එයට ජනතා පරමාධිපත්‍යය යැයි කියනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාවේ ජනතාවගේ පරමාධිපත්‍යයේ අර්ථ නිරූපණය අනුව, "ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේය" යනුවෙන් සඳහන් වී ඇත. එයින් පැහැදිලි වන්නේ ජනතාවට පමණක් ආවේණික වූ මෙම පරමාධිපත්‍යය වෙන කිසිම කෙනෙකුට පැවරීමට නොහැකි බවය. මෙය මනාව පැහැදිලි කර ගත හැක්කේ රාජාණ්ඩු පාලනය ලංකාවේ තිබූ කාල පරිච්ඡේදවලදී රාජ්‍යයේ අයිතිය අදාළ රජතුමා සතුව තිබූ හෙයින්, ක්‍රිස්තු වර්ෂ 1505 දී කෝට්ටේ රාජ්‍යයේ රජ කළ දොන් ජුවාන් ධර්මපාල විසින් පෘතුගීසියේ ක්‍රීටයට කෝට්ටේ රාජ්‍යයේ කොටසක් ලියා දීමට හැකියාව ලැබුණේ එම පරමාධිපත්‍යය ඔහු සතුව තිබූ බැවිනි . එසේම 1815 දී උඩරට රාජ්‍යයේ අවසන් රජතුමා වූ ශ්‍රී වික්‍රම රාජසිංහ පරාජයට පත් වූ අවස්ථාවේදී ඔහුගේ බලතල නිලමේවරුන්ගේ අයිතියේ තිබූ හෙයින් එම නිලමේවරුන් සමඟ ගිවිසුමකට එළඹුණු බ්‍රිතාන්‍ය රජයට අපේ රටේ ඉතිරි කොටසද බ්‍රිතාන්‍ය පාලනයට ගිවිසුමෙන් පැවරීමට හැකියාව ලැබුණි. එසේ වුවද දැනට ශ්‍රී ලංකාවේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව, කිසිම අවස්ථාවක මහජනතාව විසින් හැර කිසිම පාලකයෙකු විසින් රාජ්‍යයේ අයිතිය තවත් කෙනෙකුට පැවරීමට හැකියාව නොමැති බව මෙයින් පැහැදිලි වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පරමාධිපත්‍යය පහත සඳහන් කොටස් තුනකින් සමන්විත යි.

i. පාලන බලතල
ii. ඡන්ද බලය
iii. මූලික අයිතිවාසිකම්

පාලන බලතල යනු රාජ්‍යයක් මෙහෙයවීමේ බලයයි. රාජ්‍යයක් පාලනය කිරීමේ අංග 3 ක් ඇත. එනම් විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ වශයෙනි.

ඡන්ද බලය යනු පාලනය සඳහා තමන් කැමති පුද්ගලයන් තෝරා ගැනීමේ බලයයි. (මානව හිමිකම්) මූලික අයිතිවාසිකම් යනුවෙන් සඳහන් කරනු ලබන්නේ, 1948 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ සඳහන් මිනිසෙකු වශයෙන් ජීවත් වීමට කෙනෙකුට ඇති අයිතිය අතරින් කිසියම් රටක මූලික නීතියේ සඳහන් වී ඇති අයිතීන් වේ. ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාවේ සිට 14 වන ව්‍යවස්ථාව දක්වා වූ ව්‍යවස්ථාවලදී ඇතුළත් කර ඇති මූලික අයිතිවාසිකම් සියල්ල හෝ කීපයක් හෝ එක අයිතිවාසිකමක් හෝ පාලන බලතල පාලනය කරන්නන් විසින් උල්ලංඝනය වූ විට එසේ නොමැති නම් උල්ලංඝනය වීමට ආසන්න වූ විට එම අසාධාරණවලට එරෙහි වීමට පුරවැසියන්ට පවත්නා නීතිමය රැකවරණයයි.

මේ අනුව පරමාධිපත්‍යය කොටස් 3කින් යුක්ත වූ බව සඳහන් කළ ද සැබවින්ම එහි අංග 5ක් ඇති බව පැහැදිලිය. එනම් විධායක, ව්‍යවස්ථාදායක, අධිකරණ, ඡන්ද බලය සහ මූලික අයිතිවාසිකම් වේ.

## 1.3. ජනතාවගේ පරම අයිතිය ක්‍රියාත්මක වන ආකාරය

පාලන බලතල - ජනතා පරමාධිපත්‍යයේ ප්‍රධානතම කොටස වන පාලන බලතල සැබවින්ම ජනතාව විසින්ම ක්‍රියාවට නංවන්නේ නැත. පාලන බලතලවල එක් අංගයක් වන ව්‍යවස්ථාදායක බලය එනම් නීති සෑදීමේ බලය ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ජනතාව විසින් තෝරා පත්කර ගන්නා ලද මහජන නියෝජිතයන් මගිනි.

පාලන බලතලවල විධායක බලය ක්‍රියාවට නගනු ලබන්නේ මහජනයා විසින් ඡන්දයකින් තෝරා ගන්නා ලද විධායක ජනාධිපතිවරයා, මහජන නියෝජිතයන් වන අමාත්‍ය මණ්ඩලය හා ජනතාව විසින් වැටුප් ගෙවනු ලබන රාජ්‍ය නිලධාරීන් විසිනි.

පාලන බලතලවල අනෙක් අංගය වන අධිකරණ බලය ක්‍රියාවට නගන්නේ ස්වාධීන අධිකරණ විසිනි. නමුත් පරමාධිපත්‍යයේ අංගයක් වන ඡන්ද බලය පුරවැසියන් විසින් සෘජුවම භාවිත කරමින් ව්‍යවස්ථාදායක සහ විධායකය සඳහා අවශ්‍ය වන ජනතා නියෝජිතයින් පත් කර ගනියි. එසේම මූලික අයිතිවාසිකම් ජනතාව සෘජුවම භුක්ති විඳියි.

# 2.

## ඡන්දය අපේ අනාගතය තීරණය කරයි

ඡන්දය මගින් ජනතා පරමාධිපත්‍යය ක්‍රියාවට නගන ආකාරය විස්තර කිරීම සහ ඡන්දය භාවිත කිරීම සෑම පුරවැසියකුගේම වගකීමක් බව අවධාරණය කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි. එසේම එක් එක් මැතිවරණවලදී මහජන නියෝජිතයාගේ භූමිකාව විස්තර කරයි.

### ඡන්දය සහ රාජ්‍යය -

රාජ්‍යයක පරමාධිපත්‍යය පවතින්නේ ජනතාව තුළ බව අපි ඉහත පරිච්ඡේදයෙන් අවබෝධය කර ගතිමු. එසේම පරමාධිපත්‍යයේ ප්‍රධාන අංගයක් වන පාලන බලතල ක්‍රියාත්මක කරන්නේ සෘජුවම ජනතාව විසින් නොවන බවද අවබෝධ කර ගත්තෙමු. පාලන බලතල ක්‍රියාවට නගන්නේ ජනතාවගේ ඡන්දයෙන් පත් වන නියෝජිතයින් සහ ඔවුන් විසින් පත්කරන රාජ්‍ය නිලධාරී මණ්ඩලයක් විසිනි. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ඡන්දය යනු ජනතාවට පාලන බලතල සඳහා සිය නියෝජිතයින් තෝරා ගැනීමට ලැබෙන අවස්ථාවයි. එසේම එය පාලන බලතල සඳහා ජනතාවගේ බලපෑම් පෙන්වීමට ලැබෙන අවස්ථාවක් ලෙසද සැලකිය හැකිය.

### ඡන්දය සහ ප්‍රජාතන්ත්‍රවාදය

ජනතාව විසින් ජනතාව උදෙසා ජනතා සහභාගීත්වයෙන් පවත්වන පාලනය ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ලෙස හඳුන්වයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකදී ජනතාවගේ අවශ්‍යතා මත පදනම්ව රාජ්‍යයක් පාලනය කිරීම සිදුවේ.

සංසන්දනාත්මකව බහුතර ජනතාවගේ කැමැත්ත අනුව පාලනය කරනු ලබන පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් හඳුන්වනු ලැබුව ද වැඩි දෙනාගේ කැමැත්ත මෙන්ම එම ක්‍රමයට විරුද්ධ වූ සුළු දෙනාගේ අයිතිවාසිකම්වලට හානියක් නොවන ආකාරයට හෝ එම සුළුතර ජනතාවට අගතියක් නොවන අයුරින් එම පාලන තන්ත්‍රය ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව අදහස් දක්වන විද්වතුන්ගේ මතය වේ.

ජනතාවගේ අවශ්‍යතා සහ කැමැත්ත හඳුනා ගැනීම සඳහා භාවිත කරන ප්‍රධානතම මෙවලම වනුයේ මැතිවරණයන්ය. එබැවින් නිසි කලට පවත්වන නිදහස් සහ සාධාරණ මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ප්‍රධාන අංගයක් වේ.

### ශ්‍රී ලංකාවේ මැතිවරණ / ඡන්ද විමසීම්

### ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන මැතිවරණ 4ක් සහ ජනමත විමසුමක් පවතී. එනම්,

- ජනාධිපතිවරණය
- පාර්ලිමේන්තු මැතිවරණය
- පළාත් සභා ඡන්ද විමසීම්
- පළාත් පාලන ඡන්ද විමසීම්
- ජනමත විචාරණය

මෙම සෑම මැතිවරණයක්ම/ ඡන්ද විමසීමක්ම පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද ව්‍යවස්ථාපිත නීතිවල සඳහන් ප්‍රතිපාදනවලට අනුකූලව පවත්වනු ලැබේ.

1. පාර්ලිමේන්තු මැතිවරණය 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතින්ද,
2. ජනාධිපතිවරණය 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතින්ද,
3. පළාත් සභා ඡන්ද විමසීම් 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතින්ද,
4. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා (262 වන අධිකාරය) පනතින්ද,
5. ජනමත විචාරණය 1981 අංක 7 දරන ජනමත විචාරණ පනතින්ද පාලනය වේ.

මේ අතරින් ජනමත විචාරණය හැර අනෙක් සියලුම මැතිවරණ/ඡන්ද විමසීම් පවත්වනු ලබන්නේ මහජන නියෝජිතයින් තෝරාගැනීම සඳහාය. මෙසේ තෝරාගන්නා ලද මහජන නියෝජිතයින්ගෙන් අපේක්ෂා කරනු ලබන භූමිකාව එකින් එකට වෙනස් වේ.

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ භූමිකාව

පාර්ලිමේන්තුවේ කාර්යයන් 3 ක් ඇත. එනම් නීති සම්පාදනය, මූල්‍ය පාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනයයි. එසේම විධායකයේ ප්‍රධාන ආයතනයක් වන අමාත්‍ය මණ්ඩලය සඳහා සාමාජිකයින් පත්වන්නේද පාර්ලිමේන්තුව තුළිනි. එසේම පාර්ලිමේන්තුව යනු ජාතික ආයතනයකි. එබැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත්කරනු ලබන අපේක්ෂකයා නීති සම්පාදනයට, රාජ්‍ය මූල්‍ය පාලනයට සහ ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට හැකියාවක් සහ දැක්මක් ඇති පුද්ගලයකු විය යුතුය. එසේම පාර්ලිමේන්තුව ජාතික ආයතනයක් බැවින් ජාතික අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් සහ සංවේදීතාවක් සහිත පුද්ගලයකු විය යුතුය.

## පළාත් සභා මන්ත්‍රීවරයාගේ භූමිකාව

පළාත් සභාවේ විෂයපථයට ගැනෙන විෂය සම්බන්ධව ප්‍රඥප්ති සම්පාදනය, පළාත් සභාවේ අරමුදල් පාලනය සහ පළාත් තුළ සංවර්ධනය සිදුකිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ජාතික ප්‍රතිපත්ති සහ සැලසුම්වලට අනුකූලව සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම යන්න පළාත් සභාවක කාර්යය වේ. එබැවින් පළාත් සභාවට තෝරාපත් කරනු ලබන අපේක්ෂකයා එම කාර්යයන් පිළිබඳව හැකියාවක් සහ දැක්මක් ඇති අයෙකු විය යුතුය. එසේම ජාතික ආයතන සමඟ තම පළාත් සභාව වෙනුවෙන් නිර්භයව කේවල් කිරීමේ හැකියාවක් ඔහුට/ඇයට තිබිය යුතුය. එවැනි අවස්ථාවන්හිදී තම දේශපාලන පක්ෂයේ වුවද ජාතික දේශපාලනයේ නියුතු අමාත්‍යවරුන් සමඟ සටන් කිරීමට වුවද සූදානමින් සිටිය යුතුය. පළාතේ ජන ජීවිතය, සම්පත් හා ස්වභාවික තත්ව පිළිබඳව හොඳ අවබෝධයක් ඇති අයෙකු විය යුතුය.

## පළාත් පාලන සභිකයාගේ භූමිකාව

පළාත් පාලන ආයතනයක අරමුණ වන්නේ ප්‍රාදේශීය සංවර්ධනයයි. ඒ සඳහා අවශ්‍ය වන අනු නීති සකස් කිරීම, සංවර්ධන සැලසුම් සකස් කිරීම, අයවැය සම්පාදනය, මහජන උපයෝගිතා සේවාවන් පවත්වාගෙන යාම හා මහජන සෞඛ්‍ය ආරක්ෂාව ආදිය පළාත් පාලන ආයතනයක ප්‍රමුඛ කාර්යයන් වේ. එබැවින් පළාත් පාලන ආයතනයක සභිකයකුට අදාල බල ප්‍රදේශය පිළිබඳව හොඳ දැනීමක් මෙන්ම මනා මහජන සබඳතාවක්ද පැවතිය යුතුය. ඔහු ජනතාව සමඟ නිරන්තරයෙන්ම සම්බන්ධ පුද්ගලයකු විය යුතුය.

## මහජන නියෝජිත භූමිකාව නිවැරදිව අවබෝධ කරගැනීමේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ පවතින පාලන මට්ටම් තුනෙහි මහජන නියෝපිතයින්ගේ කාර්යයභාරයන් සහ වගකීම් එකිනෙකට වෙනස් බව ඉහත කී කරුණුවලින් පැහැදිලි වේ. එබැවින් මැතිවරණයකදී අපේක්ෂකයකුට මනාපය ප්‍රකාශ කිරීමේදී අදාළ කාර්යභාරය ඉටුකිරීමට වඩාත් සුදුසු අපේක්ෂකයා තෝරාගත යුතුය. එහිදී හුදෙක් කථිකත්වය, කඩවසම් බව, දේශපාලන ඥාති සබඳතාව, ධනය, වියදම් කිරීමේ හැකියාව, මංගල සහ අවමංගල උත්සවවලට සහභාගී වූ ප්‍රමාණය, ආධාරකරුවන් වෙනුවෙන් පෙනී සිටීම් ආදී කරුණුවලට වඩා අදාල මහජන නියෝජිතයාගෙන් සැබවින්ම අපේක්ෂා කරන භූමිකාවට අදාළ කටයුතු ඉටුකිරීමට ඔහු/ඇය කෙතරම් ශක්තතාවක් දක්වයිද යන්න සිතා බැලීම රටේ අනාගතය සඳහා ඉතා වැදගත්ය.

මේ අනුව ඡන්දය භාවිත කිරීම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක අත්‍යවශ්‍ය අංගයක් මෙන්ම එය ජනතා පරමාධිපත්‍යය මෙන්ම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ද ප්‍රායෝගිකව ක්‍රියාවට නගන මහගු ක්‍රියාවක් බව අවධාරණය කළ යුතුය. එසේම තම ඡන්දය සහ මනාපය ලබාදීමේදී මහජන නියෝජිතයාගෙන් අපේක්ෂා කරන භූමිකාව නිවැරදිව අවබෝධ කරගෙන ඒ සඳහා සුදුසු අපේක්ෂකයකු පත් කර යැවීම ඡන්ද දායක වගකීමක්ද වේ.

# 3.

# මැතිවරණ යාන්ත්‍රණය

මැතිවරණය පැවැත්වීමට අදාළ පාලන යාන්ත්‍රණය සහ මැතිවරණයකදී ඡන්දය ලබාදීමට අවශ්‍ය වන ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් විස්තර කෙරෙන අතර, මැතිවරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පසුකාලීනව හඳුන්වා දෙන ලද නීති සංශෝධන පිළිබඳවද සාකච්ඡා කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ මැතිවරණ/ ඡන්ද විමසීම් කාල සටහන් ක්‍රමයක් නොමැති අතර, මැතිවරණ/ ඡන්ද විමසීම් පැවැත්වීමේ දිනය සහ වෙනත් ව්‍යවස්ථාපිත කාර්යයන් සිදුකිරීමේ දින වකවානු තීරණය කිරීමේ ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ඒ ඒ මැතිවරණ/ ඡන්ද විමසීම් පනත්වල සඳහන් වේ. කෙසේ වෙතත් මැතිවරණයකදී/ ඡන්ද විමසීමකදී ඡන්දය ලබාදීම සඳහා අවසන් හා තීරණාත්මක සාක්ෂිය වශයෙන් සලකනු ලබන ඡන්ද හිමි නාමලේඛන සකස් කිරීමේ ක්‍රියාවලිය වාර්ෂිකව අඛණ්ඩව සිදුකිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි. එම ක්‍රියාවලියේ මූලික අංග පහත පරිදි විස්තර කළ හැකිය.

## 3.1 ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය

### 3.1.1 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත හා නව සංගණන ක්‍රමය

1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව, ඡන්ද හිමි නාම ලේඛන සකස් කිරීමේ කටයුතු වාර්ෂිකව සිදු කරනු ලබයි. 2022 දක්වා සකස් කරන ලද ඡන්දහිමි නාම ලේඛනවලට සෑම වර්ෂයකම ජුනි මස පළවෙනිදාට සිය සුදුසුකම් ලැබීමේ ලිපිනයෙහි සාමාන්‍ය වශයෙන් පදිංචි වී සිටින අවුරුදු දහ අටට ඉහළ සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන් ඡන්ද හිමියන් වශයෙන් ඇතුලත් කරන ලදී. එසේ වුවද, 2021 ඔක්තෝබර් මස 13 වැනි දින සහතික කරන ලද 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීමත් සමඟ, 2022 වර්ෂයේ සිට සෑම පෙබරවාරි මස පළවෙනිදා, අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි.

මෙම සංශෝධන පනත මගින් වයස දහඅට (18) සම්පූර්ණ කරනු ලබන තරුණ තරුණියන් වන අභිනව ඡන්ද හිමියන්ට අදාල වයස සම්පූර්ණ වූ විගස ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීමේ මහඟු අවස්ථාව මුල්වරට ලැබී තිබේ. කලින් තිබූ නීතිය අනුව, එසේ වයස අවුරුදු දහ අට සම්පූර්ණ කරන සෑම ඡන්ද හිමියෙකුටම අවුරුද්දකට ආසන්න කාලයක් ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුළත් කිරීම සඳහාත් සහ අවුරුද්දකට වැඩි කාලයක් ඡන්දය පාවිච්චි කිරීම සඳහාත් දැඩි අපේක්ෂාවෙන් බලා සිටීමට සිදුවූ අතර, මෙම සංශෝධන පනත හඳුන්වා දීමෙන් අනතුරුව සෑම මාස හතරකට වරක් දහඅට සම්පූර්ණ වන අභිනව ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදුකර, දැනටමත් වලංගුව පවත්නා නාම ලේඛනයට එම අභිනව ඡන්ද හිමියන්ගේ නාම ලේඛනය පරිපූරක නාම ලේඛනයක් වශයෙන් අමුණනු ලබන බැවින්, එම කාලසීමාව තුළ මැතිවරණයක් / ඡන්ද විමසීමක් පවත්වන සෑම මොහොතම ඔවුන්ට ද ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව ලැබේ. ඒ සඳහා සෑම වර්ෂයකම මාස හතරෙන් හතරට වයස දහඅට සම්පූර්ණ කරන අයගේ පරිපූරක ලැයිස්තු තුනක් සකස් කරනු ලැබේ. යම් වර්ෂයක පෙබරවාරි මස පළවෙනි දින සිට එම වර්ෂයේ මැයි මස තිස් එක් වන දිනෙන් අවසන් වන කාල සීමාව ඇතුළත දහ අට වෙනි වයස සම්පූර්ණ කරන අයද, ජුනි මස පළවෙනි දින සිට එම වර්ෂයේ සැප්තැම්බර් මස තිස් වන

දින දක්වා කාලය තුළ  දහ අටවෙනි වයස සම්පූර්ණ කරන අයද, ඔක්තෝබර් මස පළමුවන දිනෙන් ආරම්භ වී ඊළඟ වර්ෂයේ ජනවාරි මස 31 වෙනි දින දක්වා කාලය තුළ දහ අටවන වයස සම්පූර්ණ කරන අයද ඇතුලත් කරන ලද, නාමලේඛන තුනක් වෙන් වෙන්ව  සකස්කර සහතික කරනු ලබන අතර, එම නාමලේඛන පරිපූරක ලැයිස්තු වශයෙන්, දැනටමත් වලංගුව පවතින ප්‍රවර්තන නාම ලේඛනයට අමුණනු ලැබේ. පසුගිය 2023 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී මෙම ඡන්ද හිමියන්ගේ නම් ඇතුළත් ඒකාබද්ධ නාමලේඛන භාවිතා කිරීමට නියමිතව තිබුණද, මහා භාණ්ඩාගාරය විසින් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන නිකුත් නොකිරීම හේතුවෙන් ඡන්ද විමසීම කල්තැබීම නිසා ප්‍රථම වතාවට මෙම අභිනව ඡන්ද හිමියන්ට ඡන්දය භාවිතා කිරීමට තිබූ අවස්ථාව අහිමිවුණා. එසේ වුවද, නැවතත් ලබන 2024 සැප්තැම්බර් 21 වැනිදා පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයට අදාළ 2024 වර්ෂය සඳහා වූ නාමලේඛනය 2024 ජූලි මස පළවෙනි දින  සහතික කර ඇති අතර, එම නාමලේඛනයට 2024 පෙබරවාරි පළවෙනිදා සිට මැයි මස තිස් එක් වැනි දින දක්වා කාලය තුළ වයස අවුරුදු දහඅට සම්පූර්ණ කරන ලද අභිනව ඡන්ද හිමියන්ද ප්‍රථම වතාවට ඡන්දය පාවිච්චි කිරීමට නියමිතයි. සිය කඩඉම් වයස සම්පූර්ණ කර උපරිම වශයෙන් මාස හතක් හා අවම වශයෙන් මාස තුනක් ඇතුළත ප්‍රථම වතාවට සිය ඡන්දය පාවිච්චි කිරීමට අභිනව තරුණ තරුණියන්ට අවස්ථාව ලැබීම ඓතිහාසික සිද්ධියකි.

2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීමත් සමඟ ඡන්ද හිමියන්  සංගණනය කිරීමේ ක්‍රමවේදයේ ද වෙනස්කම් ඇතිවී තිබෙනවා. BC ආකෘතිය නමින් ආකෘතියක් ලබා දී තොරතුරු රැස් කරගන්නා ලද ක්‍රමය වෙනුවට, ප්‍රවර්තන නාම ලේඛනයේ නම් සඳහන් පවුලේ සාමාජික සාමාජිකාවන්ගේ විස්තර ඇතුළත් පත්‍රිකාවක් සෑම ගෘහයක් වෙතම ලබා දී, තවදුරටත් එම ඡන්ද හිමියන් එම ගෘහයටම ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලබා ඇත්නම් ඒ බව ගෘහ මූලිකයා හෝ ගෘහයේ සිටින වෙනත් වැඩිහිටි තැනැත්තෙකු ලවා සංගණන නිලධාරීන් වන ග්‍රාම නිළධාරීන් විසින් අත්සන් ලබා ගනු ලබන අතර, අලුතින් අවුරුදු දහඅට සම්පූර්ණ කිරීමට නියමිත දරු දැරියන් සිටින්නේ නම්, ඒ පිළිබඳව තහවුරු කර ගැනීමෙන් අනතුරුව අදාළ ලේඛනවලට එම නම් ඇතුළත් කිරීමද සිදුවෙනවා. එසේම ආවාහ විවාහ කටයුතු නිසා හෝ පදිංචිය වෙනස් වීම හේතු කොටගෙන අලුතින් පැමිණෙන සාමාන්‍ය පදිංචිකරුවන් සම්බන්ධයෙන්ද ඒ අවස්ථාවේදීම විස්තර ලබා ගනු ලබන අතර,  දැනටමත් ප්‍රවර්තන නාමලේඛනයේ නම් ඇතුළත් වී ඇතත් සංශෝධනය වීමට නියමිත නාම ලේඛනයට ඇතුළත් කිරීමට නොහැකි වන මියගිය, පදිංචිය හැරගිය හෝ නීතියෙන් ඡන්ද හිමියෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා තිබෙන සුදුසුකම් අහිමි වී ඇති තැනැත්තන්ගේ නම් ඉවත් කිරීමේ නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහාද ග්‍රාම නිලධාරීන් කටයුතු කරනු ලැබේ.

## 3.2 මැතිවරණ / ඡන්ද විමසීම් බල ප්‍රදේශ

ජනාධිපතිවරණයකදී සහ ජනමත විචාරණයකදී මුළු දිවයිනම මැතිවරණ බල ප්‍රදේශය වශයෙන් සලකනු ලබයි. පාර්ලිමේන්තු මැතිවරණයකදී මැතිවරණ කොට්ඨාස 22 මැතිවරණ බල ප්‍රදේශ වශයෙන් ද, පළාත් සභා ඡන්ද විමසීමේදී පරිපාලන දිස්ත්‍රික් 25 ඡන්ද විමසීම් බල ප්‍රදේශ වශයෙන්ද සහ පළාත් පාලන ඡන්ද විමසීමේදී පළාත් පාලන ආයතන 341 (මහනගර සභා 24, නගර සභා 46 සහ ප්‍රාදේශීය සභා 271) ඡන්ද විමසීම් බල ප්‍රදේශ වශයෙන් ද සලකනු ලැබේ.

ඊට අමතරව 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව, මැතිවරණ/ ඡන්ද විමසීම් සඳහා සකස් කරනු ලබන ඡන්ද හිමි නාම ලේඛන  අනුව, මුළු දිවයිනම ඡන්ද ප්‍රදේශ (Polling Divisions) 160 වශයෙන් බෙදා වෙන්කර ඇති අතර, ඡන්ද හිමි නාම ලේඛන වෙළුම් සකස් කිරීම හා සෑම මැතිවරණයකදීම/ ඡන්ද විමසීමකදීම ප්‍රතිඵල නිකුත් කිරීම මෙම ඡන්ද ප්‍රදේශ පදනම්

කරමින් සිදු කරනු ලැබේ. තවද ඉහත සඳහන් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව, සෑම ඡන්ද මධ්‍යස්ථානයටම අයත් ඡන්ද හිමියන් පදිංචි වී සිටින බල ප්‍රදේශ වන ඡන්ද කොට්ඨාස (Polling Districts) 12,750 පමණ ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇත. මැතිවරණයට සම්බන්ධ ඉතාමත් කුඩාම ඒකක ඡන්ද කොට්ඨාස වේ. මීට අමතරව පළාත් පාලන ඡන්ද විමසීමකදී සෑම පළාත් පාලන ආයතනයම 'කොට්ඨාස' (Ward) වශයෙන් බෙදා වෙන්කර ඇති අතර, සෑම කොට්ඨාසය සඳහාම සභිකයෙක් හෝ බහු සභික කොට්ඨාසයක් නම් එක් කෙනෙකුට වැඩි සභිකයන් හෝ පත් කරනු ලැබේ. එම සෑම කොට්ඨාසයක්ම ඡන්ද කොට්ඨාස එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සමන්විතයි. ශ්‍රී ලංකාව තුළ 2018 දී පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී කොට්ඨාස 4910 ක් පළාත් පාලන 341 හි පිහිටා තිබුණි.

## 3.3 මැතිවරණ / ඡන්ද විමසීම් ප්‍රකාශයට පත් කිරීමේ බලය, නාමයෝජනා හා ඡන්ද විමසීම් දින නියම කිරීම

මැතිවරණයක්/ ඡන්ද විමසීමක් පැවැත්වීමේ බලය පවතින්නේ මැතිවරණ කොමිෂන් සභාවටය. පාර්ලිමේන්තු මැතිවරණය හැර ජනාධිපතිවරණය, ජනමත විචාරණය, පළාත් සභා ඡන්ද විමසීම් සහ පළාත් පාලන ඡන්ද විමසීම් සියල්ල ප්‍රකාශයට පත් කිරීමේ බලය ඇත්තේ මැතිවරණ කොමිෂන් සභාවටය. පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් වූ ප්‍රකාශය පමණක් ජනාධිපතිවරයා විසින් නිකුත් කරනු ලබන අතර, එම ප්‍රකාශයේ පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන දිනය, එම දිනයේ සිට දින 10 යෙන් ආරම්භ වී 17 වන දින මධ්‍යහ්න 12.00ට අවසන් වන නාමයෝජනා කාල සීමාව, නාමයෝජනා කාල සීමාවේ අවසන් දින සිට සති 5 සති 7 ඇතුළත එන මැතිවරණය පවත්වනු ලබන දිනය හා අභිනව පාර්ලිමේන්තුවේ ප්‍රාරම්භක රැස්වීම් දිනය ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. ජනාධිපතිවරණයක් නම් නාමයෝජනා කැඳවීම හා ඡන්ද විමසීම පවත්වනු ලබන දිනය නියම කිරීමේ දැන්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන අතර, එම දැන්වීම නිකුත් කරනු ලබන දිනයේ සිට දින 16 හා දින 21 අතර වූ කාලය තුළ එක් දිනයක් නාමයෝජනා දිනය වශයෙන් නම් කරනු ලැබේ. එම නාමයෝජනා භාර ගැනීමේ දිනයේදී පෙරවරු 9.00 සිට පෙරවරු 11.00 දක්වා පැය දෙකක් නාමයෝජනා කාලසීමාව වශයෙන් නම් කරනු ලැබේ. එම නාමයෝජනා දිනයේ සිට සති 4 ට නොඅඩු සහ සති 6 ට නොවැඩි කාලය අතරතුර දිනයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරණ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ. පළාත් සභා ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ විට, මැතිවරණ කොමිෂන් සභාව විසින් පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට ඇති බවට වූ දැන්වීම/දැන්වීම් නිකුත් කරනු ලබන අතර, මෙම දැන්වීම නිකුත් කරනු ලබන දිනයේ සිට දින 14න් ආරම්භ වන නාමයෝජනා කාලසීමාව 21 වන දින මධ්‍යහ්න 12.00ට අවසන් වේ. එම නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයේ සිට සති 5 සහ සති 8 ඇතුළත එන ඡන්ද විමසීම් දිනයද, මැතිවරණ කොමිෂන් සභාව විසින්ම ප්‍රකාශයට පත් කරනු ලැබේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි තේරීම්භාර නිලධාරීන් විසින් නිකුත් කරනු ලබන නාමයෝජනා දැන්වීම නිකුත් කිරීමේ දිනයේ සිට 10 වන දිනයෙන් ආරම්භ වන නාමයෝජනා කාලසීමාව, 13 වන දිනය මධ්‍යහ්න 12.00ට අවසන් වේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් දිනය පාර්ලිමේන්තු මැතිවරණය මෙන්ම නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයේ සිට සති 5 ට නො අඩු සහ සති 7ට නොවැඩි කාල සීමාව තුළ එන දිනයක් විය යුතුය.

නාමයෝජනා කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයෙකු සඳහා ජනාධිපතිවරණයේ දී රුපියල් 50,000/= බැගින්ද, වෙනත් අපේක්ෂකයෙකු සඳහා රුපියල් 75,000/= බැගින්ද ඇප තැන්පත් කළ යුතු අතර, පාර්ලිමේන්තුවේ මැතිවරණයේදී සහ පළාත් සභාවේ ඡන්ද විමසීමේදී එක් ස්වාධීන අපේක්ෂකයෙකු සඳහා පමණක් රුපියල් 2,000/= බැගින්ද, පළාත් පාලන ආයතන ඡන්ද

විමසීමේදී පිළිගත් දේශපාලන පක්ෂ අපේක්ෂකයෙකු සඳහා රුපියල් 1,500/= බැගින්ද, ස්වාධීන අපේක්ෂකයෙකු සඳහා රුපියල් 5,000/= බැගින්ද ඇප තැන්පත් කළ යුතුය. පාර්ලිමේන්තු මැතිවරණයේදී පමණක් නාමයෝජනා පත්‍රය භාරදීමට පෙර ඇප තැන්පත් කළ හැකි අතර, ජනාධිපතිවරණය, පළාත් සභා ඡන්ද විමසීම් හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදී නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයට පෙර දින මධ්‍යාහ්න 12.00 ට පෙර ඇප තැන්පත් කිරීම අනිවාර්ය වේ. එබැවින් පාර්ලිමේන්තු මැතිවරණයේදී පමණක් අවසන් දිනයේදී ද නාමයෝජනා පත්‍රය භාරදීමට පෙර ඇප තැන්පත් කළ හැකිය.

ජනාධිපතිවරණයකදී මුළු දිවයිනේම 12.5% ඡන්ද ප්‍රතිශතයක් ලබා නොගත් විට, පාර්ලිමේන්තු මැතිවරණයේදී මැතිවරණ කොට්ඨාසයේ 12.5% ඡන්ද ප්‍රතිශතයක් ස්වාධීන කණ්ඩායමක් විසින් ලබා නොගත්විට හා පළාත් සභා ඡන්ද විමසීමකදී කිසියම් ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් එක් මන්ත්‍රීවරයෙක් හෝ ස්වාධීන කණ්ඩායමකින් තේරී පත් නොවූ විට හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමකදී කොට්ඨාස අපේක්ෂකයෙක් එම කොට්ඨාසය ජයග්‍රහණය කර 5% ඡන්ද ප්‍රතිශතයක් ලබා නොගත් විට අපේක්ෂකයන්ගේ ඇප තැන්පත් රාජසන්තක වේ. තවද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා දෙවන නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අමතර අපේක්ෂකයන්ගේ ඇප තැන්පත් රාජසන්තක කරනු ලබන්නේ එම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් 5% ප්‍රතිශතයක් එම පළාත් පාලන ආයතනය තුළ ලබා ගැනීමට අපොහොසත් වූ විටදීය.

ඉදිරිපත් කරනු ලබන නාමයෝජනා සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කිරීමේ කාලසීමාවක් ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණයේදී නෛතික ප්‍රතිපාදනවලින් වෙන් කර ඇත. පාර්ලිමේන්තු මැතිවරණයේදී නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයේ මධ්‍යාහ්න 12.00 සිට පස්වරු 01.30 දක්වා විරෝධතා ඉදිරිපත් කළ හැකි අතර, ජනාධිපතිවරණයේදී එම කාලසීමාව වන්නේ පෙරවරු 9.00 සිට පෙරවරු 11.30 දක්වා වේ. පළාත් සභා හා පළාත් පාලන ඡන්ද විමසීම් පනත්වල නාමයෝජනා සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කිරීමට නෛතික ප්‍රතිපාදන නොමැති අතර, යම්කිසි කෙනෙකු විසින් විරෝධතාවක් ඉදිරිපත් කරන ලද්දේ නම් අනාගත අධිකරණ කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි එම විරෝධතා සුරක්ෂිතව ගොනු කරනු ලැබේ.


### 3.3.1. නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීම

සෑම මැතිවරණයකදීම/ඡන්ද විමසීමකදීම එම පනත්වල විධිවිධානවල සඳහන් අවශ්‍යතා සපුරා නොමැති නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එවිට සියලුම අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී පමණක් අවස්ථා තුනකදී අදාල අපේක්ෂකයන් පමණක් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, සෙසු අපේක්ෂකයන්ට තරග කිරීමේ අවස්ථාව හිමිවේ. එකී අවස්ථා තුන වන්නේ යම්කිසි අපේක්ෂකයෙකු සිය කැමැත්ත ප්‍රකාශය කරනු ලබන අත්සන නාමයෝජනා පත්‍රයේ සටහන් කරනු නොමැති අවස්ථාවක හා සෑම අපේක්ෂකයෙකු විසින්ම විධිමත්ව සම්පූර්ණ කර භාරදිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හයවන සංශෝධනයෙන් හඳුන්වා දෙන ලද හත්වන උපලේඛනයේ සඳහන් දිවුරුම් ප්‍රකාශය භාරදී නොමැති හෝ භාරදෙන ලද දිවුරුම් ප්‍රකාශය විධිමත්ව සහතික කර නොමැතිවිට සහ අපේක්ෂකයා තරුණයකු වන අවස්ථාවක උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් හෝ උප්පැන්න සහතිකය ලබා ගැනීමට නොහැකිවිට එකී තරුණයා විසින් තම උපන්දිනය සහතික කරමින් අත්සන් කළ දිවුරුම් ප්‍රකාශයක් හෝ එකී නාමයෝජනා පත්‍රයට ඇමිණීම පැහැර හරින අපේක්ෂකයා පමණක් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සෙසු අපේක්ෂකයන් සියල්ලන්ටම තරග කිරීමේ අවස්ථාව ලැබේ. පාර්ලිමේන්තු මැතිවරණ හා පළාත් සභා ඡන්ද විමසීම් වලදී එක් අපේක්ෂකයෙක් හෝ නුසුදුසුභාවයට පත්වන විට මුළු නාමයෝජනා පත්‍රයම ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ද ඉහත සඳහන් අවස්ථා තුන හැර අනිකුත් කරුණු හේතු

කොටගෙන යම්කිසි නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලබන විට නාමයෝජනා පත්‍ර දෙකේදීම නම් සඳහන් අපේක්ෂකයන් සියලු දෙනාම ප්‍රතික්ෂේප වේ.

## 3.4 තැපැල් ඡන්ද පහසුකම් සැලසීම

මැතිවරණ/ඡන්ද විමසීම්වලදී විවිධ රාජකාරිවල නිරත වීම හේතුවෙන් ඡන්ද විමසීම් දිනයේදී ඡන්ද පොළට සෘජුව ගොස් සිය ඡන්දය සලකුණු කිරීමට අවස්ථාව නොලැබෙන රාජ්‍ය සේවකයන්, ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හා පොලිසියේ නිලධාරීන් වැනි මැතිවරණ/ඡන්ද විමසීම් අණ පනත්වල සඳහන් අයට පමණක් තැපැල් ඡන්ද සඳහා අයදුම් කිරීමේ හැකියාව ඇත. පාර්ලිමේන්තු මැතිවරණයේදී සහ ජනාධිපතිවරණයේදී පමණක් සෙසු නිලධාරීන් සමඟ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ සේවකයන්ටද තැපැල් ඡන්ද හිමිකම් ඇත. පළාත් සභා ඡන්ද විමසීම හැර අනිකුත් සෑම මැතිවරණයකම/ඡන්ද විමසීමකම නාමයෝජනා කැඳවීමේ දැන්වීම පළ කර දින සිට දින 10ක් ඇතුළත තැපැල් ඡන්ද සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. පළාත් සභා ඡන්ද විමසීමේදී පමණක් එම කාලසීමාව වන්නේ නාමයෝජනා කැඳවීමේ දැන්වීම පළ කරන ලද දින සිට 7 වන දිනයේ සිට 14 වන දිනය දක්වා කාලය වේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී පමණක් ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන ඡන්දපොලේ දීම තැපැල් ඡන්ද පත්‍රිකාද ගණන් කරනු ලබන අතර, සෙසු මැතිවරණ හා ඡන්ද විමසීම්වලදී තැපැල් ඡන්ද පත්‍රිකා ඒ සඳහා වූ වෙනම ගණන් කිරීමේ මධ්‍යස්ථානවලදී ගණන් කරනු ලැබේ.


ජනාධිපතිවරණය - 2019
சனாதிபதித் தேர்தல் - 2019

රා සේවය පිණිසයි அரச பணி

මැතිවරණ කොට්ඨාසය / தேர்தல் மாவட்டம்
1 කොළඹ
கொழும்பு

ජා. හැ. අංකය / தே.அ.அ இலக்கம் 866231176V
ඔබේ අනු අංකය / உமது தொடர் இல 1317
ස්.කො. / வா.மா. 8

වේලාව / நேரம்
පෙ.ව. 7.00 - ප.ව. 4.00
மு.ப. 7.00 – பி.ப. 4.00

ම මොරටුව
ம மொறட்டுவ

දිනය / திகதி
2019.11.16

නම / பெயர்
තමාලා සජානි ඉශංකා විජේසිංහ
தமாலா சஜானி இஷங்கா விஜேசிங்ஹ

ලිපිනය / முகவரி
15
අභය මාවත
රත්මලාන
அபய மாவத்தை
இரத்மலானை
10390

ඡන්ද පොළ
வாக்கெடுப்பு நிலையம்
සිරි විවේකාරාම විහාරස්ථාන ධර්මශාලාව, බොරුපන, රත්මලාන
சிறி விவேகாராம விகாரை போதனா மண்டபம், பொறுபன, இரத்மலான

නිල ඡන්ද දැන්වීම් පත / உத்தியோகபூர்வ வாக்காளர் அட்டை

1. ඡන්ද පොළට මෙය රැගෙන යෑම ඔබට ද අප කාර්ය ම... ට ද පහසුවකි.
வாக்கெடுப்பு நிலையத்திற்கு இதை எடுத்துச் செல்வது உங்களுக்கும், எமது அலுவலர் குழாத்திற்கும் வசதியாகவிருக்கும்.
2. ඔබ සතුව තබාගත යුත්තේ ඔබටම ලිපිනය කරන ලද නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව පමණි.
நீங்கள் வைத்திருக்க வேண்டியது, உங்களுக்கே முகவரியிடப்பட்ட உத்தியோகபூர்வ வாக்காளர் அட்டையை மாத்திரமே.
3. නිල ඡන්ද දැන්වීම් පතක් බලය නොමැතිව කවරෙකුට හෝ සැපයීම වරදකි.
உத்தியோகபூர்வ வாக்காளர் அட்டையொன்றை அதிகாரமின்றி வேறு எவருக்கேனும் வழங்குவது குற்றமாகும்.
4. හිමි නැති නිල ඡන්ද දැන්වීම් පතක් තමා සන්තකයේ තබා ගැනීම ද වරදකි.
உரித்தற்ற உத்தியோகபூர்வ வாக்காளர் அட்டையொன்றை தம்வசம் வைத்திருப்பதும் குற்றமாகும்.
5. පසුපිටේ සඳහන් කරුණු පිළිබඳව යම් ගැටළුවක් ඇත්නම් වහාම මැතිවරණ කාර්යාලය විමසන්න
பின்பக்கத்தில் காட்டப்பட்டுள்ள விடயங்கள் தொடர்பாக ஏதேனும் பிரச்சினை காணப்படின் உடனடியாக தேர்தல்கள் அலுவலகத்தை உசாவவும்.

සහකාර / තේරීම්භාර නිලධාරී - උදවි / தெரிவத்தாட்சி அலுவலர்
දිනය / திகதி - 2020.04.25 / දු.ක. தொ.இல. TEL - 011-2369437
If there are any difficulties in understanding the particulars above please contact Elections Office on 011-2369437

ඡන්දය දීම සඳහා ඡන්ද පොළේදී පහත සඳහන් අනන්‍යතා ලේඛන වලින් එකක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. වෙ... කිසිදු ආකාරයක ඡායාරූප සහිත හෝ රහිත හැඳුනුම්පත් / ලේඛන හෝ කුවිතාන්සි ... ගු නොවේ.
வாக்களிப்பதற்காக வாக்கெடுப்பு நிலையத்தில் கீழ்க்காணும் ஆளடையாள ஆவணங்களில் ஒன்றைச் சமர்ப்பித்தல் கட்டாயமாகும். வேறு எத்தகைய விதத்திலான புகைப்படத்துடன் கூடிய அல்லது இல்லாத ஆளடையாள அட்டையொன்றோ / ஆவணமொன்றோ அல்லது பற்றுச் சீட்டொன்றோ செல்லுபடியாகாது.
1. ජාතික හැඳුනුම්පත / தேசிய அடையாள அட்டை.
2 වලංගු විදේශ ගමන් බලපත්‍රය / செல்லுபடியான கடவுச் சீட்டு.
3 වලංගු රියදුරු බලපත්‍රය / செல்லுபடியான சாரதி அனுமதிப்பத்திரம்.
4 රාජ්‍යසේවා විශ්‍රාමික හැඳුනුම්පත / அரச சேவை ஓய்வூதிய அட்டை.
5 වැඩිහිටි හැඳුනුම්පත (ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන) / முதியோர் அடையாள அட்டை (பிரதேச செயலாளரினால் விநியோகிக்கப்பட்ட).
6 පූජ්‍ය/පූජක හැඳුනුම්පත (පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කරනු ලබන) / மதகுருமார்களுக்கான அடையாள அட்டை (ஆட்களைப் பதிவு செய்யும் திணைக்களத்தினால் விநியோகிக்கப்பட்ட).
7 තාවකාලික හැඳුනුම්පත (මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරනු ලබන) தற்காலிக அடையாள அட்டை (தேர்தல் ஆணைக்குழுவினால் விநியோகிக்கப்பட்ட)
ඔබ ළඟ හැඳුනුම්පතක් ඇතත් / உங்கள் வசம் அடையாள அட்டையொன்று இருப்பினும்,
I.ඡායාරූපයෙන් පුද්ගලයා හඳුනාගත නොහැකිනම්
I. புகைப்படத்தின் மூலம் ஆளை அடையாளம் காண முடியாதாயின்,
II. නම කියවිය නොහැකි ලෙස මැකී ඇත්නම් ඒවාද වලංගු නොවන බැවින් වහාම තාවකාලික හැඳුනුම්පතක් ග්‍රාම නිලධාරී විමසා ලබා ගන්න.
II. பெயர் வாசிக்க முடியாதவாறு அழிந்திருப்பின் அதுவும் செல்லுபடியற்றதாகையால் உடனடியாக தற்காலிக அடையாள அட்டையொன்றை கிராம அலுவலரைத் தொடர்பு கொண்டு பெற்றுக்கொள்ளவும்.

## 3.5 නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා සහ ද්විත්ව ඡන්ද පත්‍රිකා

ඡන්ද හිමි නාම ලේඛනයේ නම සඳහන් සෑම ඡන්ද හිමියකුටම ඡන්දය භාවිතා කළ යුතු දිනයද, ඡන්ද විමසීම පවත්වනු ලබන වේලාවද, අදාළ ඡන්ද මධ්‍යස්ථානයද, ඡන්ද හිමියාගේ නම සහ අනුක්‍රමික අංකයද සඳහන් කරමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද විමසීමේ දිනයට අවම වශයෙන් දින හතකටවත් පෙර ලැබෙන පරිදි, සාමාන්‍ය තැපෑලෙන් නිල දැන්වීමක් යැවිය යුතුය. එම නිල දැන්වීම මැතිවරණ/ඡන්ද විමසීම් පනත් අනුව හඳුන්වනු ලබන්නේ **'නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා'** යනුවෙනි. ඡන්ද විමසීමේ දිනයට දින හතක් තිබියදී ද එම පත්‍රිකා ඡන්ද හිමියන්ගේ නිවාස වලට බෙදා අවසන් කිරීමට නොහැකි වන විට (උදාහරණයට තැපැල් කාර්යාලයෙන් ඡන්ද හිමියාගේ නිවසට එකවරක් හෝ දෙවරක් පැමිණියද එම ගෘහයේ මෙම පත්‍රිකා අත්සන් කර භාර ගැනීමට කිසි කෙනෙකු නොමැති අවස්ථාව වැනි) එම නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා තැපැල් කාර්යාලයේ දී රඳවා තබාගනු ලබන අතර, අදාල ඡන්ද හිමියන්ට එම කාර්යාලයට ගොස් සිය අනන්‍යතාව තහවුරු කර ලබා ගැනීමේ හැකියාව තිබේ. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ඡන්දය භාවිතා කරන අවස්ථාවේදී රැගෙන යෑම අනිවාර්ය නොවේ. එසේ වුවද ඡන්ද මධ්‍යස්ථානයේ රාජකාරියේ නිරතවී සිටින නිලධාරීන්ට ඡන්ද හිමි නාම ලේඛනයෙන් ඡන්ද හිමියන්ගේ නම් පහසුවෙන් සොයාගැනීමට එම පත්‍රිකා උපකාරී වනු ඇත. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ලැබෙන්නේ අදාළ ඡන්දහිමි නාමලේඛනයේ නම් ලියාපදිංචි කර ඇති තැනැත්තන්ට පමණි.

ඡන්ද මධ්‍යස්ථානයක සිය ඡන්දය භාවිතා කිරීම සඳහා පැමිණෙන ඡන්දදායකයෙකුගේ ඡන්දය කලින් කවුරු විසින් හෝ භාවිත කර ඇති බව ඡන්ද මධ්‍යස්ථානයේදී පාවිච්චි කරනු ලබන ඡන්ද හිමි නාමලේඛනය නිරීක්ෂණය කිරීමේදී අනාවරණය වූ විට, එම ඡන්දදායකයා සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට භාරදී ඇති ද්විත්ව ඡන්ද පත්‍රිකාව යනුවෙන් හඳුන්වනු ලබන නිල් පාට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලබන අතර, එම ඡන්ද පත්‍රිකාවේ පසු පිට ඡන්දදායකයාගේ නම ද සටහන් කරනු ලැබේ. මෙම ඡන්ද පත්‍රිකා අදාළ ඡන්දදායකයා විසින් සලකුණු කිරීමෙන් අනතුරුව, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හැර සෙසු මැතිවරණ හා ඡන්ද විමසීම්වලදී අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ භාවිතා කරනු ලබන ඡන්ද පෙට්ටිය තුළට බහාලීමට අවස්ථාව සලසා දිය යුතුය. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී පමණක් එම ඡන්ද පත්‍රිකා දැමීම සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට මැතිවරණ කාර්යාලයෙන් ලබාදී ඇති කවරය තුළට බහාලිය යුතුය. පළාත් පාලනය ඡන්ද විමසීම හැර සෙසු මැතිවරණ හා ඡන්ද විමසීම් වලදී ගණන් කිරීමේ අවස්ථාවේදී ඡන්ද පෙට්ටියේ තිබෙන ඡන්ද පත්‍රිකා ගණන් කිරීමෙන් ඉවත් කරනු ලබන අතර, එම පත්‍රිකා වෙනම කවරයකට දමා ගණන් කිරීම අවසානයේදී භාරදෙනු ලබන මුද්‍රා තබන ලද මලු සමඟ මැතිවරණ ගබඩා වෙත භාරදෙනු ලැබේ.

## 3.6 නියෝජිත වර්ග

මැතිවරණයකදී ඡන්ද විමසීමකදී එක් එක් අවස්ථාවන්හි ඉටුකරනු ලබන ව්‍යවස්ථාපිත රාජකාරි නිරීක්ෂණය කිරීම සඳහා නියෝජිතයන් පත් කිරීමට තරග කරන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයන්ට අවස්ථාව සලසනු ලැබේ. ඒ සඳහා ඒ ඒ රාජකාරියේ ස්වභාවය අනුව පත් කළ හැකි නියෝජිත සංඛ්‍යාව වෙනස් වෙන අතර, ඒ ඒ අවස්ථා අනුව, නියෝජිතයන්ගේ නාමය ද වෙනස් වේ. එම නියෝජිතයන් පත් කිරීම සඳහා ඇති බලය දී ඇති නියෝජිතයන් පවා මැතිවරණ/ඡන්ද වීමසීම අනුව වෙනස් වෙයි.

ජනාධිපතිවරණයකදී ජනාධිපති ධූර අපේක්ෂකයෙකුට මුළු දිවයිනටම අදාළ වන පරිදි නාමයෝජනා කිරීමේ දින හෝ ඊට පෙර තමා වෙනුවෙන් පෙනී සිටීම සඳහා ඡන්ද නියෝජිතයකු ලියවිල්ලකින් පත් කිරීමේ බලතල ඇත්තේය. එවැනි ඡන්ද නියෝජිතයකු පත් කර නොමැති අවස්ථාවක එම නියෝජිතයා විසින් ඉටු කළ යුතු සියලු කාර්යයන් ජනාධිපති ධූර අපේක්ෂකයා විසින්ම ඉටු කළ යුතුය. සෑම අපේක්ෂකයාම එක් ඡන්ද නියෝජිතයකු පමණක් පත් කළ යුතු වුවද, එසේ පත් කරන ලද නියෝජිතයා

අපේක්ෂකයාම වුවද නොවුවද එම පත්කිරීම ඕනෑම මොහොතක අවලංගු කළ හැකි අතර, එසේ අවලංගු කරනු ලැබූ විට හෝ නියෝජිතයාගේ මරණය සිදුවූ විට වහාම වෙනත් නියෝජිතයකු පත් කරනු ලැබිය යුතුය. මුල් අවස්ථාවේදී නියෝජිතයා පත් කළ විට හා පසුව වෙනත් නියෝජිතයකු ආදේශ කළ විට එම නම් කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ දැන්වීමක් මගින් ප්‍රදර්ශනය කළ යුතුය.

එක් එක් ඡන්ද නියෝජිතයා විසින් සෑම මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන්ම එක් බලයලත් නියෝජිතයෙකුට වැඩි නොවන සංඛ්‍යාවත් පත් කළ හැකිය. එම පත්වීම නාමයෝජනා දිනයේ සිට සතියක් ඇතුළත අදාළ මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධාරී වෙත ලියවිල්ලකින් භාර දිය යුතුය. ඉහත සඳහන් කාල සීමාව තුළ යම්කිසි මැතිවරණ කොට්ඨාසයක් සඳහා බලයලත් නියෝජිතයකු අපේක්ෂකයෙකු වෙනුවෙන් පත් නොකරන ලද අවස්ථාවක ඡන්ද නියෝජිතයා එම මැතිවරණ කොට්ඨාසයේ බලයලත් නියෝජිතයා වශයෙන් සලකනු ලැබේ.

එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බලයලත් නියෝජිතයන් විසින් එකී මැතිවරණ කොට්ඨාස තුළ පිහිටා ඇති එක් එක් ඡන්ද ප්‍රදේශය සඳහා එක් ප්‍රාදේශීය නියෝජිතයකුට වැඩි නොවන සංඛ්‍යාවක් නාමයෝජනා කිරීමේ දිනය සිට සති දෙකක් ඇතුළත පත් කළ යුතු අතර, එම සෑම පත්වීමක්ම ලියවිල්ලකින් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත භාරදිය යුතුය.

පාර්ලිමේන්තු මැතිවරණයේදී හා පළාත් සභා ඡන්ද විමසීමේදී තරග කරන පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයේ පළමුව නම සඳහන් තැනැත්තා පාර්ලිමේන්තු මැතිවරණයේදී මැතිවරණ කොට්ඨාසය සඳහා සහ පළාත් සභා ඡන්ද විමසීමේදී පරිපාලන දිස්ත්‍රික්කය සඳහා බලයලත් නියෝජිතයා වශයෙන් සලකනු ලබන අතර, එම බලයලත් නියෝජිතයාට හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාට අපේක්ෂක ලැයිස්තුවේ නම් සඳහන් අපේක්ෂකයන් අතරින් එක් අපේක්ෂකයෙකුට ඡන්ද ප්‍රදේශයක් සඳහා මැතිවරණ දිනට පෙර දින හතකට කලින් නොවන දිනයකදී, ඡන්ද මධ්‍යස්ථාන සඳහා ඡන්දස්ථාන නියෝජිතයන් පත්කිරීමේ බලතල පැවරිය හැකිය. කිසියම් බලයක් නියෝජිතයෙක් යම්කිසි ඡන්ද ප්‍රදේශයක් සඳහා පවරා නොමැතිවිට බලයලත් නියෝජිතයා විසින් සියලුම කටයුතු කිරීමට සිදුවේ.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී පළාත් පාලන ආයතන සඳහා තරග කරන දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක නායකයෙකු විසින් නාමයෝජනා කාලසීමාව ආරම්භ වීමට පැය 72 කට පෙර එම ලේකම් හෝ කණ්ඩායමේ නායකයා විසින් ඡන්ද විමසීම පැවැත්වෙන ඡන්ද ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත බලයලත් නියෝජිතයෙකුගේ නම ලියවිල්ලකින් පත්කර එවීමට හැකියාව ඇත.


සෑම මැතිවරණයකදීම ඡන්ද විමසීමකදීම ඡන්ද මධ්‍යස්ථාන සඳහා ඡන්දස්ථාන නියෝජිතයන් දෙදෙනෙකු බැගින්ද, එකකට වඩා වැඩි ඡන්ද මධ්‍යස්ථානවලට අයත් ඡන්ද පෙට්ටි ගණන් කරන මධ්‍යස්ථානයකට ගණන් කිරීමේ නියෝජිතයන් පස්දෙනෙකු බැගින්ද පත්කිරීමේ බලතල තරග කරන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලට හිමිවේ. ඡන්ද මධ්‍යස්ථාන සඳහා නියෝජිතයන් පත්කිරීමේ බලතල ඡන්ද ප්‍රදේශය සඳහා පත්කර ඇති නියෝජිතයාට හෝ බලයලත් නියෝජිතයාට හෝ හිමි වන අතර, ගණන් කිරීමේ මධ්‍යස්ථාන සඳහා නියෝජිතයන් පත් කිරීමේ බලතල බලයලත් නියෝජිතයාට හෝ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට හෝ පමණක් හිමිවේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී පමණක් එම බලතල සියල්ල බලයලත් නියෝජිතයාට හිමිවේ. පළාත් පාලන ඡන්ද විමසීම මෙන්ම ඡන්ද මධ්‍යස්ථානයේදී ගණන් කිරීමේ කටයුතු සිදුවන විට ගණන් කිරීමේ මධ්‍යස්ථානයට එකම එක ඡන්ද මධ්‍යස්ථානයක් පමණක් අනුයුක්ත කර ඇති බැවින්, ගණන් කිරීමේ නියෝජිතයන් දෙදෙනෙකු පමණක් පත්කිරීමේ බලතල ඇත.

සෑම මැතිවරණයකදීම/ඡන්ද විමසීමකදීම ප්‍රතිඵල වගුගත කරන ස්ථානයට දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් නියෝජිතයන් දෙදෙනෙකු පත් කිරීමේ හැකියාව ඇති අතර, ඒ සඳහා බලතල ඇත්තේ බලයලත් නියෝජිතයන්ට පමණි.

ඕනෑම අවස්ථාවක පහළ මට්ටමක සිටින නියෝජිතයෙකුගේ බලතල ඕනෑම අවස්ථාවක ඉවුකිරීමට ඊට ඉහල මට්ටමේ නියෝජිතයාට බලය ඇත්තේය.

## 3.7 ඡන්දය හා මනාප සලකුණු කිරීම


ජනාධිපතිවරණයකදී ඡන්දය ලකුණු කිරීමේ නියම ක්‍රමය වන්නේ අංක ‘ 1’ තමා කැමති අපේක්ෂකයාගේ සලකුණ ඉදිරිපිට ඇති හිස් කොටුවේ ලකුණු කිරීමයි. ජනාධිපතිවරණයේදී ‘X’ඡන්දය වශයෙන් පිළිගනු ලබන්නේ ‘1’ වෙනුවෙන් යොදා ඇති විකල්ප සලකුණක් වශයෙන් පමණි. තිදෙනෙකුට වැඩි අපේක්ෂකයන් සංඛ්‍යාව තරඟ කරන ජනාධිපතිවරණයකදී ඡන්දය සලකුණු කිරීමට අමතරව මනාප දෙකක් සලකුණු කිරීමේ හැකියාව ද සෑම ඡන්ද දායකයාටම හිමි වේ. එවිට තමාගේ ඡන්දය ‘1’ වශයෙන් සලකුණු කිරීමෙන් අනතුරුව, තමා කැමති නම් තවත් එක් අපේක්ෂකයෙකුට ‘2’ සලකුණු කිරීමෙන් දෙවන මනාපයද, තවත් අපේක්ෂකයකුට ‘3’ ලකුණු කිරීමෙන් තුන්වන මනාපය ද යෙදිය හැකිය.




පාර්ලිමේන්තු මැතිවරණයේදී සහ තවදුරටත් සමානුපාතික මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක වන්නේ නම් පළාත් සභා ඡන්ද විමසීමේදී ද තමා කැමති දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමට ‘X’ ලකුණු කිරීමෙන් ඡන්දයද, ඡන්ද පත්‍රිකාවේ පහළ කොටසේ ඇති අපේක්ෂක මනාප අංක මත එක් කෙනෙකුට හෝ දෙදෙනෙකුට හෝ උපරිම වශයෙන් තිදෙනෙකුට හෝ ‘X’ සලකුණු කිරීමෙන් මනාපද සටහන් කළ හැකිය. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මිශ්‍ර ඡන්ද විමසීමක් වන බැවින්, ඡන්දය පමණක් තමා කැමති සලකුණ ඉදිරිපිට ‘X’ මගින් සලකුණක් කළ හැකිය.

## 3.8. ඡන්ද පොල සැකසීම

ඡන්ද පොල සකස් කිරීම එම ඡන්ද පොලට අනුයුක්ත කර ඇති ඡන්ද සංඛ්‍යාව මත තීරණය වේ. ඡන්ද හිමියන් සංඛ්‍යාව 900 ට අඩු වූ විට තනි පෝලිමේ ඡන්ද පොලක්ද, ඡන්ද හිමියන් 900 වැඩිවන විට පෝලිම් දෙකේ ඡන්ද පොලක් ද පවත්වාගෙන යනු ලැබේ.




## 3.9 ඡන්ද හා මනාප ගණන් කිරීම.

ජනාධිපතිවරණයේදී යම්කිසි අපේක්ෂකයෙකු මුළු දිවයිනේම දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් අවම වශයෙන් 50% සහ තවත් එක ඡන්දයක් හෝ ලබාගත්විට ඔහු හෝ ඇය ජනාධිපතිවරයා වශයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙතෙක් පවත්වන ලද ජනාධිපතිවරණ අටේදීම ජනාධිපති ධූරයට පත් වූ තැනැත්තන් සියලු දෙනාම 50% හා අවම වශයෙන් එක ඡන්දයකට හෝ වැඩියෙන් ලබාගත් නිසා ජනාධිපති ධූරවලට පත් වූහ. ගණන් කිරීම අවසානයේදී කිසිම කෙනෙකු ඉහත සඳහන් සීමාව ඉක්මවා යැමට අපොහොසත් වන අවස්ථාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ විධිවිධාන අනුව, මුළු රටේම වැඩිම ඡන්ද ලබාගත් දෙදෙනා වෙනුවෙන් සෙසු අපේක්ෂකයන්ට ඡන්දය දෙන ලද ඡන්දදායකයන් විසින් ලකුණු කර ඇති දෙවන හා තුන්වන මනාප ගණන් කිරීමෙන් අනතුරුව වැඩිම ඡන්ද ලබා ගන්නා අපේක්ෂකයා ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්වනු ලැබේ.

මනාප ගණන් කිරීමට පෙර මැතිවරණ කොමිෂන් සභාව විසින් අපේක්ෂකයන් ලබාගත් ඡන්ද ප්‍රමාණ අනුව, සියලුම ජනාධිපති ධූර අපේක්ෂකයන් අවරෝහණ පිළිවෙලට ලැයිස්තු ගත කරනු ලබන අතර, ලැයිස්තුවේ නම් සඳහන් පළමු වැන්නා සහ දෙවැන්නා තරගයේ තවදුරටත් රැඳී සිටින අපේක්ෂකයන් (Remaining Candidates) වශයෙන් ද, සෙසු අපේක්ෂකයන් සියලු දෙනා තරගයෙන් ඉවත් කරන ලද අපේක්ෂකයන් (Eliminated Candidates) වශයෙන්ද නම් කරනු ලැබේ. ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර සියලුම ගණන් කිරීමේ මධ්‍යස්ථානවලදී දැනටමත් මුද්‍රා තබා සුරක්ෂිතව රඳවා ගෙන ඇති එක් එක්

අපේක්ෂකයන් වෙනුවෙන් ඡන්දය සලකුණු කර ඇති පත්‍රිකා අඩංගු මුද්‍රිත මලු අතරින්, තරගයේ තවදුරටත් රැඳී සිටින අපේක්ෂකයන්ගේ දෙදෙනාගේ මලු සුරක්ෂිතව විවෘත නොකොට පැත්තක තබන අතර, තරගයෙන් ඉවත් කරන ලද අපේක්ෂකයන්ගේ මලු එකින් එක මුද්‍රා කඩා විවෘත කර ඡන්ද පත්‍රිකා සියල්ල පහත ආකාරයට මේස මත තබා ඇති පෙට්ටි හයක තැන්පත් කරනු ලැබේ.

1. පළමු වැන්නාට ලැබූ දෙවන මනාප
2. පළමු වැන්නාට ලැබූ තුන්වන මනාප
3. දෙවැන්නාට ලැබූ දෙවන මනාප
4. දෙවැන්නාට ලැබූ තුන්වන මනාප
5. මනාප නොමැති ඡන්ද පත්‍රිකා
6. ඉතිරි ඡන්ද පත්‍රිකා

සෑම අවස්ථාවකම දෙවන මනාප පළමුවැන්නාට හෝ දෙවැන්නාට ලබාදී ඇත්දැයි සොයා බලනු ලබන අතර, දෙවන මනාප පළමුවැන්නා හෝ දෙවැන්නා යන දෙදෙනාගෙන් කිසි කෙනෙකුට ලබාදී නොමැති නම් පමණක් තුන්වන මනාප එම දෙදෙනාගෙන් එක් අයකුට ලබා දී ඇත්දැයි සොයා බලා අදාළ පෙට්ටියට තුළ එම ඡන්ද පත්‍රිකා තැන්පත් කරනු ලැබේ. මෙසේ ගණන් කිරීමෙන් පසු පළමුවැන්නා දැනටමත් මුළු දිවයිනෙහි ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාවට ඔහු විසින් ලබාගත් දෙවන හා තුන්වන මනාපද, දෙවැන්නා දැනටමත් ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාවට ඔහු විසින් ලබාගෙන ඇති දෙවන හා තුන්වන මනාපද එකතු කිරීමෙන් අනතුරුව වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගෙන ඇති අපේක්ෂකයා ජනාධිපතිවරයා වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම අදියරේදී තරගය දෙදෙනෙකු අතර පමණක් තිබෙන බැවින්, එක් ඡන්දයක් හෝ වැඩියෙන් ලබා ගත් විට ඔහු 50%ට වඩා වැඩි ඡන්දයක් ලබා ගන්නා බැවින් මෙසේ ජනාධිපතිවරයා වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

පාර්ලිමේන්තු මැතිවරණයේදී සහ තවදුරටත් සමානුපාතික මැතිවරණ ක්‍රමය යටතේ පවත්වන්නේ නම් පළාත් සභා ඡන්ද විමසීමේදී පිළිවෙලින් මැතිවරණ කොට්ඨාසයේ හෝ පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් පක්ෂ හෝ කණ්ඩායම් ලබාගනු ලබන ඡන්ද සංඛ්‍යාවට සමානුපාතිකව හිමිවන මන්ත්‍රී ධූර සඳහා ඒ පක්ෂය හෝ කණ්ඩායමෙන් වැඩිම මනාප ලබා ගන්නා අපේක්ෂකයන් අතරින් මන්ත්‍රීවරුන් තෝරා පත් කරනු ලැබේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මිශ්‍ර ඡන්ද විමසීමක් බැවින්, කොට්ඨාසය ජයග්‍රහණය කරන අපේක්ෂකයා කොට්ඨාසයේ සභිකයා වන අතර, එම පළාත් පාලන ආයතනයේ දී එක් එක් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගනු ලබන ඡන්ද සංඛ්‍යාවට සමානුපාතිකව හිමිවන සභික ධූර සංඛ්‍යාවෙන් කොට්ඨාස ජයග්‍රහණය කර සභික සංඛ්‍යාව අඩු කිරීමෙන් ඉතිරිවන සභික ධූර සඳහා දෙවන ලැයිස්තුවේ හෝ කොට්ඨාසවල තරග කරන ලද අපේක්ෂකයන් අතරින් හෝ පක්ෂ ලේකම් හෝ කණ්ඩායම් නායකයා විසින් තෝරා යවනු ලබන සභිකයන් පත් කරනු ලැබේ.

## 3.10 මැතිවරණ වියදම් නියාමනය කිරීම

2003 වර්ෂයේ ජනවාරි මස 24 වන දින සහතික කරන ලද 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන හේතුවෙන් මැතිවරණ පරිපාලනයට නව ජීවයක් ලැබී ඇත.

මෙම පනත අනුව සෑම මැතිවරණ/ඡන්ද විමසීම සඳහාම නාමයෝජනා කාලසීමාව අවසන් වී දින පහක් (5) ඇතුළත මැතිවරණ කොමිෂන් සභාව තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සමඟ සාකච්ඡා කර එක් එක් පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයා විසින් ඡන්ද හිමියෙකු වෙනුවෙන් වැය කළ හැකි උපරිම මුදල තීරණය කළ යුතු අතර, ඉන් පසුව ඒ ඒ මැතිවරණ බල ප්‍රදේශ

අනුව ලියාපදිංචි වී ඇති ඡන්ද හිමියන් සංඛ්‍යාව ඉහත සඳහන් ආකාරයට තීරණය කළ මුදලෙන් වැඩිකර **'බලයලත් මුදල'** යනුවෙන් සඳහන් කරනු ලබන තරග කරන එක් එක් දේශපාලක පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයා විසින් මැතිවරණ කාල සීමාව තුළ වියදම් කළ හැකි උපරිම මුදල ගණනය කර ගැසට් පත්‍රයකින් ප්‍රසිද්ධ කළ යුතුය.

සෑම මැතිවරණයක්ම/ඡන්ද විමසීමක්ම අවසන් වී දින විසි එකක් (21) ඇතුළත තරග කළ සෑම දේශපාලන පක්ෂයක්ම ස්වාධීන කණ්ඩායමක්ම සහ සෑම අපේක්ෂකයෙකුම සිය මැතිවරණ වියදම් වාර්තා අදාල තේරීම්භාර නිළධාරීන්ට (ජනාධිපතිවරණයේදී නම් මැතිවරණ කොමිෂන් සභාවට) තමා විසින් ඉදිරිපත් කර ඇති සියලුම තොරතුරු නිවැරදි බවට දක්වන ප්‍රකාශයක් සාමදාන විනිශ්චයකරුවන් ඉදිරිපිට අත්සන් කර ඉදිරිපත් කළ යුතුය. තමන්ට ලැබී ඇති සියලුම වාර්තා මහජන ප්‍රදර්ශනය සඳහා ප්‍රසිද්ධ කරනු ලබන ස්ථාන හා දිනය පිළිබඳ වූ දැන්වීමක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් අවම වශයෙන් එක් ජාතික පුවත්පතක හෝ ඉහත සඳහන් දින විසි එක (21) ඉකුත්වීමෙන් අනතුරුව එළඹෙන දින දහයක් (10) ඇතුළත අදාළ නිලධාරීන් විසින් පළ කළ යුතුය.

මැතිවරණ වියදම් වාර්තාවට සෑම කෙනෙකුම මැතිවරණ කාලසීමාව තුළ තමා වෙත ලැබී ඇති ලැබීම් හා වියදම් කර ඇති වියදම් සියල්ල ඇතුළත් කළ යුතුය.

මෙම පනත අනුව පහත සඳහන් ස්ථානවලින් මැතිවරණ ප්‍රවර්ධනය කිරීමේ හෝ ඉඩ සැලසීමේ කාර්යය සඳහා මුදලින් ද්‍රව්‍යමය ආකාරයකින් ඍජුව හෝ වක්‍රව ඒ පරිත්‍යාග හෝ දායකත්ව ලැබුණද ඒ පරිත්‍යාග හෝ දායකත්ව පිළිගැනීම හෝ භාරගැනීම නොකළ යුතුය.

(අ) යම් රජයේ දෙපාර්තමේන්තුවකින් රාජ්‍ය සංස්ථාවකින් හෝ සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාල පූර්ව කාලීන යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථා ගත කරන ලද සමාගමක් වෙතින්,

(ආ) විදේශීය රාජ්‍යයකින්, ජාත්‍යන්තර සංවිධානයකින් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථා ගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ පුද්ගල මණ්ඩලයකින්,

(ඇ) ඍජුව හෝ වක්‍රව විදේශීය කොටස් හිමිකාරිත්වය සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරනු ලබන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාල පූර්වකාලීන යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද යම් සමාගමකින්, හෝ

(ඇ) අනන්‍යතාව හෙළි නොකරන ලද යම් තැනැත්තෙකුගෙන්.

### පහත සඳහන් සියලුම ලැබීම් ඉහත සඳහන් වියදම් වාර්තාවට ඇතුළත් කළ යුතුය.

(අ) ඒ දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් ඒ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ, භාර ගනු ලැබූ සියලු පරිත්‍යාග හෝ දායකත්ව සහ එම පරිත්‍යාග හෝ දායකත්ව ද්‍රව්‍යමය වශයෙන් ලැබුණේ නම් ඒ පරිත්‍යාගවල හෝ දායකත්වයේ ඇස්තමේන්තු ගත වටිනාකම;

(ආ) ඒ පරිත්‍යාග හෝ දායකත්ව භාරගනු ලැබුවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම හෝ තැන්පතු වශයෙන්ද යන වග; සහ

(ඇ) ඒ පරිත්‍යාග හෝ දායකත්ව සිදු කරන ලද තනි පුද්ගලයින්ගේ හෝ සංස්ථා ගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලවල අවස්ථාවෝචිත පරිදි නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ලියාපදිංචි අංකය.

ඉහත සඳහන් වියදම් වාර්තාවට පහත සඳහන් වියදම් සියල්ල ඇතුළත් කළ යුතුය.

(අ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම්, අත්පත්‍රිකා, ධජ, සිතුවම්, ඡායාරූප, දැන්වීම් පත්‍ර හෝ පෝස්ටර් මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම, ඇලවීම, ප්‍රදර්ශනය කිරීම හෝ නිරූපණය කිරීම සඳහා;

(ආ) ඒ මැතිවරණයට අදාල ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කිරීම සහ ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ ප්‍රචාරය කිරීම සඳහා;

(ඇ) ඒ මැතිවරණයට අදාළ ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කර පුවත්පත්වල, වාර සඟරාවල, සමාජ මාධ්‍යවල, ඩිජිටල් පුවරු හෝ වෙනත් ඕනෑම ඩිජිටල් මාධ්‍යයක හෝ වෙනත් ප්‍රකාශනවල ප්‍රකාශයට පත් කිරීම සඳහා;

(ඈ) ඒ මැතිවරණයට අදාළ රැස්වීම් පැවතීම සඳහා යම් පරිශ්‍රයක් හෝ උපකරණ කුලියට ගැනීම හෝ භාවිත කිරීම සඳහා

(ඉ) අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් වාහන කුලියට ගැනීම සඳහා වන වියදම් හැර, ඒ මැතිවරණයට අදාළ කටයුතු සඳහා වාහන කුලියට ගැනීම සඳහා;

(ඊ) ඒ වාහන ධාවනයට ඉන්ධන සැපයීම සඳහා

වැය කරන ලද මුදල් ගෙවීම් කරන ලද්දේ ද නැද්ද යන්න පිළිබඳව හා එම ගෙවීම් තහවුරු කරන බිල්පත් සහ කුවිතාන්සි සමඟ ඉදිරිපත් කළ යුතු අතර, ඉහත සේවාවන් ගෙවීමක් රහිතව ලබාගෙන ඇත්නම් එම සේවාවන් ලබා ගත් තැනැත්තන්ගේ නම් සහ ලිපිනය ඇතුළුව සියලු වියදම් ඇතුළත් කළ යුතුය.

පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ වෙනුවෙන් වියදම් කරනු ලබන පහත සඳහන් වියදම් එම වාර්තාවට ඇතුළත් නොකළ යුතුය.

(අ) මැතිවරණය පැවැත්වෙන ප්‍රදේශය තුළ අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතු සඳහා සිදු කරන ලද වියදම් සහ

(ආ) ලිපි ද්‍රව්‍ය, දුරකථන හෝ වෙනත් ආකාරයේ සන්නිවේදන කටයුතු සඳහා සිදු කරන ලද වියදම්.

යම් නීතියක් යටතේ පවත්වනු ලබන මැතිවරණයකදී සාධාරණ හේතුවක් නොමැතිව ඉහත සඳහන් වියදම් වාර්තාව දින විසි එකක් (21) ඇතුළත භාරදීමට අපොහොසත් වන හෝ

ඉහත සඳහන් වියදම් වාර්තාවට ඇතුළත් කර ඇති සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරියේ කරන ලද ප්‍රකාශය සාවද්‍ය බව ඒ තැනැත්තා විසින් දැනුවත්ව හෝ සාධාරණව දැන සිටිනු ලැබිය හැකි ප්‍රකාශයක් වන්නාවූ යම් ප්‍රකාශයක් සිදු කරන සෑම අපේක්ෂකයෙකුම අදාළ මැතිවරණයේ නීතිය අනුව, නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදු කරනු ලබන අතර, නීති විරෝධී ක්‍රියාවක් සිදුකිරීම සම්බන්ධයෙන් නීතිය මගින් නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයටද යටත් විය යුතුය.

ඕනෑම නීති විරෝධී ක්‍රියාවක් හේතුවෙන් වරදකරු වන තැනැත්තෙකුට යම්කිසි ප්‍රමාණයේ දඩ මුදලට අමතරව, මැතිවරණයකදී තේරී පත්වී ඇත්නම් එම මන්ත්‍රී ධුරය හෝ සභිකත්වය අහෝසි වනවා සේම යම්කිසි කාලසීමාවක් සඳහා ප්‍රජා අයිතියද අහිමි වනු ඇත.

මෙම පනතේ 'මැතිවරණය' යනුවෙන් සඳහන් කර ඇත්තේ ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා ඡන්ද විමසීම් සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් බව මතක තබාගත යුතුය.

## 3.11. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් පනවනු ලබන දඩ මුදල් වැඩි කිරීම

| මෙතෙක් තිබූ දඩමුදල් | සංශෝධිත දඩමුදල් |
|---|---|
| රුපියල් 50.00 | රුපියල් 25,000.00 |
| රුපියල් 100.00 | රුපියල් 50,000.00 |
| රුපියල් 300.00 | රුපියල් 100,000.00 |
| රුපියල් 500.00 | රුපියල් 200,000.00 |
| රුපියල් 1000.00 | රුපියල් 400,000.00 |

2023 ඔක්තෝබර් මස 17 වන දින සහතික කරන ලද 2023 අංක 21 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් මෙතෙක් ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන සෑම මැතිවරණ/ඡන්ද විමසීම්වලදී නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පනවනු ලබන දඩ මුදල් ප්‍රමාණය ඉතා ඉහළ ප්‍රතිශතයකින් ඉහළ දමා ඇත. ඒ අනුව පහත සඳහන් වගුවේ සඳහන් ආකාරයට ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා ඡන්ද විමසීම සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් යන සියලුම මැතිවරණවල/ඡන්ද විමසීම් වල නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ දඩ මුදල් සඳහා මෙම පනත අදාළ වේ. සෑම මැතිවරණයකම/ඡන්ද විමසීමකම නීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන වන ලද මුදල් පහත සඳහන් ආකාරයට ඉහළ දමා ඇත.

මැතිවරණයකට/විමසීමකට තරග කරනු ලබන අපේක්ෂකයෙකු විසින් නාමයෝජනා දිනයේ සිට මාස තුනක් ඇතුළත සිය වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු බවට වූ නීතිය 2023 අගෝස්තු මස 8 වන දින සහතික කරන ලද 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80(1)(ප) උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හා (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමකදී තෝරාපත් කර ගැනීම සඳහා නම් කළ අපේක්ෂකයන් විසින් වත්කම් සහ බැරකම් ප්‍රකාශයේ ආකෘති පිටපතක් සහ වත්කම් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ලුහුඬු සටහනක් අපේක්ෂකයාගේ නාමයෝජනා පත්‍රය සමඟ මැතිවරණ කොමිෂන් සභාව (හෝ තේරීම්භාර නිලධාරි) වෙත භාරදිය යුතුය.

## 3.12 මැතිවරණ කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වා දෙන ලද මැතිවරණ කොමිෂන් සභාව දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කොමිෂන් සභා අතරින් සුවිශේෂී කොමිෂන් සභාවක් වේ. ඉන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහඅට වන දහනව වන, විසිවන සහ විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් සංශෝධනයට ලක් වූ මැතිවරණ

කොමිෂන් සභාව පිළිබඳ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 සහ 104 යන ව්‍යවස්ථා අනුව මැතිවරණ කොමිෂන් සභාවේ වර්තමාන ව්‍යුහය පහත දැක්වේ.

මැතිවරණ කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන යම් වෘත්තියක හෝ පරිපාලනය හෝ අධ්‍යාපනය යන ක්ෂේත්‍රයක විශිෂ්ටතා හිමි කරගෙන සිටින තැනැත්තන් අතරින් පස් දෙනකුගෙන් සමන්විත සභාවක් වන්නේය. එම සභාවේ සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු වශයෙන් හෝ ඊට ඉහළ වූ හෝ ධූරයක් දරනු ලැබූ මැතිවරණ දෙපාර්තමේන්තුවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ විශ්‍රාමලත් නිලධරයකු විය යුත්තේය. එම කොමිෂන් සභාවේ සාමාජිකයන් අතරින් කෙනෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා වශයෙන් පත් කරනු ලබයි .

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම සහ ජනමත විචාරණ පැවැත්වීම කොමිෂන් සභාවේ පරමාර්ථ විය යුත්තේය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ අධිකරණ නිලධරයකු හෝ රජයේ නිලධරයකු හෝ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත් කිරීම හෝ කටයුතු කිරීම නොකළ යුත්තේය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් ධූරයෙන් ඉවත් කිරීම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් නීතිවල විධිවිධාන මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් ධූරය ඉවත් කිරීම සඳහා ද අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල විය යුත්තේය. කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුත්තේය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද හෝ ගනු ලැබූ හෝ කරන ලදැයි නැතහොත් ගන්නා ලදැයි කියනු ලබන යම් තීරණයක්, විධානයක් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ පැමිණිල්ලක් කවර හේතුවක් නිසා වුවද කවර ආකාරයකින් වුවද ගැනීම හෝ ඇසීම හෝ තීරණය කිරීම හෝ ප්‍රශ්න කිරීමට පාත්‍රයක් කිරීම සඳහා බලය හෝ අධිකරණ බලය කිසිදු අධිකරණයකට නැත්තේය. කොමිෂන් සභාවේ තීරණ, විධාන හෝ ක්‍රියා සහ තීරණාත්මක විය යුත්තේය. තවද කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි යම් ඡන්ද විමසීමක් පැවැත්වීම හෝ ජනමත විචාරණය පැවත්වීම හා සම්බන්ධ යම් නීතියක් යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමේදී හෝ තම කර්තව්‍ය සිදුකිරීමේදී හෝ ඔහු විසින් සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට හෝ නිලධරයාට විරුද්ධව කිසිදු සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් නොපවරනු ලැබිය යුත්තේය .

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලු මැතිවරණ හා ඡන්ද විමසීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවට හෝ මැතිවරණ කොමසාරිස් ජෙනරාල්වරයා වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය කොමිෂන් සභා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේද ඉටු කරනු ලැබිය යුත්තේ ද සිදු කරනු ලැබිය යුත්තේ ද වන්නේය. ඡන්ද විමසීම්වල සහ ජනමත විචාරණවල කාර්යය සඳහා ඡන්ද හිමි නාම ලේඛන පිළියෙල කිරීම සහ ප්‍රතිශෝධනය කිරීමද එම ඡන්ද විමසීම පැවැත්වීමද එකී බලතලවලට කාර්යවලට සහ කර්තව්‍යලට ඇතුළත් වන නමුත් ඒවාටම පමණක් සීමා නොවන්නේය. එවැනි ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් හෝ පැවැත්වීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීම කොමිෂන් සභාවේ කාර්යය විය යුතු අතර, එසේ ඒ නීති බලාත්මක කිරීම සුරක්ෂිත කිරීමෙහිලා කොමිෂන් සභාවට සහයෝගය දැක්වීම එකී බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්ය විය යුත්තේය.

කොමිෂන් සභාවේ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට

වගකිවයුතු සහ උත්තර දිය යුතු අතර, එක් එක් ලිත් වර්ෂයේදී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් ඒ වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය.

මැතිවරණ කාල සීමාව තුළ රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්, යම් ඡන්ද විමසීමකදී තරඟ කරන යම් අපේක්ෂකයෙකු හෝ දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරාපත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා භාවිත කිරීම හෝ ඒ ඡන්ද විමසීමේදී තරඟ කරන යම් අපේක්ෂකයෙකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම කොමිෂන් සභාවේ උපදෙස් මත කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මගින් තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේය. එවැනි විධානයකට අනුකූල වීම සහ එය ක්‍රියාත්මක කිරීම තත්කාලයේ ඒ දේපළ භාරව සිටින හෝ ඒ දේපළේ පාලනය දරන හෝ සෑම තැනැත්තකුගේ ම හෝ සෑම නිළධරයකුගේ ම හෝ කාර්යය විය යුත්තේය.

ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් නිදහස් හා සාධාරණ වශයෙන් පැවතීම සහතික කිරීම සඳහා අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන උපමාන යම් ගුවන්විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වාගෙන යන්නෙකු හෝ ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත කලින් කළ නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුත්තේය.

එසේ නිකුත් කරනු ලබන උපමාන පිළිපැදීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ගුවන් විදුලි සේවය හෝ රූපවාහිනී සේවය පවත්වාගෙන යන්නාගේ හෝ ප්‍රවෘත්ති පත්‍රයේ අයිතිකරුගේ නැතහොත් ප්‍රකාශකයාගේ කාර්යය වන්නේය.

ඉහත සඳහන් රාජ්‍ය දේපළ අවභාවිත කිරීම තහනම් කරන විධාන හෝ මාධ්‍ය වෙත නිකුත් කරනු ලබන උපමාන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළ කරනු ලබන පුළුල් සංසරණයක් ඇති දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක හෝ පළකිරීමට වගබලා ගත යුතු අතර, එම විධාන හෝ උපමාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ හෝ එම විධාන සහ උපමානවල සඳහන් කරනු ලබන යම් පසු දිනක හෝ සිට ක්‍රියාත්මක විය යුත්තේය. සෑම විධානයක්ම උපමානයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේය. එසේ අනුමැතිය නොලබන යම් විධාන හෝ උපමාන ඒවා යටතේ පූර්වයේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුත්තේය.

ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් සඳහා නියමයක් කරනු ලැබූ විට එම ඡන්ද විමසීම හෝ ජනමත විචාරණය පැවැත්වීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය පහසුකම් සහ පොලිස් නිලධරයන් සංඛ්‍යාවක් කොමිෂන් සභාව වෙත ලබා දෙන ලෙස පොලිස්පතිවරයාට කොමිෂන් සභාව විසින් දැනුම් දිය යුත්තේය. එසේ දැනුම් දීමක නිශ්චිතව සඳහන් පහසුකම් හා පොලිස් නිලධරයන් පොලිස්පතිවරයා විසින් කොමිෂන් සභාවට ලබාදිය යුත්තේය. මෙසේ සපයනු ලද පොලිස් නිලධරයන් හා පහසුකම් ඡන්ද විමසීම හෝ ජනමත විචාරණය නිදහස්ව හා සාධාරණව පැවැත්වීම සඳහා සැලසුම්ගත ආකාරයකින් කොමිෂන් සභාව විසින් යොදවා ගත යුත්තේය. එසේ කොමිෂන් සභාව වෙත සපයන ලද සෑම පොලිස් නිලධරයෙකු ම ඡන්ද විමසීම් කාලසීමාව තුළ කොමිෂන් සභාවට වගකිව යුතු අතර, කොමිෂන් සභාවේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුත්තේය. මෙසේ සපයනු ලැබූ පොලිස් නිලධරයකු විසින් කොමිෂන් සභාවේ විධානයක් ප්‍රකාර කොමිෂන් සභා යටතේ කර්තව්‍ය ඉටු කිරීමේදී හෝ සද්භාවයෙන් කරන ලද යම් නීත්‍යානුකූල ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් එම පොලිස් නිලධරයාට විරුද්ධව යම් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුත්තේය.

මැතිවරණ කොමිෂන් සභාවේ යටතේ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙක් සිටිය යුත්තේය. කොමසාරිස් ජනරාල්වරයා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු නියම හා කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේය.

තමා පිළිබඳ යම් කාරණයක් කොමිෂන් සභා විසින් සලකා බලනු ලබන අවස්ථාවකදී හැර කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණ සිටීමේ හිමිකම මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට ඇත්තේය. එසේ වුවද එම රැස්වීම්වලදී ඡන්දය දීමේ අයිතිය ඔහුට නොමැත්තේය.

කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත කොමිෂන් සභාවට වෙනත් නිලධරයන් කොමිෂන් සභා විසින් පත් කරනු ලැබිය හැක්කේය.

මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ තීරණ, කොමිෂන් සභාවේ විධානවලට සහ පාලනයට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ නිලධරයන් විෂයයෙහි අධීක්ෂණය කිරීමද කරනු ලැබිය යුත්තේය. කොමිෂන් සභාවේ බලතල කාර්ය සහ කර්තව්‍ය කිසිවක් කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල් වරයා වෙත හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකු වෙත හෝ පවරා දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ විධානයට සහ පාලනයට යටත්ව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා හෝ ඒ වෙනත් නිලධරයා හෝ විසින් ඒ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමද ඉටු කිරීමද කරනු ලැබිය යුත්තේය.

මෙසේ පත් කරනු ලැබූ සෑම නිලධරයකු ම වෙත පවරන ලද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේදී කොමිෂන් සභා විසින් නිකුත් කරනු ලබන විධානවලට ඔහු යටත් විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වගකිවයුතු සහ උත්තර දිය යුතු වන්නේය.

කොමිෂන් සභාව විසින් රාජ්‍ය සම්පත් අවභාවිතය පිළිබඳව නිකුත් කරනු ලබන විධාන හෝ ජනමාධ්‍ය වෙත නිකුත් කරනු ලබන උපමාන සමඟ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් රජයේ නිලධරයකු, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරා ඇති යම් වෙළඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක සේවා නියුක්තිකයකු, සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක හෝ විසින් දරනු ලබන යම් සමාගම වරදකට වරදකරුවන අතර, වරදකරු කිරීමේදී රුපියල් එක ලක්ෂයට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමට හෝ එකී දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේය. මෙම විධාන හෝ උපමාන පිළිනොපැදීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන්ට විරුද්ධව පවරනු ලබන යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමේ අධිකරණ බලය සෑම මහාධිකරණයටම තිබිය යුත්තේය.

# 4.

# ඡන්ද හිමියා

මැතිවරණ නීතිය අනුව ඡන්ද හිමියා සහ ඡන්ද දායකයා අතර සුළු වෙනසක් ඇති බව එම නීති පරිශීලනය කිරීමේදී නිරීක්ෂණය වේ. ඡන්ද හිමියා යන්නේ ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුළත් කිරීමට සුදුසුකම් ලැබීමෙන් අනතුරුව එම ලේඛනයේ සිය නම ලියාපදිංචි කර ඇති තැනැත්තා වේ. ඡන්දදායකයා යන්නේ යම්කිසි මැතිවරණයකදී/ඡන්ද විමසීමකදී ඡන්ද විමසීම් දිනයේදී ඡන්ද පොළට ගොස් තමා වෙත ඡන්ද පත්‍රිකාවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ඡන්ද හිමියා වේ.

මැතිවරණයකදී ඉතාමත් වැදගත් පාර්ශවය වන්නේ ඡන්ද හිමියන් වේ. ඡන්ද හිමියන් නොමැති නම් මැතිවරණයක්/ඡන්ද විමසීමක් නොමැත. ඡන්ද හිමියන්ගේ සුදුසුකම් නුසුදුසුකම් සහ ඡන්ද හිමියන්ගේ වගකීම් පිළිබඳව මෙම පරිච්ඡේදයේ විස්තර කරයි.

## 4.1. ඡන්ද හිමියකුගේ සුදුසුකම්

- වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම.
- මැතිවරණයට අදාළ වර්ෂයේ ඡන්ද නාම ලේඛණයට සිය නම් ඇතුළත්ව තිබිය යුතුය.
- අදාළ වර්ෂයේ පෙබරවාරි මස පළවෙනිදා වන විට සිය සුදුසුකම් ලැබීමේ ලිපිනයේ සාමාන්‍ය පදිංචිකරුවෙකු වීම.

## 4.2. ඡන්ද හිමියකුගේ නුසුදුසුකම්

- සිහිවිකල තැනැත්තකු ලෙස අධිකරණයක් මගින් තීරණය කර තිබීම.
- මැතිවරණ දූෂණ වරදකට වරදකරු වී ඇත්නම් වරදකරු ලෙස තීරණය කළ දින සිට වසර 7 ක් ඉක්මවා නොතිබීම.
- අල්ලස් පනත යටතේ වු වරදකට වරදකරු වී නම් වරදකරු කළ දින සිට වසර 7 ක් ඉක්මවා නොතිබීම.
- මැතිවරණ පනත යටතේ වු නීති විරෝධි ක්‍රියාවකට වරදකරු වී එහෙත් වරදකරු වීමේ දිනයේ සිට වර්ෂ 3ක් ඉක්මවා නොතිබීම.
- ප්‍රජා අයිතිය අහෝසි කළ පුද්ගලයකුගේ එකී කාලය ඉක්ම ගොස් නොමැති වීම.
- දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ බරපතල වරදකට වරදකරු වී ඇති විටක වරදකරු ලෙස තීරණය කළ දින සිට වර්ෂ 7ක් ඉක්මවා නොමැති වීම.
- ජනාධිපති කොමිෂන් සභාවක් විසින් එයට අගෞරව කිරීමේ වරදකට වරදකරු කළ පුද්ගලයකු එසේ වරදකරු ලෙස තීරණය කළ දින සිට වර්ෂ 7 ක් ඉක්මවා නොමැති වීම.
- අවුරුදු දෙකකට නොඅඩු කාලයකට බන්ධනා ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට වරදකරුවෙකු වී මාස හයකට වඩා වැඩි දඬුවමක් විඳිමින් සිටින්නේ නම් හෝ ගත වූ අවුරුදු හතක කාලය තුළ එම දඬුවම සම්පූර්ණයෙන්ම විඳ සිටී නම් හෝ මරණ දණ්ඩනයට යටත්ව සිටී නම් නැතහොත් එවැනි දණ්ඩනය නියමයක් ක්‍රියාවේ යෙදවීම වෙනුවට හය මාසයකට නොඅඩු කාලයකට බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් විඳ සිටියේ නම් ඒ තැනැත්තා අවුරුදු හතකට ඡන්ද හිමියෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා නුසුදුසු පුද්ගලයෙකු වේ.

## 4.3. ඡන්ද හිමියකුගේ වගකීම්

ඔබේ අතට නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් ලැබී ඇත්නම් එහි අදහස ඔබ ඡන්ද හිමියකු ලෙස සුදුසුකම් ලබා ඇති බවයි. ඉහත කී නුසුදුසුකම්වලින් මීදී අදාළ මැතිවරණයේදී ඡන්දය භාවිතා කිරීමට සුදුසුකම් ලබාඇති බවයි.

එසේම ඔබ පුරවැසියකුද වන බව අමතක නොකළ යුතුය. පුරවැසියකු ලෙස හිමිවන ජනතා පරමාධිපත්‍යයේ ප්‍රධාන හිමිකමක් වන්නේ ඡන්ද බලයයි. එබැවින් ඡන්ද හිමියකුගේ පළමු වගකීම වන්නේ ඡන්දය භාවිතා කිරීමයි.

එසේම ඡන්දය භාවිතා කිරීමේදී මැතිවරණයට ඉදිරිපත් වී ඇති දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් අතරින් නීති සම්පාදනය, මූල්‍ය පාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වඩාත් සුදුසු දේශපාලන පක්ෂයට ස්වාධීන කණ්ඩායමට ඡන්දය ලබාදීම ඡන්දදායකයකුගේ වගකීමකි.

ඡන්දය ලබාදීමෙන් අනතුරුව මනාපය/මනාප ලබාදීමේදී ද නීති සම්පාදනයට, මූල්‍ය පාලනයට සහ ප්‍රතිපත්ති සම්පාදනයට සුදුසුකම් ඇති සහ ඉහත පරිච්ඡේදයන්හි විස්තර කරන ලද නිර්ණායක අනුව තෝරාගත් අපේක්ෂකයා/අපේක්ෂකයන්ට මනාප ලකුණු කිරීමද ඡන්දදායක වගකීමකි.

## 4.5.මැතිවරණයෙන් පසු ඡන්දදායක භූමිකාව

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පමණක් ඡන්දදායක වගකීම් අවසන් නොවේ. තමන් ඡන්දය සහ මනාපය ලබාදුන් දේශපාලන පක්ෂ ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින් නිවැරදිව කටයුතු කරන්නේද යන්න පිළිබඳව විමසිලිමත් වීම සහ මැතිවරණ සමයේදී ලබාදුන් මැතිවරණ පොරොන්දු ඉටුකිරීම පිළිබඳව සොයා බැලීම සහ ඒ සඳහා පෙළඹවීම් සිදුකිරීමද ඡන්දදායක වගකීමකි. එය හුදකළාව හෝ සංවිධානාත්මකව සිදුකළ හැකිය.

විශේෂයෙන්ම ජනතා අපේක්ෂා පසෙකලා හා දේශපාලනය සිය පුද්ගලික ලාභ ප්‍රයෝජනය පිණිස යොදවන්නේ නම් එයට එරෙහි වීමද ඡන්දදායක වගකීමකි.

එසේම සිය ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ගිය මන්ත්‍රීවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ක්‍රියාකාරී වන්නේදැයි විමසිලිමත් විය යුතුය. ඔහු පාර්ලිමේන්තුවට පැමිණීම විවාද සඳහා දක්වා ඇති දායකත්වය, පාර්ලිමේන්තුවේ ජනතා ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටීම්, මහජනතාවගේ පෙත්සම් ඉදිරිපත් කිරීම්, මෙන්ම පාර්ලිමේන්තු කමිටු නියෝජනය පිළිබඳවද සොයාබැලීම අවධියෙන් සිටින ඡන්දදායකයෙකු විසින් සිදුකළ යුත්තකි.

## 4.5.1 හිමිකම් ඉල්ලීමේ හා විරෝධතා ඉදිරිපත් කිරීමේ නව ක්‍රමය

වාර්ෂිකව ඡන්ද හිමියන් සංගණනය සිදුකරන අවස්ථාවේදී, සංශෝධනය කරනු ලබන ලේඛනයට සිය නම ඇතුළත් කර ගැනීම සඳහා අවස්ථාව අහිමි වූ තැනැත්තකුට හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමටත්, සුදුසුකම් නොලැබූ තැනැත්තෙකු ඇතුළත් වී හෝ ඇතුළත් කිරීමට නියමිතව ඇත්නම් එම තැනැත්තාට විරුද්ධව විරෝධතා ඉදිරිපත් කිරීමටත් ප්‍රධාන ප්‍රඥප්තිය වන 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම පනතේ විධිවිධාන අනුව දින විසි අටක් (28) වෙන්කරදී ඇති අතර, පරිපූරක නාම ලැයිස්තුව මගින් ඡන්ද හිමි නාම ලේඛනයට ඒකාබද්ධ කිරීමට නියමිත අභිනව ඡන්ද හිමියෙකුට සිය නම ඇතුළත් කිරීම සඳහා අයැදුම් කිරීමට නොහැකි වන අවස්ථාවක හෝ සුදුසුකම් නොලැබූ තැනැත්තෙකු දැනටමත් එම නාම ලේඛනයට නම ඇතුළත් කිරීමට  කටයුතු කර ඇත්නම් එම තැනැත්තාට විරුද්ධව විරෝධතා ඉදිරිපත් කිරීමටද දින දහයක් (10) නීතියෙන් වෙන්කර ඇත.

හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සොයා බැලීම සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් සිය දිස්ත්‍රික්කවල හඳුනාගත් විවිධ ස්ථානවලදී එම නාම ලේඛන මහජන පරිශීලනය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන අතර, ඒ පිළිබඳව පුවත්පත් දැන්වීම් මගින් ප්‍රචාරය කරනු ලැබේ. තවද සෑම හිමිකම් හා විරෝධතා පිළිබඳව දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස් විසින් පවත්වනු ලබන පරීක්ෂණවලින් අනතුරුව අවසන් ලේඛන සකස් කරනු ලබන අතර, එම ලේඛන මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන දිනවලදී සහතික කරනු ලැබේ. 2024 සැප්තැම්බර් 21 වැනි දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ දී 2024 පෙබරවාරි පළවෙනිදා දක්වා සුදුසුකම් ලැබූ ඡන්ද හිමියන් සංඛ්‍යාව සහ පෙබරවාරි පළවෙනිදා සිට මැයි මස තිස් එක් වැනි දින දක්වා වූ කාලය තුළ වයස දහ අට සම්පූර්ණ කිරීම හේතුවෙන් සුදුසුකම් ලැබූ අභිනව ඡන්ද හිමියන්ද ඇතුළුව සමස්ත ඡන්ද හිමියන් මිලියන 17ක් පමණ සුදුසුකම් ලබා ඇත.

# 5.

## අපේ අපේක්ෂකයා?

මැතිවරණයක් පවත්වන්නේ අපේක්ෂකයන් අතරින් පිරිසක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස තෝරාපත් කර ගැනීම සඳහාය. එබැවින් මැතිවරණයකදී අපේක්ෂකයන් අනිවාර්ය පාර්ශවයකි. අපේක්ෂකයන්ගේ සුදුසුකම්, නුසුදුසුකම්, වගකීම් සහ අපේක්ෂකයකු තෝරා ගැනීමේදී ඡන්ද දායකයන් විසින් සැලකිය යුතු කරුණු මෙම පරිච්ඡේදයෙන් විස්තර වේ.

- **ජනාධිපතිවරණය**
- **පාර්ලිමේන්තු මැතිවරණය**
- **පළාත් පාලන ඡන්ද විමසීම**
- **පළාත් සභා ආයතන ඡන්ද විමසීම**

**අපේක්ෂකයකුගේ සුදුසුකම්**

- ශ්‍රී ලාංකික පුරවැසියකු වීම
- වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම

**අපේක්ෂකයකුගේ නුසුදුසුකම්**

- ශ්‍රී ලාංකික පුරවැසියෙක් නොවන තැනැත්තෙක් වීම
- වයස අවුරුදු 18 අඩු තැනැත්තෙක් වීම
- අධිකරණ නිලධරයකු වීම
- සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වීම
- පොලිස් නිලධරයකු වීම
- මාණ්ඩලික නිලධාරියෙකු වන රජයේ නිලධරයකු වීම
- යම් රාජ්‍ය සංස්ථාවක මාණ්ඩලික නිලධාරියකු
- ශ්‍රී ලංකාවේ වලංගු නීතියක් මගින් සිහිවිකල් පුද්ගලයෙකු බව තහවුරු වී තිබීම
- වස්තුභංගත්වයට පත් වූ තැනැත්තෙකු බව ඔප්පු වී තිබීම
- විදේශයක පුරවැසිභාවය ලබා ඇති පුද්ගලයෙකු වීම

ඉහත සඳහන් රාජ්‍ය නිළධාරීන් අතරින් දේශපාලන හිමිකම් නොමැති නිලධාරියකු මැතිවරණයකදී අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන්නේ නම් නාම යෝජනා භාරදීමට දින 7කට පෙර සේවයෙන් ඉල්ලා අස්වීම හෝ සේවයෙන් විශ්‍රාම ගැනීම කළ යුතුය. එසේම දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරියකු අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන්නේ නම් නාමයෝජනා භාරදීමට දින 10කට පෙර වැටුප් රහිත නිවාඩු ලබාගත යුතුය.

### අපේක්ෂකයකුගේ වගකීම්

මැතිවරණයක අපේක්ෂකත්වය යනු වගකීමකි. එය මැතිවරණ ජයග්‍රහණයකට පමණක් සීමා වන්නේ නැත. අපේක්ෂකයකුට පවතින මූලික නෛතික වගකීමක් වන්නේ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ සිය වත්කම් සහ බැරකම් මැතිවරණ කොමිසම වෙත ලබාදීමයි. පෙර තිබූ නීතිය අනුව නාමයෝජනා කාල සීමාව අවසන් දිනයේ සිට මාස තුනක් ඇතුළත ඉහත සඳහන් වත්කම් හා බැරකම් ප්‍රකාශය ලබාදිය යුතු බව සඳහන් වී ඇතත්, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80(1)(ප) වන

උප වගන්තිය  සමඟ කියවිය යුතු 89 වැනි වගන්තිය අනුව සෑම මැතිවරණයට / ඡන්ද විමසීමට තරඟ කරන සෑම අපේක්ෂකයෙකුම නාමයෝජනා භාරදෙන අවස්ථාවේදී අදාළ වත්කම් හා බැරකම් ආකෘතිය සහ වත්කම් බැරකම් ප්‍රකාශය පිළිබඳ ලුහුඬු සටහනක්ද භාරදිය යුතුය. එසේම මැතිවරණ නීතිරීතිවලට අනුකූල ලෙස ප්‍රචාරක කටයුතු පවත්වාගෙන යාමත් අපේක්ෂකයකුගේ වගකීමකි. රාජ්‍ය දේපළ භාවිත කරමින් තම ප්‍රචාරක කටයුතු සඳහා යොදා නොගැනීමද තවත් වගකීමකි. සියල්ල අවසානයේදී මැතිවරණය ජයග්‍රහණය කිරීමෙන් පසුව තම ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කිරීමත් තමන් පත් වූ මහජන සභාවට පැවරී ඇති වගකීම් ඉටුකිරීමට කටයුතු කිරීම මෙන්ම ඥාති සංග්‍රහ, මිත්‍ර සංග්‍රහ හෝ කල්ලිවාදවලින් තොරව කටයුතු කිරීමද වගකීමකි.

# 6.

## අපේක්ෂකයකු පිළිබඳ මාර්තු 12 නිර්ණායක

මැතිවරණයකදී මනාප ලබාදීම සඳහා අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා අපේක්ෂයන්ගේ සුදුසුකම් සහ නුසුදුසුකම් පිළිබඳ නිර්ණායක කිහිපයක් මාර්තු 12 ව්‍යාපාරය විසින් හඳුන්වා දී තිබේ. ඒ අනුව නාමයෝජනා ලබාදී තිබේද නැද්ද යන්න පිළිබඳවද ඔබට අපේක්ෂක ලැයිස්තු පරික්ෂා කිරීමෙන් තහවුරු කරගත හැකිය.

### මාර්තු 12 නිර්ණායකවලට අනුව යහපත් අපේක්ෂකයකුගේ ලක්ෂණ වන්නේ :-

- ❖ සමස්ථ ජන ප්‍රජාවට සංවේදී ගෝලීය දැක්මක් සහ දේශීය චින්තනයක් ඇති නීති හා ප්‍රතිපත්ති.
- ❖ සම්පාදනයට සහ මූල්‍ය කළමනාකරණයට හැකියාව ඇති ප්‍රායෝගික පුද්ගලයෙකු වීම.
- ❖ අපරාධ වරදක් සඳහා සිරදඬුවමකට ලක්වූ හෝ අත්හිටවූ සිරදඬුවම්වලට ලක්වූවෙකු නොවිය යුතුයි.
- ❖ අල්ලස් හෝ දූෂණ පිළිබඳ වරදකරුවෙකු නොවූ සමාජය පිළිගත් චරිතවත් අයෙකු විය යුතුයි. එමෙන්ම අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා ලැබූ අය ගැන පරික්ෂාකාරී විය යුතුයි.
- ❖ මද්‍යසාර, මත්ද්‍රව්‍ය , සුදු කැසිනෝ, ගණිකා මඩම් ඇතුළු රටේ යහ පැවැත්මට හානිකර ව්‍යාපාර පවත්වාගෙන යන හෝ අතීතයේ එසේ නොකළ අයෙකු වීම.
- ❖ ජීව ආධාරක ව්‍යුහය විනාශ කරන පාරිසරික වශයෙන් හානිදායක වන ව්‍යාපාරවල යෙදුණු හෝ යෙදෙන අයෙකු නොවීම.
- ❖ මහජන නියෝජිතයෙකු වන්නට පෙර රටට අගතිගාමී මූල්‍යමය ගිවිසුම් ඇතිකර ගත් සහ මහජන නියෝජිතයෙකුව සිටිමින් තම දේශපාලන බලය අයුතු ලෙස භාවිත කර රජය සමඟ මූල්‍යමය ගිවිසුම් ඇතිකර ගත් හෝ ගිවිසුමක පාර්ශ්වකරුවෙකු නොවන්නෙකු වීම.

### කාන්තා අපේක්ෂකයන්ගේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය 55% ක් වුවද පාර්ලිමේන්තුවේ සහ පළාත් සභාව තුළ කාන්තා නියෝජනය ඉතාමත් අවම මට්ටමක පවතී. එබැවින් පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය වර්ධනය කිරීමේ අවශ්‍යතාවක් පවතී. මේ සඳහා වඩාත් උචිත ක්‍රමය වන්නේ දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් විසින් සාධාරණ ප්‍රතිශතයක් කාන්තාවන් සිය නාමයෝජනා ලැයිස්තු තුළට ඇතුලත් කර ගැනීමයි. නමුත් අවසාන වශයෙන් කාන්තාවන් දිස්ත්‍රික් නාමයෝජනා ලැයිස්තු තුළ සිටින අපේක්ෂකයන් අපේක්ෂිකාවන් පාර්ලිමේන්තුවට පත් කර යැවීමේ අයිතිය සහ හැකියාව ඇත්තේ ඡන්දදායකයන්ටය.

### තරුණ සහභාගීත්වයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනයට අදාලට මහජන නියෝජිතයින්ගේ ප්‍රතිශතය ඉතාමත් අල්පය. තරුණ තරුණියන්ට දේශපාලන පක්ෂ මගින් සහ ස්වාධීන කණ්ඩායම් මගින් නාමයෝජනා ලැබීමේ අවස්ථාවන්ද ඉතාමත් අල්පය. කෙසේ නමුත් තරුණ නියෝජනය වර්ධනය කිරීම පිළිබඳව වගකීම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වලට මෙන්ම නාමයෝජනා ලැයිස්තුව තුළ සිටින තරුණ අපේක්ෂකයන්ට මනාපය ලබාදීම මගින් ඡන්දදායකයන්ටද සිදුකළ හැකි බව සිහිතබා ගැනීම වැදගත්ය.

## මැතිවරණයට ඉදිරිපත් වී ඇති අපේක්ෂකයින්ට ලකුණු දීම

ඡන්ද විමසීමේ දිනයේදී තමන් ඡන්දය දෙන්නේ කාටද යන්න පිළිබඳ සාධාරණ තීරණයකට එළඹීම සඳහා මාර්තු 12 ව්‍යාපාරය විසින් හඳුන්වාදී ඇති “ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු - ඡන්දය දීමට පෙර අපේක්ෂකයන්ට ලකුණු දෙමු” නැමැති ලකුණු සටහන අදාළ කරගත හැකිය. එයට අමතරව මෙම මැතිවරණය පාර්ලිමේන්තු මැතිවරණයක් බැවින් පාර්ලිමේන්තුවේ භූමිකාව වන නීති සම්පාදනය, රාජ්‍ය මූල්‍ය පාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනයට හැකියාවක් සහ කුසලතාවක් අදාල අපේක්ෂකයන් තුළ පවතින්නේදැයි සැලකිළිමත් වන්න.

**ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු, ඡන්දය දීමට පෙර අපේක්ෂකයන්ට ලකුණු දෙමු.**

| දේශපාලන පක්ෂය/ ස්වාධීන කණ්ඩායම | ඔබේ දිස්ත්‍රික්කයට තරඟ කරන අපේක්ෂකයන් | ජනතාවගේ අවශ්‍යතා පිළිබඳව සංවේදී පුද්ගලයෙකි | සාධාරණ ලෙස මුදල් වියදම්කෙනෙකි | බලය අයුතු ලෙස භාවිතා නොකරන්නෙකි | අල්ලස් හෝ දූෂණ චෝදනා නොලැබූ අයෙකි | රටේ නීති, ප්‍රතිපත්ති සම්පාදනයට දායකවීමට හැකි අයෙකි | සොබාදහමට හානි නොකරන්නෙකි | රට ගොඩනැඟීමට වැඩ පිළිවෙලක් ඇත්තෙකි | ජාති, ආගම් සංස්කෘතික වෙනස්කම් ඉවසන්නෙකි | ක්‍රියාශීලී සහ කාර්යක්ෂම අයෙකි | ජනතාවට අනුකම්පා දක්වන්නෙකි | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

එක් එක් ශීර්ෂය යටතේ අපේක්ෂකයෙකුට ලබාදිය හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 10කි.

එක් එක් අපේක්ෂකයාට අදාළ මුළු ලකුණු එකතුකර වඩාත් සුදුසු අපේක්ෂකයා තෝරා ගන්න

බුද්ධිමත්ව ඡන්දය භාවිතා කරමු. සුදුස්සන් පමණක් පාර්ලිමේන්තුවට තෝරා ගනිමු.

**මාර්තු 12 ව්‍යාපාරයේ පණිවුඩයකි**

**පෞද්ගලික ප්‍රයෝජනය සඳහා පමණි. සම්පූර්ණ කරන ලද පත්‍රිකා අන් සතු නොකරන්න.**

# 7.

# නිවැරදිව ඡන්දය දීම

ඡන්ද මධ්‍යස්ථානයක ක්‍රියාවලිය සහ එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් විස්තර කරනු ලබයි.

## 1. ඡන්දය විමසීමේ දිනය -

පාර්ලිමේන්තු මැතිවරණ දිනය පළමුව නිවේදනය කිරීමට බලය පවතින්නේ ජනාධිපතිවරයාටය. අදාළ දිනයේ ඡන්ද විමසීම් පැවැත්වීමට නොහැකි වන අවස්ථාවකදී වෙනත් දිනයක් නියම කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතුව පවතී. ජනාධිපතිවරණය, ජනමත විචාරණය, පළාත් සභා සහ පළාත් සභා පාලන ආයතන ඡන්ද විමසීම් සියල්ල සඳහා දින නියම කිරීමේ බලය ඇත්තේ මැතිවරණ කොමිෂන් සභාවටය. ඒ අනුව මෙවර ජනාධිපතිවරණයේ දිනය 2024 සැප්තැම්බර් මස 21 බව, 2024.07.26 වැනි දින මැතිවරණ කොමිෂන් සභාව තීන්දු කරන ලද්දේ ඒ නිසා ය.

## 2. ඡන්ද විමසීම පවත්වනු ලබන කාල සීමාව

- ❖ පාර්ලිමේන්තු මැතිවරණ පනත ඇතුළු සෑම මැතිවරණ සහ ඡන්ද විමසීම් පනතකම දක්වන්නේ ඡන්ද විමසීම් දිනයේ පෙරවරු 7 සහ පස්වරු 4 අතර කාලය තුල ඡන්ද විමසීම පැවැත්විය යුතු බවයි. එසේ වුවද පළාත් පාලන ඡන්ද විමසීම හැර සෙසු මැතිවරණ / ඡන්ද විමසීම්වලදී මැතිවරණ කොමිෂන් සභාවට ඡන්ද විමසීමේ කාලසීමාව ගැසට් පත්‍රයේ පළකිරීම මගින් වෙනස් කිරීමට බලතල පවතින බව එම පනත්වල සඳහන් වේ.

කෙසේ නමුත් උදෑසනම ඡන්දය භාවිතා කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථානය වෙත යාම වඩාත් සුදුසු වේ.

## 3. ඡන්ද පොලට රැගෙන යායුතු දෑ

ඡන්ද මධ්‍යස්ථානයට යන විට සෑම ඡන්ද දායකයකු විසින්ම රැගෙන යායුතු ලේඛණ 2ක් ඇත.

## 4. ඡන්දය ලබාදීම සඳහා පිළිගත් හැඳුනුම්පත්

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කර ඇති ජාතික හැඳුනුම්පත,

2. වලංගු විදේශ ගමනේ බලපත්‍රය,

3. වලංගු රියදුරු බලපත්‍රය.

4. විශ්‍රාමිකයන් සඳහා නිකුත් කර ඇති විශ්‍රාමික හැඳුනුම්පත

5. සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති වැඩිහිටි හැඳුනුම්පත,

6. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇති පූජ්‍ය හෝ පූජක හැඳුනුම්පත්

7.දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත්කර ඇති තාවකාලික හැඳුනුම්පත්

8. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ජාතික හැඳුනුම්පත් සඳහා කර ඇති අයදුම්කරුවන් වෙත තාවකාලිකව නිකුත් කරනු ලබන අදාල තැනැත්තාගේ ඡායාරූපය සහිත ලිපිය.

මේ හැර වෙනත් හැඳුනුම්පත් කිසිවක් ඡන්ද මධ්‍යස්ථානයේදී පිළිනොගන්නා බැවින් ඉහත 1 සිට 6 දක්වා වන හැඳුනුම්පතක් තමා සතුව නොමැති නම් සහ තිබෙන ඒවා අපැහැදිලි නම් අංක 7 හෝ 8 යටතේ විස්තර කර ඇති හැඳුනුම්පතක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.

ඉහත සඳහන් ලේඛන හැර කාර්යාල හැඳුනුම්පත් සහ ජාතික හැඳුනුම්පත් අයදුම්පත් ග්‍රාමනිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ඔහු විසින් නිකුත් කරනු ලබන ඡායාරූප සහිත ලදුපත් හැර කිසිම ලියැවිල්ලක් ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කරගැනීම සඳහා පිළිගනු නොලැබේ.

## 5. ඡන්ද මධ්‍යස්ථානයට ඡන්ද දායකයා ඇතුළු වූ විට සිදුවන ක්‍රියාවලිය

1. ඡන්දදායකයා නිල දැන්වීම් පත්‍රිකාව නිලධාරියාට ලබාදුන් පසු ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතෙහි සඳහන් පරිදි ඡන්ද දායකයාගේ නම සහ අංකය හඬනගා කියවීම.

2. හැඳුනුම්පත පරික්ෂා කර බලා ඡන්දදායකයාගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම.

3. ඡන්දපොල නියෝජිතයින්ගේ විරෝධතාවක් පවතින්නේ නම් මෙම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

4. ඡන්දදායකයාගේ අංකය ඡන්ද පත්‍රිකා පොතෙහි උප පත්‍රිකාවේ ලකුණු කර ඡන්ද පත්‍රිකාව කඩා ඉවත් කිරීම,

5. ඡන්ද පත්‍රිකාව නිල ලකුණින් තැබීම.

6. අදාළ ඡන්ද දායකයන්ට ඡන්ද පත්‍රිකාවක් නිකුත්කළ බව දැක්වීම පිණිස ඡන්ද නාම ලේඛනයේ ලකුණක් යෙදීම. (මෙහිදී ඡන්ද පත්‍රිකාවේ අංකය නොයෙදිය යුතුයි)

7. ඡන්ද දායකයන් සඳහා වම් සුළැඟිල්ලේ නොමැකිය හැකි තීන්ත ආලේප කිරීම.

8. ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයාට භාර දීම.

**<u>ඡන්ද පත්‍රිකාව අතට ලැබුණු පසු</u>**

i. පාර්ලිමේන්තු මැතිවරණයකදී නම් මුලින්ම තමන් කැමති දේශපාලන පක්ෂයට අදාල ලකුණ හෝ ස්වාධීන කණ්ඩායම් අංකය ඉදිරියේ ඇති කොටුව තුළ කතිර ලකුණ සලකුණු කරන්න.
ii. වක්‍ර හා සමාන සලකුණු ඡන්ද පත්‍රිකාව තුළ තිබිය හැකි බැවින් කතිර ලකුණ යෙදීමට පෙර හොඳින් පරික්ෂාකාරී වන්න.
iii. එක් ලකුණකට වඩා වැඩියෙන් ඡන්දය ලබාදෙන ඡන්ද පත්‍රිකාව අවලංගු වන බැවින් එක් ලකුණක් ඉදිරියේ පමණක් කතිරය සලකුණු කරන්න.
iv. දෙවනුව තමන් කැමති අපේක්ෂයාට අපේක්ෂකයන් දෙදෙනෙකුට හෝ අපේක්ෂකයන් තිදෙනෙකුට අදාළ අංක මත කතිර ලකුණ යොදන්න.

v. එසේම ජනාධිපතිවරණයකදී නම් සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ තිදෙනෙකුට වැඩි අපේක්ෂකයන් තරග කරන බැවින් තමා කැමති අපේක්ෂකයාගේ සලකුණු ඉදිරිපිට අංක '1' ඡන්දය ද, මනාප ලකුණු කිරීමට කැමති නම් පමණක් තවත් දෙදෙනෙකුට පිළිවලින් අංක '2' සහ අංක '3' යෙදීමෙන් ඡන්දය සහ මනාප ලකුණු කළ හැකිය.

vi. ඉන් පසුව පත්‍රිකාව නමා ඡන්ද පෙට්ටිය තුළට දමන්න.

## ඡන්දදායකයකුගේ අනන්‍යතාව පිළිබඳ විරෝධතා ඉදිරිපත් වූ විට ගත යුතු ක්‍රියා මාර්ග

ඡන්දදායකයෙකුගේ අනන්‍යතාව පිළිබඳව ඡන්දස්ථාන නියෝජිතයකු හෝ වෙනත් අයකු විරෝධතාවක් ඉදිරිපත් කරන විට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට මැතිවරණ කාර්යාලය විසින් පනතේ විධිවිධාන අනුව ලබා දී ඇති මුද්‍රිත ප්‍රකාශ අතරින් එම විරෝධතාවේ ස්වභාවය අනුව අවස්ථාවෝචිතව ගැළපෙන ප්‍රකාශයක් ලබා දී ඡන්දදායකයාට එම ප්‍රකාශයට අත්සන් කරන ලෙසත්, අත්සන් නොකළේ නම් නීතිය අනුව තමාට ඡන්ද පත්‍රිකාවක් ඔහුට ලබාදිය නොහැකි බවත් දැන්විය හැකිය.

මේ ප්‍රකාශ අතරින් ඡන්ද දායකයා ඡන්දය පාවිච්චි කිරීම සඳහා නුසුදුසු පුද්ගලයෙක් බව හෝ ඔහුගේ නම ඡන්ද හිමි නාම ලේඛනයේ වැරදි ආකාරයට සඳහන් කර ඇති බවට හෝ ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය ඡන්ද හිමි නාම ලේඛනයේ හැඳුනුම්පත් අංකය සමඟ ගැළපෙන්නේ නැති බව හෝ ඡන්ද හිමි නාම ලේඛනයේ ඡන්දදායකයාගේ ස්ත්‍රී පුරුෂ භාවය වැරදි ආකාරයට සටහන් වී ඇති බව හෝ වෙනත් ඡන්ද මධ්‍යස්ථානයක ඡන්දය පාවිච්චි කර ඇති බව හෝ විදේශ ගතවී සිටින තැනැත්තකු වෙනුවෙන් ව්‍යාජ ව පෙනී සිටින කෙනෙකු බව හෝ විවිධ විරෝධතා මතුවුවද මෙම ප්‍රකාශ වර්ග අතරින් වඩාත්ම ගැලපෙන ප්‍රකාශය තෝරා ගෙන ඉහත සඳහන් ආකාරයට අත්සන් කරන ලෙස ඡන්ද දායකයාට නියෝග කළ හැකිය. ඔහු එම ප්‍රකාශයට අත්සන් කිරීමට අකමැත්තක් දක්වන්නේ නම් ඔහුට ඡන්ද පත්‍රිකාවක් ලබා නො දිය යුතු අතර, අත්සන් කිරීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකාවක් ලබාදී ඡන්දය භාවිතා කිරීමෙන් පසුවද විරෝධතා ඉතා දරුණු ආකාරයට ඉදිරිපත් වෙන්නේ නම් එම ඡන්දදායකයා සැක සහිත ඡන්දදායකයෙකු බව පවසා පොලිස් නිලධාරීන් වෙත භාර දිය යුතුය.

## අතිරේක කරුණු

අන්ධභාවය හෝ යම් ශාරීරික ආබාධයක් නිසා ඡන්දය දීමට අපොහොසත් වන අයෙකුට 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මඟින් විධිවිධාන සලසා ඇති පරිදි තමන් සමඟ තවත් එක්කෙනෙක්ව කැටුව යා හැකි අතර, සිය වසමේ ග්‍රාම නිලධාරි හා වෛද්‍යවරයෙකුගේ නිර්දේශ සඳහන් මැතිවරණ කොමිෂන් සභාව විසින් ග්‍රාම නිලධාරීන් වෙත නිකුත් කර ඇති සම්පූර්ණ කරන ලද ආකෘතිය සමඟ ඡන්දපොලට ගොස් අදාල ඡන්දදායකයා කැටුව යන තැනැත්තා මගින් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ඉදිරියේ ඡන්දය හා කැමති නම් මනාප ද සලකුණු කළ හැකිය. මෙසේ ග්‍රාම නිලධාරියාගේ සහ වෛද්‍යවරයාගේ නිර්දේශ ඇතුළත් සහතිකය රැගෙන නොගිය අයකුට හෝ තමන් සමග වෙනත් තැනැත්තකු කැටුව යා නොහැකි වන ආබාධිතයෙකුට ඡන්දය නැති වර්ණ පනත්වලදී කලින් තිබූ ආකාරයට සිය කාර්ය මණ්ඩලයේ සහායකයෙකු සාක්ෂියට තබාගෙන, ජ්‍යෙෂ්ඨ ඡන්දස්ථානාධිපතිවරයා විසින් ලකුණු කර දීම සඳහා වූ බලය මැතිවරණ කොමිෂන් සභාව විසින් තරඟ කරන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සමඟ සාකච්ඡා කර ලබා ගනු ලබන බැවින් ජ්‍යෙෂ්ඨ ඡන්දස්ථානාධිපතිවරයා ලවා ද ලකුණු කළ හැකිය. ඡන්දය භාවිතා කිරීමේදී අනවධානය නිසා වැරදීමක් වුව හොත් එය ස්ථානාධිපතිවරයාට ඉදිරිපත්කර ඔහු සෑහීමකට පත් වුවහොත් නව ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලැබේ.

# 8.

# අපිත් එක්ක එකතු වෙමුද

## 8.1. පැෆ්රල් සංවිධානය

පැෆ්රල් 1987 දී ආරම්භ කරන ලද්දේ ජාතික මට්ටමේ සිවිල් සමාජ සංවිධාන කිහිපයක නියෝජිතයන් විසිනි. එය සමාගම් පනත යටතේ ලාභ නොලබන සංවිධානයක් ලෙස ලියාපදිංචි කර ඇත. පැෆ්රල් පිහිටුවන ලද්දේ ප්‍රචණ්ඩත්වය සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ හේතුවෙන් තරගයේ සම අවස්ථාවට බලපෑම් එල්ල වන බැවින් මැතිවරණවල ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය සහතික කිරීම සඳහා සිවිල් සමාජයට මැදිහත් වීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති අවස්ථාවක ය. පැෆ්රල් පිහිටුවීමේ එක් ප්‍රධාන අරමුණක් වූයේ මැතිවරණයට පෙර, පසුව සහ පසුව ප්‍රචණ්ඩත්වය සහ අක්‍රමිකතා වැළැක්වීම සඳහා ජනතාවගේ උත්සාහය ප්‍රවර්ධනය කිරීමයි. පැෆ්රල් පිහිටුවීමෙන් පසු රටේ පැවැත්වෙන සියළුම මැතිවරණ සිවිල් සමාජ සංවිධාන විශාල සංඛ්‍යාවක් සමඟ සහයෝගයෙන් නිරීක්ෂණය කර ඇත. එය වසර ගණනාවක් පුරා රටේ විවිධ ප්‍රදේශවල ඡන්ද දායකයින්ගේ අයිතිවාසිකම්. ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ යහපාලනය වැනි ක්ෂේත්‍රවල උපදේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. පැෆ්රල් සිය සියලු ක්‍රියාකාරකම්වලදී පූර්ණ මධ්‍යස්ථභාවය පවත්වා ගෙන යයි.

## 8.2. දැක්ම

දේශපාලනික සාක්ෂරතාවයෙන් යුත් සහ බලගතු පුරවැසියෙකු සමඟ ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම අගය කරන සහ පාලනයේ වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ප්‍රජාතන්ත්‍රවාදී ජාතියක් පෝෂණය කිරීම.

## 8.9. මෙහෙවර

හෘද සාක්ෂියට එකඟව පුරවැසියෙකුගේ ක්‍රියාකාරී සහභාගීත්වය තුළින් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීම සහ සියලු නිදහස් හා සාධාරණ මැතිවරණ ප්‍රවර්ධනය කිරීම හා සහතික කිරීම සහ යහපාලනය ආරක්ෂා කිරීම සඳහා උපකාරී වන ගතික සිවිල් සමාජයක්.

## 8.4. පැෆ්රල් සංවිධානයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

පැෆ්රල් සංවිධානයේ සිවිල් ක්‍රියාකාරකම් අතර පහත සඳහන් කටයුතු ඉතා ප්‍රමුඛ වේ. එනම්,

- මැතිවරණ නිරීක්ෂණය
- ඡන්දදායකයන් දැනුවත් කිරීම
- ඡන්ද නාම ලේඛණ ප්‍රතිශෝධන ක්‍රියාවලිය පහසුකරණය
- මාර්තු 12 ව්‍යාපාරය හා සම්බන්ධ දිස්ත්‍රික් දැනුවත් කිරීම
- මාර්තු 12 ව්‍යාපාරයට අනුයුක්ත පාර්ලිමේන්තු සංසදය හා සබැදි ක්‍රියාකාරකම්

## 8.5. පැෆ්රල් සංවිධානය සමග ඔබට සම්බන්ධවිය හැකි ආකාරය

- දිගු කාලීන මැතිවරණ නිරීක්ෂකයකු ලෙස
- ජංගම මැතිවරණ නිරීක්ෂකයකු ලෙස
- මැතිවරණ නිරීක්ෂණ කාර්යය මණ්ඩල සාමාජිකයකු ලෙස
- දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණයෙන්

## ඇමුණුම 1

<u>මැතිවරණයට අදාල වැදගත් නඩු</u>

| නඩු අංක | පෙත්සම්කරු - වගඋත්තරකරු | නඩුනිමිත්ත |
|---|---|---|
| SC/FR/509/98. | වරුණ කරුණාතිලක එ. මැ.කො | පළාත් සභා කීපයක ඡන්ද විමසීම් අවලංගු කිරීම වැරදි බව |
| CA/1164/98. | ඩිලාන් පෙරේරා එ. රාජිත සේනාරත්න | රජය සමඟ ගිවිසුමකට එළඹුණු මන්ත්‍රී ධූරයට පත්වීම වැරදි බව |
| SC/FR/ 412/1999 | මැදිවක (එගොඩවෙල) එ. මැ.කො | 1998 පළාත් සභා ඡන්ද විමසීමේදී මහනුවර දිස්ත්‍රික්කයේ ඡන්දය අවලංගු කිරීම |
| SC/640/2000 | අර්ජුන පරාක්‍රම එ. මැ.කො. | 2000 වර්ෂයේ පාර්ලිමේන්තු මැතිවරණයේ මහනුවර දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන කීපයක ඡන්දය අවලංගු නොකිරීම |
| SC/26/2002 (CA/487/99) | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එ. මැ.කො | පළාත් සභා මන්ත්‍රී පුරප්පාඩුවට නාමයෝජනා පත්‍රයේ නම සඳහන් තැනැත්තෙක්වම පත් කළ යුතු බව |
| SC/FR/20/2002 | නවනීදන් සෝදිලිංගම් එ. මැ.කො | මුදා නොගත් ප්‍රදේශවලින් ඡන්ද හිමියන් පොකුරු ඡන්ද මධ්‍යස්ථාන වලට පැමිණීමට ඉඩ නොදීම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් බව |
| SC/FR/278/2005 | ඕමල්පේ සෝභිත හිමි එ. මැ.කො | චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනියගේ දෙවන නිල කාලය තීරණය කිරීම |
| SC/FR/ 243, 244 සහ 245 | ජයන්ත විජේසේකර ඇතුළු අය | උතුරු නැගෙනහිර පළාත් ඒකාබද්ධ වැරදි බව |
| CA/Writ/176/2006 සහ CA/Writ/ 356/2008 | පැෆ්රල් සංවිධානය එ. මැ.කො | ජාතික හැඳුනුම්පත වෙනුවට විකල්ප ලේඛනවලට ඉඩදීම |
| SC/FR/352/ 2007 | සුගතපාල මෙන්ඩිස් එ. චන්ද්‍රිකා කුමාරතුංග | වෝටර්ස් එජ් නඩුව |

| | | |
|---|---|---|
| SC/FR/35/2016 | මොහමඩ් හුසයින් එ. මැ.කො | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පවත්වන ලෙස නියෝග කිරීම |
| SC/FR/351/2018 සිට SC/FR/ 365/2018 දක්වා | විවිධ අය | පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සඳහා සම්පූර්ණ කළ යුතු අවම කාලයට පෙර විසුරුවා හැරීම වැරදි බව |

## ඇමුණුම අංක 2

**<u>පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් සඳහා යොදාගත හැකි මාතෘකා කීපයක්</u>**

1. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මැතිවරණ /ඡන්ද විමසීම් වර්ග
2. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මැතිවරණ/ ඡන්ද විමසීම් නීති
3. ශ්‍රී ලංකාවේ මැතිවරණ/ ඡන්ද විමසීම් කැඳවීමේ බලය
4. මැතිවරණ/ ඡන්ද විමසීම් නාමයෝජනා කාලසීමාව
5. මැතිවරණ/ ඡන්ද විමසීම් වල ඇප තැන්පත් කිරීම
6. මැතිවරණ/ ඡන්ද විමසීම් දින තීරණය කිරීම
7. වලංගු ඡන්ද හිමි නාම ලේඛනය හා දේශපාලන පක්ෂ
8. ඡන්ද හිමියා සහ ඡන්ද දායකයා
9. තැපැල් ඡන්ද ක්‍රියාවලිය
10. ඡන්ද මධ්‍යස්ථානයේ සැකසුම
11. ඡන්ද මධ්‍යස්ථානයේ නිලධාරීන්
12. තරග කරන පක්ෂ හා කණ්ඩායම් විසින් පත්කරනු ලබන නියෝජිත වර්ග හා සංඛ්‍යා
13. ඡන්ද මධ්‍යස්ථානයකදී පිළිගනු ලබන වලංගු  අනන්‍යතා ලේඛන
14. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා, ඡන්ද පත්‍රිකා හා ද්විත්ව ඡන්ද පත්‍රිකා
15. ඡන්දදායකයා පරීක්ෂා කිරීම සහ උචිත ලකුණෙන් සලකුණු කිරීම
16. ඡන්දදායකයකුගේ අනන්‍යතාව පිළිබඳ විරෝධතා ඉදිරිපත් කරන විට තීරණ ගැනීම
17. ඡන්ද විමසීම් ආරම්භයේදී සහ අවසානයේදී ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීම
18. ගණන් කිරීම සඳහා ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්ට අවශ්‍ය දෑ
19. මැතිවරණ වැරදි, නීති විරෝධී ක්‍රියා සහ දූෂණ ක්‍රියා
20. මැතිවරණ පෙත්සම් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය

## ප්‍රජා අධ්‍යාපනය

# 1. හැඳින්වීම

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාමාර්ගය (පැෆ්රල්) විසින්, විදේශීය සහයෝගීතාවයේ සහාය ඇතිව පවත්වන දැනුවත් කිරීමේ වැඩසටහන් ඔස්සේ, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය දිරිමත් කිරීම තුළින් තරුණ තරුණියන්ගේ ධාරිතාව ඉහළ නැංවීමට සෑම විටම උත්සාහ කරයි. තරුණ ඡන්දදායකයින් අතර තාර්කික සහ පරිණත දේශපාලන කටයුතු ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකාව තුළ හෘද සාක්ෂියට එකඟ පුරවැසි ඡන්ද පදනමක් වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතිය මගින් තරුණයින් තම සමාජ-දේශපාලන අභිලාෂයන් ප්‍රකාශ කිරීමට සහ නිර්මාණාත්මක සහ වෛෂයික ප්‍රවේශයන් උපයෝගී කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට ක්‍රියාකාරීව සහභාගී වීමට පෙළඹවීමට උත්සාහ කරයි.

මෙම ව්‍යාපෘතිය දැනට පවතින සම්පත් වලින් සැලසුම් කර විස්තීර්ණ පුහුණු අත්පොතක් සහ මෙවලම් කට්ටලයක් සංවර්ධනය කිරීමට උපකාරී වනු ඇත. පුහුණුකරුවන්ගේ පුහුණු වැඩසටහන් සහ ඡන්දදායක අධ්‍යාපන මුලපිරීම් ඔස්සේ, විවිධ පසුබිම්වල සහභාගිවන්නන් ප්‍රජා අයිතිවාසිකම්, වගකීම් සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් පිළිබඳ දැනුමෙන් සන්නද්ධ වනු ඇත. මෙම අත්පොත සහ මෙවලම් කට්ටලය පැෆ්රල් පුහුණුකරුවන්ට තරුණයින් සඳහා පුහුණු සැසි පැවැත්වීම, ඔවුන්ගේ දේශපාලන සාක්ෂරතාව, ප්‍රජා අයිතිවාසිකම් සහ වගකීම් වැඩිදියුණු කිරීම මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහා මූලික මාර්ගෝපදේශය වනු ඇත. මැතිවරණ ක්‍රමය පිළිබඳ විශේෂඥ ප්‍රමුඛ සැසිවාර සහ දැනුවත් ඡන්දය ඔවුන්ගේ අවබෝධය තවදුරටත් වර්ධනය කරනු ඇත.

මෙම පුහුණුව ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික් මට්ටමේ තරුණ තරුණියන් සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ඇති අතර ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් එකට නැගී සිටීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ සිවිල් රාජකාරි වෙනුවෙන් පෙනී සිටීමට ඔවුන් දිරිමත් කරනු ඇත. එම බලමුළු ගැන්වූ තරුණ සාමාජිකයින් දැනුමෙන් සහ අවශ්‍ය සක්‍රීය සහභාගීත්වයෙන් මෙම රටේ අනාගතය වෙනස් කිරීමේ නියෝජිතයන් වනු ඇත.

ජාතික තරුණ සභා, ගුරු අභ්‍යාස විද්‍යාල සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය, ජර්මානු තාක්ෂණ ආයතනය, කොරියානු තාක්ෂණ ආයතනය, හාඩි උසස් තාක්ෂණ ආයතනය ඇතුළු ඇතුළු වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සමඟ එක්ව දීප ව්‍යාප්තව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන අතර සිසුන්ගේ ඉල්ලීම මත පාසල් පාර්ලිමේන්තු හරහා සම්බන්ධ වූ 12 සහ 13 ශ්‍රේණිවල පාසල් සිසුන් ද ඇතුළත් වේ. තවද මෙම අත්පොත සහ මෙවලම් කට්ටලය දිස්ත්‍රික් මට්ටමේ සිවිල් සමාජ කණ්ඩායම් වෙත යොමු කරමින් එම කණ්ඩායම් ද බලමුළු ගැන්වේ.

## 2. අරමුණු

1. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සහභාගීත්වය අනුව තරුණයින්ට සහ සාමාන්‍ය ජනතාවට ඡන්දදායකයින්ගේ හැසිරීමේ වැදගත්කම පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම.
2. මැතිවරණ දේශපාලනය තුළින් සිවිල් සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදය බලමුළු ගැන්වීමේ ක්‍රියාවලියේදී ක්‍රියාකාරී පුරවැසිභාවයේ කාර්යභාරය අවධාරණය කිරීම.
3. විවිධ සමාජ-සංස්කෘතික සන්දර්භය තුළ ප්‍රායෝගික ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය මත පදනම්ව තරුණ නායකත්වය සඳහා පොදු හරිත වේදිකාවක් සැපයීම.
4. ශ්‍රී ලංකාවේ වෙනස් වන දේශපාලන ප්‍රතිපත්ති සහ සංවර්ධන ව්‍යාපෘති අනුව තරුණයන්ගේ දේශපාලන සාක්ෂරතාව පිළිබඳ විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීම.
5. විශේෂයෙන් මැතිවරණ කාලසීමාව තුළ මාධ්‍ය සහ තොරතුරු තාක්ෂණය භාවිතය සහ ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය අතර සහසම්බන්ධතාවයේ වැදගත්කම හඳුනා ගැනීම.
6. දේශපාලන සහභාගීත්වය තුළ පුළුල් ඇතුළත් ප්‍රතිපත්තියක් සහ භාවිතයක් ඇති කිරීම සඳහා සමාජයේ සියලුම කාණ්ඩ ඇතුළත් ඡන්දදායකයින්ට අධ්‍යාපනය ලබා දීම.
7. ඡන්දදායකයින්ගේ අධ්‍යාපනයේ කොටසක් ලෙස මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අල්ලස, දූෂණය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටළු පිළිබඳව තරුණයින් බලමුළු ගැන්වීම.

## 3. පුහුණුවේ අපේක්ෂිත ප්‍රතිඵලය

1. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සහභාගීත්වය අනුව තරුණයින්ට සහ සාමාන්‍ය ජනතාවට ඡන්දදායකයින්ගේ හැසිරීමේ වැදගත්කම පිළිබඳ මූලික දැනුවත්භාවයක් ලැබීම.
2. මැතිවරණ දේශපාලනය හරහා සිවිල් සමාජය තුළ ප්‍රජාතන්ත්‍රවාදය බලමුළු ගැන්වීමේ ක්‍රියාවලියේදී ක්‍රියාකාරී පුරවැසිභාවයේ කාර්යභාරය හඳුනා ගැනීම.
3. ඡන්දදායකයින්ගේ දැනුම මත දේශපාලන සහභාගීත්වය තුළින් හරිත නායකත්වය සහ පෞරුෂය වර්ධනය කිරීම.
4. ශ්‍රී ලංකාවේ වෙනස් වන දේශපාලන ප්‍රතිපත්ති සහ සංවර්ධන ව්‍යාපෘති අනුව තරුණයන්ගේ දේශපාලන සාක්ෂරතාව පිළිබඳ විවේචනාත්මක දැනුමක් ලබා ගැනීමට හැකි වීම.
5. විශේෂයෙන් මැතිවරණ කාලසීමාව තුළ මාධ්‍ය සහ තොරතුරු තාක්ෂණය භාවිතය සහ ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය අතර සහසම්බන්ධතාවයේ වැදගත්කම අවබෝධ කර ගැනීම.
6. දේශපාලන සහභාගීත්වය තුළ පුළුල් ඇතුළත් ප්‍රතිපත්තියක් සහ භාවිතයක් ඇති කිරීම සඳහා සමාජයේ සියලුම කාණ්ඩ ඇතුළත් ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම.
7. ඡන්දදායකයින්ගේ අධ්‍යාපනයේ කොටසක් ලෙස මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අල්ලස, දූෂණය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලු අවබෝධ කර ගැනීමට හැකි වීම.

## 4. ඡන්ද දායකයින්ගේ අධ්‍යාපන පුහුණුවේ අන්තර්ගතය

මෙම පුහුණුවේ තේමාත්මක සහ සංකල්පීය අංශයන් සමාජ-දේශපාලන සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවන් නියෝජනය කරන මායිම් සහ පුළුල් අවධානයක් ඇතුළත් පහත අන්තර්ගතයන් සමඟින් නිර්මාණය කර ඇත.

### 4.1 ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත්කම

"ප්‍රජාතන්ත්‍රවාදය" යන යෙදුමේ මූලාරම්භය පැමිණෙන්නේ මිනිසුන් සහ අධිකාරිය විස්තර කරන "ඩිමෝස්" සහ "ක්‍රැටෝස්" යන ග්‍රීක වචන වලිනි. මිනිසුන් විසින් පාලනය කිරීම, ජනතාවගේ උත්තරීතර අධිකාරිය තුළ පවතින ආණ්ඩු ක්‍රමය, ජනතාවගේ කැමැත්ත ඇතිව ක්‍රියාත්මක වන රජය වැනි බොහෝ නිර්වචන සමඟ එය අර්ථ දක්වා ඇත. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදය පවතින්නේ ජනතාව නියෝජිතයන් තෝරා පත් කර ගන්නා තැන්වල ය. රජය සමන්විත වන්නේ තේරී පත් වූ නියෝජිතයන්ගෙන් වන අතර ඔවුන් පුරවැසියන්ට වගකිව යුතුය. වගවීම පිළිබඳ පරීක්ෂණය සමත් වූ නියෝජිතයින් ඡන්දදායකයින් විසින් තෝරාපත් කරගනු ලබන අතර අසමත් වන නියෝජිතයින් ප්‍රතික්ෂේප කරනු ලැබේ (ඉන්දියාවේ මැතිවරණ කොමිසම, 2016).

M. Print සහ D. Lange (2013) ප්‍රජාතන්ත්‍රවාදයේ යුරෝපීය සිවිල් නියැලීම සම්බන්ධයෙන් පැහැදිලි කරන ආකාරයට, ප්‍රජාතන්ත්‍රවාදය යන්න පුරවැසියන්ගේ සහභාගීත්වයෙන් තොරව ප්‍රජාතන්ත්‍රවාදය යන නමට සුදුසු නොවේ. ඊට අමතරව, ප්‍රජාතන්ත්‍රවාදය සමෘද්ධිමත් වීමට නෛතික අයිතිවාසිකම් සහ ආයතන පමණක් ප්‍රමාණවත් නොවේ (Honohan, 2002). තවද, ප්‍රජාතන්ත්‍රවාදයේ සහභාගීත්වය ඉතිහාසය පුරාම එහි අවධානය වෙනස් කරයි. 1950 ගණන්වල දී පුරවැසියන්ගේ කුසලතා සහ නිපුණතා ඉහළ නැංවීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු විය. 1960 දශකයේ මුල් භාගයේ දී අවධානය යොමු වූයේ දේශපාලනඥයන් සහ දේශපාලන පක්ෂවල ප්‍රචාරක කටයුතු සහ පුරවැසියන් සහ රාජ්‍ය නිලධාරීන් අතර සම්බන්ධතා සම්බන්ධ ක්‍රියාකාරකම් කෙරෙහි ය. 1970 ගණන්වල එය ප්‍රජා කණ්ඩායම්වල වැදගත්කම සහ නිලධාරීන්, දේශපාලනඥයන් සහ පුරවැසියන් අතර සෘජු සම්බන්ධතා පිළිබඳව විය. තවද, දේශපාලන සහභාගීත්වය පිළිබඳ අදහස අභියෝගයට ලක් වූ අතර, සියලුම බිම් මට්ටමේ කණ්ඩායම් සහ සමාජ ව්‍යාපාරවල විරෝධතා සහ ප්‍රතික්ෂේප කිරීම් වල අවශ්‍යතාවයද සහභාගීත්වයේ වැදගත් අංශයන් ලෙස ඇතුළත් විය. 1990 ගණන් වලදී ස්වේච්ඡා සේවය ඇතුළු ප්‍රජා ක්‍රියා සහ සිවිල් ක්‍රියාකාරකම් සඳහා වර්ධනය වන අවශ්‍යතාවය ප්‍රමුඛ විය. එමෙන්ම මෑතකාලීන අවධානය යොමුවී තිබුණේ, පුද්ගලීකරණය කළ, ආචාර ධාර්මික හෝ සදාචාරය සම්බන්ධයෙන් පදනම්වූ විවිධ මාධ්‍යවල නිරායාස චලන, ග්‍රාමීය වගා සහ දේශපාලන පරිභෝජනයන් වැනි සහභාගීත්ව ක්‍රියාකාරකම් පිළිබඳවයි. කෙසේ වෙතත්, ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වයේ වැදගත් ආකාරයක් ලෙස “ඡන්දය” තවමත් පවතී.

## 4.2 ක්‍රියාශීලී පුරවැසියෙක් යනු කවුරුන් ද?

යුරෝපීය කවුන්සිලය ක්‍රියාකාරී පුරවැසිභාවය යනු මිනිසුන්ගේ බලය ලෙස අර්ථ දක්වයි. “සමාජය තුළ තම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ වගකීම් ප්‍රයෝජනයට ගනිමින් ආරක්ෂා කිරීම, විවිධත්වයට අගය දැක්වීම, සහ ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතයට සක්‍රීය ලෙස සහභාගී වීම සඳහා, පුරවැසියන්ට විශේෂ සුදුසුකම් නොමැතිව ඔවුන්ගේ මහත් අභිලාෂී කාර්යයන් ඉටු කළ නොහැක. එම සුදුසුකම් යනු, ඔවුන්ට සක්‍රීය පුරවැසියන් බවට පත් වීමට හැකියාව සලසන "දැනුම, කුසලතා, ආකල්ප සහ අගයන්ගේ" එකතුවක් වශයෙන් හඳුන්වයි.” (Hoskins, Barber, Nijlen et al., 2011, p. 84). Putnam (1993, 2000), Almond and Verba (1963) සහ De Tocqueville (1863) ට අනුව ප්‍රජාතන්ත්‍රවාදයට ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතය පිළිබඳ පරික්ෂා කර බැලීම් සහ තුලනයන් පවත්වා ගැනීමට ක්‍රියාකාරී පුරවැසියන් අවශ්‍ය වේ.

මිනිසුන් අතර ක්‍රියාකාරී පුරවැසිභාවය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය තුළ යුරෝපීය කවුන්සිලය අවධාරණය කරනුයේ, ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසිභාවය සමඟ අධ්‍යාපනය ද සංවර්ධනය කිරීමේ අත්‍යවශ්‍යතාවයයි. ඔවුන්ගේ අදහස් අනුව, ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසිභාවය සඳහා වන අධ්‍යාපනයේ අරමුණ වන්නේ, ඉගෙනුම්කරුවන්ට දැනුම, කුසලතා හා අවබෝධය ලබා දීමත්, ඔවුන්ගේ ප්‍රවණතා හා හැසිරීම් සංවර්ධනය කිරීමත් හරහා, සමාජය තුළ ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ වගකීම් ක්‍රියාත්මක කිරීමට සහ ආරක්ෂා කිරීමට ඔවුන් බලමුළු ගැන්වීමට සහ ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම අරමුණු කරගනිමින් විවිධත්වය අගය කිරීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් ඉටු කිරීමට පුරවැසියා ශක්තිමත් කිරීමයි (Print & Lange, 2013).

විචිත්‍රවත් ප්‍රජාතන්ත්‍රවාදී රටවලට දේශපාලන පද්ධති නිරීක්ෂණය කිරීමට සහ වෙනස්කම් ඇති කිරීමට සහ ප්‍රතිරෝධය දැක්වීමට ක්‍රියාකාරී පුරවැසියන් අවශ්‍ය වේ (Crick, 2003). සමාජ සාධාරණත්වය ගොඩනැගීම සඳහා සමාජ ව්‍යාපාර, පෙත්සම් සහ විරෝධතා හරහා ජනතාව බලමුළු ගැන්වීමට ක්‍රියාකාරී පුරවැසියන්ට හැකි විය යුතුය. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නා ජනතාව සමඟ මෙම කටයුතු දිගටම සිදුවේ. අනෙක් අතට, ඡන්දය ප්‍රකාශ කිරීම, මැතිවරණ අපේක්ෂකයන් ලෙස නියෝජනය කිරීම සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ සන්නිවේදනය වැනි නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා ද ප්‍රජාතන්ත්‍රවාදයේ අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වේ. මේ අනුව, ක්‍රියාකාරී පුරවැසිභාවය යන පදය සහභාගීත්ව සහ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය යන ද්විත්වය සමඟම සම්බන්ධ වේ.

Putnam (2000) ට අනුව ක්‍රියාකාරී පුරවැසිභාවය පිරිහෙමින් පවතී. ප්‍රජාතන්ත්‍රවාදය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා තම යුතුකම් ඉටු කිරීමට තවදුරටත් සූදානම් නැති තරුණ පරම්පරාවන්

අතර අඩු සහභාගීත්වයක් වාර්තා වේ. Dalton (2009) පැහැදිලි කරන පරිදි මැතිවරණ වලදී ඡන්දය ප්‍රකාශ කිරීම, වෘත්තීය සමිති සහ දේශපාලන පක්ෂවලට සහභාගීවීම වැනි ක්‍රියාකාරකම් ස්වේච්ඡා සේවා, විරෝධතා වැනි ක්‍රියාකාරකම් වෙත මාරුවෙමින් ඇති අතර, වැඩිහිටි පරම්පරාවන් වලට වඩා තරුණයින්ගේ සම්මතයන් වෙනස් වෙමින් පවතී. තවමත් ප්‍රතිපත්තිමය තීරණ සම්ප්‍රදායික දේශපාලන ක්‍රමවේදය තුළම ගන්නා අතර, තරුණ පරම්පරාව තවදුරටත් සම්ප්‍රදායික දේශපාලනයෙන් ඈත් වෙමින් පවතී. මේ අනුව, තරුණයින්ගේ සහභාගීත්වය සහ බලපෑම නොමැතිකම හේතුවෙන් දේශපාලනඥයන් ද තරුණ අවශ්‍යතා නොසළකා හැරීමට නැඹුරු වේ (Wattenberg, 2012). රැකියා, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා යනාදිය සම්බන්ධයෙන් තරුණ පරම්පරාවන්ට ඇති අවස්ථා අඩුවීමට ද මෙම පහත වැටීම හේතු වී ඇත (Willets, 2010). මේ අනුව, තරුණ පරපුරේ සක්‍රිය සහභාගීතාව අත්‍යවශ්‍ය වන අතර, එම ප්‍රතිලාභ සහ අවස්ථා ලබා ගැනීමට ඔවුන්ගේ දේශපාලනික ඥානය වර්ධනය කිරීමද මහත් වැදගත්ය. එසේ නොවීමෙන්, ඔවුන් දේශපාලනික වශයෙන් පරාරෝපණය වී දුක් විඳීමට පත් විය හැකි ය (Print & Lange, 2013).

## 4.3 හරිත නායකත්වය

ජාත්‍යන්තර ආයතන අධ්‍යයනයේදී නායකත්වය යන සංකල්පය 1980 දශකයේ අගභාගයේ සහ 1990 දශකයේ මුල් භාගයේදී හඳුන්වා දී තිබෙන අතර, ගෝලීය පාරිසරික දේශපාලනයේ නායකත්වය පිළිබඳව කරන ලද බොහෝ පර්යේෂණය යටතේ මෙම සංකල්පය අධ්‍යයනය කර ඇත. 1991 වසරේ Oran Young පැහැදිලි කළේ ජාත්‍යන්තර පාලන තන්ත්‍රයන් පිහිටුවීමේ ප්‍රයත්නයන් හෝ, සාමාන්‍යයෙන්, ජාත්‍යන්තර සමාජයේ ආයතනික විධිවිධානයන් ආධිපත්‍යය දරන ආයතනික කේවල් කිරීමේ ක්‍රියාවලීන්හි සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය සඳහා නායකත්වය ප්‍රධාන තීරණාත්මක සාධකයක් බවයි.’’ තවද, ඔහු නායකත්වය නිර්වචනය කරන්නේ "පාර්ශවයන් එකමුතුවෙන් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා කටයුතු කරන ආයතනික සාකච්ඡා මැදිහත්වීම්වලදී ඇතිවන එකතුවී කටයුතු කිරීමේ ගැටළු විසඳීමට හෝ ඒවා වටහාගැනීමට උත්සාහ කරන පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම්" ලෙසය. Young (1991, p. 285)

Arild Underdal (1994, p. 178) ට අනුව, නායකත්වය යනු "එක් ක්‍රියාකරුවෙකු යම් කාල පරිච්ඡේදයක් තුළ යම් ඉලක්කයක් කරා අන් අයගේ හැසිරීම මෙහෙයවන හෝ මඟ පෙන්වන බලපෑමේ අසමමිතික සම්බන්ධතාවයයි." මෙම නිර්වචනය තුළ ඉදිරි නායකයෙකු විසින් සපුරාලිය යුතු බොහෝ සුදුසුකම් අන්තර්ගත වේ. පළමුව, නායකත්වය යනු නායකයා සහ අනුගාමිකයින් අතර ඇති සමාජ සම්බන්ධතාවයකි. එබැවින් අනුගාමිකයින් නොමැති නායකයෙකු නොමැත. සම්බන්ධතාවයට බලපෑම් සහ බලය ඇතුළත් නමුත් අවශ්‍යයෙන්ම දැඩි බලයක් අවශ්‍ය නොවේ, මන්ද නායකත්වය බලහත්කාරයෙන් නොවිය යුතුය.

ගෝලීය පාරිසරික ගැටලු, ජාත්‍යන්තර වශයෙන් දේශගුණ විපර්යාසයන් සහ ජෛව විවිධත්ව හායනය වැනි ගැටලු ඉහළ යමින් පවතින අතර, බොහෝ රටවල් මෙම ගැටලු වලට සෘජුවම දායක වන නමුත් ඒවායේ බලපෑම් සමාන ලෙස බෙදී යෑමක් දක්නට නොලැබේ. එපමණක් නොව, තෝරාගත් රටවලට ප්‍රශ්න විසඳිය නොහැකි අතර සාමූහික ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වේ. එබැවින්, පොදු අරමුණු සපුරා ගනිමින් සාමූහික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය අත්‍යවශ්‍ය අංගයකි.

කෙසේ වෙතත්, අපැහැදිලි දෙය නම්, ගෝලීය පාරිසරික දේශපාලනයේ නායකත්වය ලබා දීමට සමහර රාජ්‍යයන් හරියටම පොළඹවන්නේ කුමක් ද යන්න සහ එම අදහස් ජාත්‍යන්තර දේශපාලනයේ වෙනත් ගැටළු ක්ෂේත්‍රවල නායකත්වය ක්‍රියාත්මක කිරීමේ අදහස් වලින් වෙනස් වන්නේ කෙසේද යන්නයි. ජාත්‍යන්තර නායකත්වය සැපයීමේ සියලු ප්‍රයත්නයන් ආරක්ෂාව සහ ගෝලීය මහජන සෞඛ්‍යය වැනි මහජන භාණ්ඩ සැපයීමට සම්බන්ධ බවට තර්ක තිබුණද, පාරිසරික නායකත්වය අනෙකුත් ජාත්‍යන්තර නායකත්වයෙන් වෙන්කර හඳුනා ගන්නා අවම වශයෙන් එක් විශේෂ ලක්ෂණයක් ඇති බව පෙනේ: පාරිසරික නායකත්වය අවශ්‍යයෙන්ම මානව කේන්ද්‍රීයව ක්‍රියාත්මක නොවන නමුත් මානව කේන්ද්‍රීය නොවන මූලිකතා සමඟ සම්බන්ධ විය හැකි ය. ගෝලීය පාරිසරික දේශපාලනය පිළිබඳ පවතින GEP සාහිත්‍යය අඩු වැඩි වශයෙන් පදනම් වී ඇත්තේ මානව තීරණ ගැනීමේ ස්වයං ලැදි පදනමේ තාර්කික උපකල්පන මත වන නමුත්, ග්‍රහ විද්‍යාව පිළිබඳ වර්තමාන සංවාදය (උදා: Burke, Fishel, Mitchell, Dalby, & Levine, 2016). ජාත්‍යන්තර සබඳතා විද්‍යාව තම නීතින් යළි හඳුනාගැනීම හා සංවිධාන කිරීම සඳහා යෝජනා කරන අතර, ග්‍රහ සීමා ගණනාව පරිසර නායකත්වයේ ධර්මයක් ලෙස පිළිගැනීම හේතුවෙන්, GEP හි නායකත්වය පිළිබඳ සද්භාව වේදී සහ ඥානවිද්‍යාත්මක උපකල්පන වෙනස් කිරීමට විශාල හැකියාවක් ඇති බව පෙනේ. එවැනි නැවුම් වර්ධනයන් මගින් ස්වභාවධර්මය පිළිබඳ නායකයින්ගේ සහ අනුගාමිකයින්ගේ අදහස්, නායකයින් සහ සොබාදහම අතර සම්බන්ධතාවය සහ නායකත්වය තුළ ග්‍රහ බලපෑම් වැනි ගැටළු පිළිබඳ ප්‍රශ්න කරන හැකියාවක් ඇත. එපමණක් නොව, දේශපාලන දාර්ශනික ප්‍රශ්නවලට අමතරව, පරිසරයේ යහපැවැත්ම අවධාරණය කරමින් නායකත්වය පිළිබඳ GEP අධ්‍යයනයේ නායකත්වය මධ්‍යයේ සමාජ සංවර්ධනය මත වඩාත් පරිසර කේන්ද්‍රීය නායකයින් දැනුවත් කිරීමට විශාල හැකියාවක් පැවතිය හැකිය (Kopra, 2020).

අනෙක් අතට, හරිත ඡන්දය පිළිබඳව කරන ලද අධ්‍යයනයකින් අපේක්ෂකයින් පරිසරයට ලබා දී ඇති ප්‍රමුඛතාවය සහ පරිසරය කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය ඡන්දදායකයින් තේරුම් ගන්නා ආකාරය අධ්‍යයනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. අධ්‍යයනයෙන් 1984 සිට 2000 දක්වා ඇමරිකානු ජනාධිපතිවරණ පහක් කෙරෙහි අවධානය යොමු විය. තවද මැතිවරණ පහෙන් හතරකටම පරිසරය සැලකිය යුතු බලපෑමක් ඇති කළ බව සොයාගැනීම්වලින් පෙනී යයි.

ඡන්දදායකයින්ගෙන් බහුතරයකට ඔවුන්ගේ පාරිසරික ප්‍රතිපත්ති මත පදනම්ව අපේක්ෂකයින් වෙන්කර හඳුනා ගැනීමට හැකි විය. ඡන්දදායකයින්ගේ තීරණ මත පාරිසරික ගැටළු වල බලපෑම ඉක්මවා ගියේ ආර්ථිකය සහ ගබ්සාව සම්බන්ධ ප්‍රතිපත්තිමය උත්සුකයන් පමණි. මීට අමතරව, වැඩි ඡන්ද දායකයින් සංඛ්‍යාවක් පාරිසරික ප්‍රයත්නයන් වැඩි කිරීමට සහාය විය. Andrews (2001, p. 1485) නිරීක්ෂණය කර ඇති පරිදි, පාරිසරික උපදේශකයින් මෙම ගැටලුව කෙරෙහි මහජන අවධානය යොමු කළ යුතුය. පුරවැසියන්ගේ ප්‍රකාශනය සඳහා අවස්ථා ලෙස මැතිවරණවලට එම අවධානය ලබා දිය හැකි අතර මෑතකාලීන ජනාධිපතිවරණ පෙන්නුම් කරන පරිදි පුරවැසියන්ට “පරිසරයට ඡන්දය දීමට” හැකිය (Davis, Wurth & Lazarus, 2008).

## 4.4 විධිමත් අධ්‍යාපනයේ මැතිවරණ (දේශපාලන) සාක්ෂරතාව

ඡන්දදායකයින් හොඳින් දැනුවත් වී මැතිවරණ ක්‍රියාවලියේ කොටස්කරුවන් වීමට කැමැත්තෙන් සිටින බව සහතික කිරීමට ඡන්දදායක අධ්‍යාපනය වැදගත් වේ. මැතිවරණ අයිතිවාසිකම් පහසුවෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඡන්දදායකයින්ගේ විශ්වාසය සහ ප්‍රජාතන්ත්‍රවාදය පෝෂණය කිරීම සඳහා ඔවුන් දායක වී ඇති බවට හැඟීම සහ විශ්වාසය වැඩි දියුණු කිරීම එහි අරමුණ විය යුතුය. විවිධ රටවල මැතිවරණ කළමනාකරණ මණ්ඩල (EMB) ඔවුන්ගේ අදාළ ප්‍රඥප්ති, ව්‍යවස්ථාදායක මෙවලම්, බැඳීම් සහ වගකීම් කෙරෙහි අවධානය යොමු කරමින් විෂයමාලා සහ විෂය බාහිර අංශයන් යටතේ ශක්තිමත් ඡන්දදායක අධ්‍යාපන පද්ධති සංවර්ධනය කර ඇත.

EMB කිහිපයක් විස්තීර්ණ ඡන්දදායක අධ්‍යාපන සම්පත් සංවර්ධනය කිරීමෙන් සහ එම සම්පත් සඳහා ඔවුන්ගේ වෙබ් අඩවිවල සත්කාරකත්වය ලබා දීමෙන් විෂයයට ප්‍රවේශ වී ඇත. මෙම සම්පත් වලට පරිශීලක හිතකාමී සවිස්තරාත්මක ඡන්දදායක තොරතුරු සහ සාමාන්‍යයෙන් නැඟී එන ප්‍රශ්න (FAQ's) සමඟ සම්බන්ධ කළ අන්තර්ගතයන් සහිතව පියවරෙන් පියවර මැතිවරණ ක්‍රියාවලි තොරතුරු ඇතුළත් වේ. ඡන්දදායකයින්ට මැතිවරණ ක්‍රියාවලියට සහභාගී වීම පිළිබඳ මාර්ගෝපදේශනයක් ලබා ගැනීම සඳහා සඳහා මෙම තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැක. (උදා: ඇමරිකා එක්සත් ජනපදය, නිව්සීලන්තය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඉන්දියාව, කෙන්යාව ආදී රටවල්).

ඡන්ද දායකයින්ගේ අධ්‍යාපනය සඳහා රටවල් කිහිපයක් ගෙන ඇති ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරන විට, ඕස්ට්‍රේලියානු මැතිවරණ කොමිසම (AEC) රටේ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ගාස්තුවක් අය කෙරේ. ලියාපදිංචි කිරීම සහ ඡන්දය ප්‍රකාශ කිරීම ඇතුළුව සියලුම මැතිවරණ සම්බන්ධ කරුණු පිළිබඳව AEC විසින් ඡන්දදායකයින්ට සවිස්තරාත්මක තොරතුරු සහ මග පෙන්වීමක් සපයන අතර පාසල් ගුරුවරුන් සහ සිසුන් සඳහා AEC විසින් නොමිලේ අධ්‍යාපනික සම්පත් සහ වැඩසටහන් සපයයි. AEC හි අධ්‍යාපනික සම්පත්

සහ වැඩසටහන් විවිධ මට්ටම්වල සිසුන්ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි හොඳින් ව්‍යුහගත කර ඇත. පාසල් මට්ටමේ සිසුන් වෙනුවෙන් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සියලු දේ සපයන පරිපූර්ණ වැඩසටහනක් වන 'ඡන්දය ලබා ගන්න' යන වැඩසටහන ඔවුන්ගේ එක් වැඩසටහනකි. එය පාසල් මැතිවරණයක් සංවිධානය කිරීමට, ශිෂ්‍යයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අත්දැකීම් ලබා දීමෙන් සිවිල් සහ පුරවැසි විෂයමාලා ප්‍රතිඵල ආමන්ත්‍රණය කිරීමට, හොඳ ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයන් ආදර්ශයට ගනිමින් සුදුසු ශිෂ්‍ය නායකයින් තෝරා ගැනීමට උපකාරී වේ.

කැන්බරා හි ජාතික මැතිවරණ අධ්‍යාපන මධ්‍යස්ථානය ෆෙඩරල් මැතිවරණ ක්‍රමය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන් ඉදිරිපත් කරයි, එහිදී අධ්‍යාපනඥයින් විසින් විනාඩි 90 ක වැඩසටහනක් හරහා සහභාගිවන්නන් හට මඟ පෙන්වයි; ඕස්ට්‍රේලියානු ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතිහාසය ගවේෂණය කරන බහු-මාධ්‍ය ඉදිරිපත් කිරීමක්, සිසුන් බඳවා ගැනීම, ඡන්දය ප්‍රකාශ කිරීම සහ නියෝජනය අවබෝධ කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම්; සහ ආදර්ශයක් ලෙස සකස් කරන ලද මැතිවරණයක ඡන්දය ප්‍රකාශ කිරීම, ප්‍රතිඵලයක් ජනනය කිරීම සඳහා ඡන්ද ගණන් කිරීම වැනි පියවරයන් මෙම වැඩසටහන තුළ අන්තර්ගත වේ. විශේෂයෙන් වැඩසටහන් අන්තර්ගතය විවිධ ඉගෙනුම් මට්ටම් සහ විවිධ උනන්දුවක් දක්වන ක්ෂේත්‍රවලට ගැලපෙන පරිදි අභිරුචිකරණය කළ හැකිය (ඉන්දියාවේ මැතිවරණ කොමිසම, 2016).

කැනඩාවේ මැතිවරණ ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් අධ්‍යයනය කරන විට, මැතිවරණ කැනඩාව (EC) ෆෙඩරල් මැතිවරණ පැවැත්වීම සහ පුරවැසියන් දැනුවත් කිරීම සඳහා වගකිව යුතුය. ඔවුන්ගේ විධිමත් අධ්‍යාපනයට සාමාන්‍යයෙන් සියලුම ඡන්දදායකයින් ඇතුළත් වන අතර, ඡන්දදායකයින් ලියාපදිංචි කිරීම, ඡන්දය ප්‍රකාශ කළ යුතු ස්ථානය, ඡන්දය ප්‍රකාශ කරන දිනය, ඡන්දය ලබා දිය යුතු ආකාරය, ඡන්දය ප්‍රකාශ කිරීමට අවශ්‍ය හඳුනාගැනීම සහ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය භාවිතා කිරීමට ඡන්දදායකයින් සූදානම් කිරීම යනාදිය සමස්ත මැතිවරණ ක්‍රියාවලිය තුළ අන්තර්ගත වේ. එපමණක් නොව, ප්‍රාථමික සහ ද්විතීයික මට්ටමේ සිසුන් මෙන්ම ගුරුවරුන් සඳහා සිවිල් අධ්‍යාපනය, තරුණ සහභාගීත්වය, ප්‍රජා සහභාගීත්වය සහ මාර්ගගත සේවාවන්, හවුල්කාරිත්වයන් ගොඩනැගීම යනාදිය ඇතුළු විවිධ ක්‍රම හරහා මෙම දැනුවත් කිරීම් සිදුවේ. එසේම, යොවුන් කැනේඩියානුවන් සඳහා වූ සංසදය උසස් පාසල් සිසුන් 120 දෙනෙකුට ඔටාවා හි පාර්ලිමේන්තුව පාර්ලිමේන්තුව පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලබා දීමෙන්, කැනේඩියානු දේශපාලනය සහ මහජන කටයුතු පිළිබඳ ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමට අවස්ථාව සලසයි.

ජෝර්ජියාවේ (CEC) මධ්‍යම මැතිවරණ කොමිෂන් සභාව ඡන්දදායකයින්ට ඔවුන්ගේ මැතිවරණ අයිතිවාසිකම් හිමි කර ගත හැකි පරිසරයක් නිර්මාණය කරන අතර සිවිල් ඡන්දදායක අධ්‍යාපනය

ඔවුන්ගේ උපායමාර්ගික සැලැස්මේ (2015-2019) කොටසක් වේ. ඡන්දදායකයින්ට සහ මැතිවරණ පාර්ශ්වකරුවන්ට තම මැතිවරණ අයිතිය නිදහසේ භාවිතා කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීමට ද CEC හි කාර්යභාරයක් වේ. ඒ සඳහා ඔවුන් නිර්මාණාත්මක මුල පිරිම් ක්‍රියාත්මක කර තිබේ. මැතිවරණ දිස්ත්‍රික්ක 10 ක ක්‍රියාත්මක කරන ලද පුහුණු මධ්‍යස්ථානයක සහයෝගීතාවයෙන් තරුණයින් සඳහා ‘‘ඡන්ද සම්බන්ධයෙන් වන සංවර්ධන පාසල්’’ නම් නියමු ව්‍යාපෘතියක් 2015 දී ඔවුන් විසින් ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය යටතේ ඇති පාසල් මැතිවරණ නිලධාරීන්ගේ පුහුණු කුසලතා වැඩිදියුණු කිරීමට අමතරව ප්‍රජා සහභාගීත්වය වැඩි කිරීම සහ මැතිවරණ සම්බන්ධයෙන් තරුණයින් අතර ප්‍රචලිත කිරීම අරමුණු කරයි.

මැතිවරණ සහභාගීත්වය සහ අධ්‍යාපනය වෙනුවෙන්, තරුණ මැතිවරණ සහභාගීත්වයේ හිඩැස් පිරවීම සඳහා ඉන්දියාව පිළිගත් විද්‍යාල සහ විශ්වවිද්‍යාලවල සිසුන් අතරට විශ්වවිද්‍යාල තානාපතිවරුන් හඳුන්වා දී තිබේ. ජාතික මැතිවරණයේදී තානාපතිවරු 9000ක් පමණ සහභාගී විය. ඉන්දියානු ප්‍රාන්ත විශ්වවිද්‍යාල තානාපතිවරුන්ගේ භූමිකාවන් සහ වගකීම් පිළිබඳ පොත් පිංචක් සකස් කර වැඩමුළු අතරතුර ඔවුන් අතර බෙදාහැර තිබේ. වැදගත්ම දෙය නම්, ඔවුන්ට පැවරී ඇති කාර්යය වන්නේ මැතිවරණ වලදී ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතය වැඩි කිරීම සඳහා පළමු වරට තම ඡන්දය ප්‍රකාශ කරන ඡන්දදායකයින් පෙළඹවීම යි. ඉදිරි මැතිවරණ වලදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ලියාපදිංචි වීමට සිසුන් දිරිමත් කිරීම සඳහා නිර්මාණාත්මක ප්‍රවේශයන් භාවිතා කිරීම පිළිසම්බන්ධයෙන් ද ඔවුන් දැනුවත් කරන ලදී.

තානාපතිවරයාගේ රාජකාරිය වූයේ කාඩ්පත් නොමැතිව ඡන්ද සඳහා ලියාපදිංචි නොවූ සිසුන්, ගුරුවරුන් හඳුනා ගැනීම, ඔවුන්ට අවශ්‍ය ආකෘති පත්‍ර සහ සුදුසු මාර්ගෝපදේශ ලබා දී ලියාපදිංචි වීමට පහසුකම් සැලසීම, ඔවුන්ගේ අයදුම්පත් අනුමත කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කිරීම, ඡන්ද කාඩ්පත් බෙදා හැරීම, ජාතික ඡන්ද දායකයින්ගේ දිනය සංවිධානය කිරීම, විශ්ව විද්‍යාලවල සහ අනෙකුත් සංවිධාන අතර සම්බන්ධීකරණය සිදු කිරීම, ස්වේච්ඡා කණ්ඩායම් නිර්මාණය කිරීම සහ අසල්වැසියන් සඳහා ඡන්දය සමන්ධයෙන් දැනුම ලබා දෙන්නෙකු වීම සහ අයදුම් පත්‍ර පිරවීම සඳහා මිනිසුන්ට උපකාර කිරීම යනාදී කටයුතු ය (ඉන්දියාවේ මැතිවරණ කොමිසම, 2016).

## 4.5 ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම

විවිධ රටවල මැතිවරණ කළමනාකරණ මණ්ඩල බොහොමයක් මැතිවරණ ක්‍රියාවලීන් පිළිබඳ ඡන්දදායකයින්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා ඡන්දදායක සම්පත් සපයයි. තවද බොහෝ අවස්ථාවලදී අන්තර්ජාලය හරහා ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම් ද සපයනු ලැබේ.

කාන්තාවන්, විදේශීය ඡන්දදායකයින්, ආබාධිත ඡන්දදායකයින් වැනි විවිධ ඡන්දදායකයින් සඳහා අවශ්‍ය තොරතුරු අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකිය. නිල වෙබ් අඩවි තුළ නිරන්තරයෙන් විමසන ප්‍රශ්න සහ එම ප්‍රශ්න වලට අදාළ පිළිතුරු එකතු කිරීම නව තාක්ෂණය භාවිතා කිරීමේ වෙනත් ආකාරයක් වේ. බොහෝ EMBs මගින් පෙන්නුම් කරන්නේ පුරවැසියන්ට විශේෂයෙන්ම තරුණ තරුණියන් මැතිවරණ ක්‍රියාවලීන්හි නිරත වීමට සමාජ මාධ්‍ය භාවිත කරන ආකාරයයි. සාම්ප්‍රදායික මාධ්‍ය මගින් සපයන ඒක දිශානත සන්නිවේදනය අවම වෙමින් පවතින අතර ඊට ප්‍රතිවිරුද්ධව ඡන්දදායකයින්ට සහ විභව ඡන්දදායකයින්ට ප්‍රවේශ වීමේ නව ආකාර ලබා දීමත් සමඟ සමාජ මාධ්‍ය භාවිතය ඉහළ යමින් පවතී.

සිඩ්නි හි NSW මැතිවරණ කොමිසම 2011 මැතිවරණය අතරතුර සමාජ මාධ්‍ය උපාය මාර්ග භාවිතා කර තිබේ. ඔවුන් අන්තර්ජාලය ඔස්සේ පණිවිඩ පතුරුවා හැරීමට සහ මැතිවරණය පිළිබඳ ජනතාවගේ අදහස් විමසීමට මෙන්ම සාම්ප්‍රදායික මාධ්‍ය මගින් තරුණ ප්‍රේක්ෂකයින් හට මග හැරෙන දේ ඔවුන් වෙත ළඟා කරවමින් ඍජු සංවාදයේ යෙදීමට සමාජ මාධ්‍ය භාවිතා කළහ. ඔවුන්ට විශාල ප්‍රේක්ෂක පිරිසක් සිටින Facebook ප්‍රජා පිටුවක් ද තිබුණි. ඊට අමතරව, ඔවුන් ඡන්දය ලබාදෙන ආකාරය දැක්වෙන අධ්‍යාපනික වීඩියෝ ඉදිරිපත් කරමින්, ට්විටර් සහ යූ ටියුබ් ඔස්සේ ක්‍රියාකාරී වූ අතර, ඡන්දය සඳහා ලියාපදිංචි වීම දැනුවත් කිරීම වෙනුවෙන් කෙටි පණිවුඩ ඔස්සේ සිහි කැඳවීමක් ද සිදු කර තිබේ.

එක්සත් රාජධානිය සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට, ඔවුන් ඊ-රාජ්‍ය තොරතුරු සහ සේවා බෙදා හැරීම ව්‍යාප්ත කිරීමට සමාජ මාධ්‍ය උපාය මාර්ග භාවිතා කර ඇත. වැඩිදුර උදාහරණ සඳහා; Fix My Street, UK Citizens for Online Democracy, My Society, They Work For You ආදිය (මන්ත්‍රීවරුන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම, කතා, ප්‍රකාශ සහ සභා රැස්වීම් සහ විවාද සඳහා සහභාගීත්වය නිරීක්ෂණය කිරීමට ජනතාවට උපකාර කරයි) පුරවැසියන්ගේ ප්‍රයෝජනය සඳහා යොදාගත හැකි ය.

එපමණක් නොව, “බයිට් ද බැලට්” යනු තවත් සමාජ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාරයක් වූ අතර එමඟින් අන්‍යයන්ට කතා කිරීමට සහ රටේ තීරණ වල කොටස්කරුවන් බවට පත් වීමට තරුණ තරුණියන් පොළඹවන ලදී. ඔවුන් සංගීතය, ප්‍රහසන, නැටුම් වැනි ආකර්ශනීය ක්‍රම රාශියක් භාවිතා කර තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී විවාදයේ නියැලීම සඳහා තරුණ තරුණියන්ගේ මැතිවරණ පිළිබඳ දැනුම සහ දේශපාලන සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා සංවර්ධනය කරන ලද අන්තර්ක්‍රියාකාරී ක්‍රියාකාරකම් සහිත අන්තර්ක්‍රියාකාරී සම්පත් ඇසුරුමක් වන Rock Enroll (සංගීතයෙන් එක්වීම) ද ඔවුන් සතුව තිබුණි.

## 4.6 ඇතුළත් සහභාගීත්වය සඳහා ඡන්දදායක අධ්‍යාපනය

ලොව පුරා විවිධ සන්දර්භයන් තුළ, විශේෂ කණ්ඩායම් සඳහා ඡන්දදායක අධ්‍යාපනය ප්‍රමුඛ තේමාවක් බවට පත්ව ඇත. එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 5වන වගන්තිය මගින් වාර්ගික වශයෙන් සිදු කෙරෙන වෙනස්කම් තුරන් කිරීම (ICERD) (1966) පිළිබඳ දක්වා ඇත.රජයේ සියලු පාර්ශ්වයන් සියලු ආකාරයේ වාර්ගික වෙනස් කොට සැලකීම් තුරන් කිරීමට කටයුතු කළ යුතුය. එසේම කුලය වර්ණය ජාතිකත්වය හෝ වාර්ගිකත්වය යන කරුණු නොසලකා සෑම පුද්ගලයෙකුගේම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා කටයුතු කළ යුතුය. ඡන්දයක් සඳහා සහභාගි වීම සහ ඡන්දයකදී ඉදිරිපත්වීම සම්බන්ධයෙන් වන දේශපාලන අයිතිවාසිකම් මෙහිදී විශේෂ වේ. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් ඉවත්කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 7 වැනි වගන්තිය (CEDAW) (1979) මගින් කාන්තාවන්ට වෙනස් කොට සැලකීම තුරන් කිරීම සඳහා රජයේ සියලු පාර්ශ්වයන් සුදුසු පියවර ගත යුතු බව දක්වයි. ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (CRPD) (2006) 21 වැනි වගන්තිය මගින් පැහැදිලි කරන්නේ ආබාධ සහිත පුද්ගලයින්ට අන් අය සමඟ සමාන පදනමක් මත සහ ඔවුන් කැමති සියලු ආකාරයේ සන්නිවේදනයන් හරහා තොරතුරු සහ අදහස් සෙවීමට, ලබා ගැනීමට සහ බෙදා හැරීමට ඇති නිදහස ඇතුළුව අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ක්‍රියාත්මක කළ හැකි බව සහතික කිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන් සියලු සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බවයි.

සාමාන්‍ය ජනතාවට ලබාදෙන තොරතුරු වලට, අබාධ සහිත පුද්ගලයින් හට ද අමතර වියදම් වලින් තොරව ප්‍රවේශ විය හැකි ආකාරවලින් සහ තාක්‍ෂණයන්ගෙන් යුතුව ලබාදීම ඇතුළු; (ආ) සංඥා භාෂා භාවිතය පිළිගැනීම සහ පහසුකම් සැලසීම, බ්‍රේල්, වර්ධක සහ විකල්ප සන්නිවේදනය, (ඇ) ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ විය හැකි සහ භාවිත කළ හැකි ආකෘතිවලින් තොරතුරු සහ සේවා සැපයීමට සාමාන්‍ය ජනතාවට සේවා සපයන පෞද්ගලික ආයතනවලින් ඉල්ලා සිටීම; (ඈ) ආබාධ සහිත පුද්ගලයන්ට ඔවුන්ගේ සේවාවන් වෙත ප්‍රවේශ විය හැකි පරිදි, අන්තර්ජාලය හරහා තොරතුරු සපයන්නන් ඇතුළු ජන මාධ්‍ය දිරිමත් කිරීම; (ඉ) සංඥා භාෂා භාවිතය හඳුනා ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම. 29 වන වගන්තිය, දේශපාලන හා පොදු ජීවිතයේ සහභාගිත්වය යටතේ, ආබාධ සහිත පුද්ගලයින්ට දේශපාලන අයිතිවාසිකම් සහ අනෙක් අය සමඟ සමාන පදනමක් මත ඒවා භුක්ති විඳීමේ අවස්ථාව රාජ්‍ය පාර්ශවයන් විසින් සහතික කරනු ලැබේ.

කැනඩාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී, කැනඩා මැතිවරණ නියෝජිතායතනය විසින් සිදුකරන ලද මුලපිරීම් මැතිවරණ වලදී ආබාධිත පුද්ගලයින්ගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා සඳහා දායක වී තිබේ. ඔවුන් මේ සඳහා විවිධ ඡන්ද ක්‍රම සපයා ඇත. එනම්, තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීම, කල්තියා ඡන්දය ප්‍රකාශ කිරීමේ දින, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ජංගම ඡන්ද සේවා පහසුකම් සහ විශේෂ අවස්ථා වලදී මැතිවරණ නිලධාරියෙකු ඉදිරියේ ඡන්දය ප්‍රකාශ කිරීම වැනි නම්‍යශීලී ක්‍රම සපයා තිබේ. එපමණක් නොව, කල්තියා ඉල්ලා සිටින්නේ නම්, ඔවුන් සංඥා භාෂා

පරිවර්තකයන් සපයයි, නැතහොත් මැතිවරණ නිලධාරියෙකු, මිතුරෙකු හෝ ඥාතියෙකුගේ සහය ලබා ගැනීම සඳහා අවස්ථාව ලබා දෙයි, පහසුවෙන් කියවීම සඳහා විශාලනය සහිත ආලෝකවත් ඡන්ද තිරයක් ලබා දීමද සිදු කරයි. තවද, ඡන්ද මධ්‍යස්ථානයේ ප්‍රවේශ්‍යතා මෙවලම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා මැතිවරණ සේවකයින්ට පුහුණුවක් ලබා දීම, මෙම ප්‍රවේශ්‍යතා විශේෂාංග පවත්වා ගෙන යන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දීම, ඡන්දදායකයින්ට ලබා ගත හැකි විවිධ මෙවලම් පිළිබඳව මැතිවරණ සේවකයින් දැනුවත් කිරීම සහ සහය අවශ්‍ය වන ඡන්දදායකයෙකු වෙත ළඟා විය හැකි ආකාරය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම ආදියද සිදු කෙරේ. එපමණක් නොව, ඔවුන් ඉස්මතු කරන පරිදි හොඳම භාවිතයන්ගෙන් එකක් වන්නේ, ආබාධ සහිත පුද්ගලයින් විසින්ම, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන මැදිහත්වීම් සැලසුම් කිරීම සිදු කිරීම සහ පහසුකම් සපයන්නන්, මැතිවරණ නිරීක්ෂකයින් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා ඔවුන්ට අවකාශය සැලසීමයි (ඉන්දියාවේ මැතිවරණ කොමිසම, 2016).

කෙසේ වෙතත්, දශක ගණනාවක් තිස්සේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ මැතිවරණ ක්‍රියාවලීන් පිළිබඳ පර්යේෂණ සිදු කර ඇති අතර, LGBTQ ගැටළු සහ මැතිවරණය සම්බන්ධයෙන් තවමත් වැඩි අවධානයක් යොමු කර නොමැත (Paulina & Przemyslaw, 2022). එපමණක් නොව, Kamenou විසින් LGBTQ+ ප්‍රජාවගේ දේශපාලන සහභාගීත්වය සහ ඔවුන්ගේ ඡන්දය පිළිබඳව අවධානය යොමු කර ඇති අතර, LGBTQ දේශපාලනය ඔවුන්ගේ ඡන්ද මතය සහ තීරණ ගැනීමේ තාර්කිකත්වය සම්බන්ධයෙන් කෙසේ බලපානවාද යන්න පිළිබඳ විශේෂ අවධානයක් දක්වා තිබේ. ඔවුන් විශ්ලේෂණය සඳහා සයිප්‍රස් හි LGBTQ+ සහභාගිවන්නන්ගේ පර්යාලෝකයන් කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, ඔවුන්ගේ දේශපාලන හැසිරීම් තුළ ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රධාන රටා දෙකක් හඳුනාගෙන ඇත. පළමුවැන්න වශයෙන්, LGBTQ+ ගැටළු බැරෑරුම් ලෙස සැලකීමට දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් දක්වන අකැමැත්තට විරෝධතා ප්‍රතිචාරයක් ලෙස ඡන්දය දීමෙන් වැළකී සිටීමත්. දෙවැන්න වශයෙන්, LGBTQ+ ඡන්ද ප්‍රතිපත්ති විශේෂයෙන් LGBTQ+ පුද්ගලයින් ඔවුන්ගේ LGBTQ+ හඳුනාගැනීම් හා ගැටළු ඡන්දයකදී ප්‍රමුඛ කරගන්නා නමුත් එම ගැටළු වෙනත් අසමානතා මානව සම්බන්ධතා හා සම්බන්ධ වන බවට අවබෝධයකින් පසු වීම යන රටා ද්විත්වය ඇතුළත් වේ. මිනිසුන්ට හිතකර නොවන දේශපාලන පරිසරයන් ඔවුන් සහභාගී වීමෙන් අධෛර්යමත් නොකරයි, ඒ වෙනුවට ඔවුන් ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී-අනන්‍යතාවය-නොගැලපෙන දේශපාලන නියෝජිතයන් වශයෙන් පමණක් නොව, ඡේදනය වන සමාජ සාධාරණත්වයේ සහ රැඩිකල් දේශපාලන වෙනස්වීම්වල දේශපාලන නියෝජිතයන් ලෙස තේරුම් ගෙන ක්‍රියාත්මක වේ (Kamenou, 2024).

## 4.7 දේශපාලන සහභාගීත්වය කෙරෙහි බලපාන දේශපාලන නොවන සාධක

පුද්ගලයන් අයත් වන සමාජ ක්‍රමයන් ඔවුන්ගේ ඡන්ද තීරණ සම්බන්ධයෙන් බලපෑම් කරන බවට පොදු විශ්වාසයක් පවතී. බලපාන ප්‍රධාන සාධක වශයෙන් කුලය, ජාතිය, ආගම, මතවාදය, පවුල, සහ මතවාදී නායකයන් යනාදිය හඳුනාගත හැකිය. එපමණක් නොව, දේශපාලන අදහස් පල කිරීමට සහ බෙදා ගැනීමට සමාන වේදිකාවක් සපයන බැවින් සමාජ මාධ්‍ය ජනතාවගේ ඡන්ද තේරීම් සම්බන්ධයෙන් බලපෑම් කිරීමේදී ප්‍රමුඛ වී ඇත. මෙම බෙදාගැනීමේ සංස්කෘතිය ඔස්සේ මාර්ගගත සමාජ වේදිකා හරහා දේශපාලන ක්‍රියාවලියට සමානව සහභාගී වීමට ඔවුන්ට හැකියාව ලබා දී ඇත (Castells, 2010, 2012; Jose van Dijck, 2013).

Zeib (2021) යෝජනා කරන පරිදි, මැතිවරණ හැසිරීම් පිටුපස ඇති සමාජ නිර්ණායක ජනතාව විසින් නැවත ඇගයීමට ලක් කළ යුතුය. ප්‍රධාන වශයෙන්ම තොරතුරු නිෂ්පාදනයේ රටාවන් වසර ගණනාවක් තිස්සේ වෙනස් වී ඇති බැවිනි. තාක්ෂණික වර්ධනයන් සමඟ සන්නිවේදනය වඩාත් සංකීර්ණ වී ඇති අතර එහිදී මිනිසුන් අතර අන්තර්ක්‍රියාකාරිත්වය වැඩි වී ඇත. ඒ අනුව, ඉහළ තේරීමක් සහිත මාධ්‍ය පරිසරයක් තුළ මිනිසුන් බොහෝ තොරතුරු වලට නිරාවරණය වන අතර ඡන්දදායකයින් පෙරට වඩා බලවත් වේ.

පුද්ගලයෙකුගේ ඡන්ද හැසිරීම නිර්වචනය කරන සමාජ විද්‍යාත්මක සාධක කිහිපයක් වශයෙන්, සම වයසේ මිතුරන්, පවුලේ සාමාජිකයන් සහ සමාජ පන්තිය ආදිය දැක්විය හැකි ය. බීබීසී හි දේශපාලන වාර්තාකරුවෙකු වන ගැවින් ස්ටැම්ප් පවසන්නේ තරුණ වැඩිහිටියන්ගෙන් තුනෙන් එකක් පමණ ඔවුන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ තීරණවලදී තම පවුලේ සාමාජිකයන් සහ සම වයසේ මිතුරන්ගේ බලපෑමට ලක්වන බවයි.

Kudrnáč & Lyons, (2017), තම දෙමාපියන් සමඟ ජීවත් වන තරුණ ඡන්දදායකයින් ඔවුන්ගේ ඡන්ද මනාපය ප්‍රකාශ කිරීමේදී බොහෝ විට දෙමාපියන්ගේ බලපෑමට ලක් වේ. Gidengil et al., (2016) වැඩිහිටියන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතය දෙමාපියන්ගේ ඡන්දය සමඟ ශක්තිමත් සම්බන්ධතාවක් පවතින බව පැහැදිලි කරයි. වඩාත්ම බලගතු සමාජ පීඩනය එල්ල වන්නේ ගෘහය තුළිනි (Blais et al., 2019). පකිස්තාන පවුල්වල සමීප පවුල් සබඳතා වැඩිහිටි දරුවන්ට ඔවුන්ගේ ඡන්දය තෝරාගැනීමේදී බලපෑම් කරන බව පර්යේෂණ සොයාගැනීම් ඔස්සේ පෙන්වා දෙයි. කෙසේ වෙතත්, එම පර්යේෂණයේදීම, ඡන්දය ප්‍රකාශ කිරීමේදී සමාජ මාධ්‍යවල කාර්යභාරය පිළිබඳවද ඉස්මතු විය. සමාජ මාධ්‍ය මඟින් තොරතුරු ප්‍රවාහයට සහ විවෘත සාකච්ඡා සඳහා ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයක් සපයයි. මෙය අවසානයේ සුපරීක්ෂාකාරීව පුරවැසියන් සංවර්ධනය කරා යොමු කරයි. ඊට අමතරව, මැතිවරණ ව්‍යාපාර සහ ප්‍රතිඵල පිළිබඳ අනාවැකි සඳහා සමාජ මාධ්‍ය භාවිතා කළ හැකිය (Zeib, 2021).

දේශපාලනයට බලපෑම් කරන දේශපාලන නොවන තවත් සාධකයක් ලෙස; නාගරික සහ ග්‍රාමීය වෙනස අධ්‍යයනය කළ හැකිය. නාගරික-ග්‍රාමීය භූගෝලීය වෙනස්කම් මිනිසුන්ගේ ඡන්ද තේරීම්වලට බලපෑම් කරන බව පර්යේෂණ මගින් සනාථ වේ. ඇමරිකා එක්සත් ජනපදයේ සිදු කරන ලද පර්යේෂණයකින් පෙන්නුම් කෙරෙන්නේ, නාගරික-ග්‍රාමීය අඛණ්ඩ පැවැත්ම, ජනාධිපතිවරණ ඡන්ද ප්‍රකාශන රටා පිළිබඳ සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු තක්සේරුවක් බවයි (Dante & Kenneth, 2017). තවද, Bassett (2003) ට අනුව, ග්‍රාමීය වැසියන් පිළිබඳව බොහෝ වැරදි මත පවතී. එක් විශ්වාසයක් නම් ආණ්ඩු ව්‍යුහය ග්‍රාමීය වැසියන්ට දේශපාලන බලය ලබා දෙන බවයි. කෙසේ වෙතත්, යථාර්ථයේ දී, සැබෑ ජනගහන ප්‍රමාණයට සමානුපාතිකව දේශපාලනික වශයෙන් අඩු නියෝජනයක් ඔවුන්ට ඇත. ඊට අමතරව ග්‍රාමීය ගැටලු සම්බන්ධයෙන් අඩු අවධානයක් යොමුවන අතර එම ගැටලු වෙනුවෙන් ප්‍රමාණවත් දේශපාලන නියෝජනයක් නොලැබේ. මීට අමතරව, මහජන ප්‍රචාරක මූල්‍යකරණය සහ වත්මන් මැතිවරණ ක්‍රියාවලියට නව්‍යකරණයන් එක් කිරීම් ඇතුළුව ග්‍රාමීය වැසියන්ගේ දේශපාලන හඬ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යා යුතු බව කතුවරයා යෝජනා කරයි.

## 4.8 මැතිවරණ කාලසීමාව තුළ සිදුවන දූෂණ අක්‍රමිකතා

රටක පුරවැසියන්ට තම දේශපාලන අභිමතය ප්‍රකාශ කිරීමට පවතින හොඳම සහ සෘජු යාන්ත්‍රණය වන්නේ සාධාරණ මැතිවරණයයි. කෙසේ වෙතත්, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන දුර්වල සහ දූෂිත රටවල මැතිවරණ ක්‍රියාවලීන්ට බරපතල තර්ජන ඉදිරිපත් වේ. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් (2014) ට අනුව මැතිවරණ අඛණ්ඩතාව අඩපණ වන ප්‍රධාන ක්‍රම තුනක් තිබේ. එනම්; ඡන්දය මිලදී ගැනීම, රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම සහ මැතිවරණ දූෂණය යන ක්‍රම තුනයි. දේශපාලනඥයෙකු හෝ දේශපාලන පක්ෂයක් විසින්, පොදු සේවාවන් සඳහා ප්‍රවේශය, දේශපාලන සහාය සහ ඡන්දය ලබාදීමේ බැඳීම වෙනුවට ජනතා සේවාවන්, දේශපාලන සහයෝගය සහ මනාප වෙනුවෙන් ඡන්දදායකයින්ට සැළකීම වැනි අනුග්‍රහයන් ලබා දෙන විට ඡන්දය මිලදී ගැනීම සිදු වේ.

රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම යටතේ, දේශපාලන පක්ෂවලට හෝ මැතිවරණවල මූල්‍යකරණයට බලපාන පොදු සම්පත් අන් අයගේ වියදමින්, තනි පක්ෂයකට හෝ අපේක්ෂකයෙකුට අනුග්‍රහය දක්වන ආකාරයෙන් භාවිතා කිරීම ඇතුළත් විය හැකිය. නිදසුනක් වශයෙන්, මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රජය සතු යටිතල පහසුකම් සහ පිරිස් ඇතුළු රාජ්‍ය සම්පත් භාවිතා කිරීම සහ රජය සතු මාධ්‍ය හැසිරවීම දැක්විය හැකි ය. මැතිවරණ දූෂණ වශයෙන් ඡන්ද පෙට්ටියට අමතර හොර ඡන්ද දැමීම, ඡන්ද දායකයින්ට වැරදි තොරතුරු ලබා දීම, ඡන්ද ගණන් කිරීම සහ සටහන් කිරීම නිවැරදිව සිදු නොකිරීම, ඡන්ද හිමි නාමලේඛන වැරදි සහගත ලෙස හැසිරවීම, සහ ජනගහණ තොරතුරු වෙනස් කිරීම වැනි දූෂිත ක්‍රියාමාර්ග ඔස්සේ මැතිවරණ ප්‍රතිඵලවලට බලපෑම් කිරීම යනාදිය පෙන්වාදිය හැකි ය.

## 5. පුහුණු කිරීමේ ක්‍රමවේදය

ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය පිළිබඳ පුහුණු වැඩසටහනේ ක්‍රමවේදය, ඉතා අන්තර්ක්‍රියාකාරී ලෙස දේශන පැවැත්වීමෙන් සහ සහභාගීවන්නන් අතර සාකච්ඡා පැවැත්වීමෙන් සිදු කෙරේ. මෙම සාකච්ඡා ඇසුරින් සහභාගීවන්නන්ගේ දැනුම සහ අත්දැකීම් බෙදාහදා ගනී. සහභාගීවන්නන් අත්විඳින අභියෝග සහ ඔවුන් එම අභියෝගයන්ට මුහුණ දීමේ යාන්ත්‍රණයන්, කෙටි සහ අවිධිමත් කණ්ඩායම් සාකච්ඡා සහ ඉදිරිපත් කිරීම් සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. අවසාන වශයෙන් සහභාගිවන්නන් සංකල්පීය දැනුම සහ ඔවුන්ගේ සැබෑ ජීවිත අත්දැකීම් මත පදනම්ව ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය පිළිබඳ ඉතා සරල ක්‍රියාකාරී සැලැස්මක් සැලසුම් කිරීමට බලාපොරොත්තු වේ. පහත සඳහන් තේමාවන් සහ මාතෘකා මත පුහුණුව සිදු කෙරේ

## 6. පුහුණුව සඳහා දේශන අන්තර්ගතය (කාලය - පැය 4)

| | මාතෘකාව හෝ සංකල්පය | කාලය මිනිත්තු වලින් (පැය 4) |
|---|---|---|
| 1 | ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය සහ දැනුවත් කිරීම පිළිබඳ හැඳින්වීම | 40 |
| 2 | ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත්කම | 20 |
| 3 | ක්‍රියාකාරී පුරවැසියා යනු කවුරුන් ද? | 20 |
| 4 | ශ්‍රී ලංකාවේ දේශපාලන සාක්ෂරතාව සහ මැතිවරණ | 20 |
| 5 | ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය සහ හරිත නායකත්වය | 20 |
| 6 | සන්නිවේදන ආකාරයන්, මාධ්‍ය සහ ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය | 20 |
| 7 | ඇතුළත් සහභාගීත්වය | 30 |
| 8 | මැතිවරණ කාලසීමාවේදී දූෂණය සහ ප්‍රචණ්ඩත්වය | 20 |
| 9 | ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය සම්බන්ධ වෙනත් සාධක | 20 |
| 10 | සාරාංශය සහ නිගමනය | 30 |

## 7. පුහුණු වැඩමුළුව සැලසුම් කිරීම

පුහුණුකරුවන්ගේ කර්තව්‍යය වන්නේ බිම් මට්ටමේ ඡන්දදායක අධ්‍යාපන වැඩමුළු පැවැත්වීම සඳහා ප්‍රජා ඉගෙනුම් සහයකයන් පුහුණු කිරීමයි. මෙහි අරමුණු දෙකක් ඇත. එනම්, පොදුවේ වැඩමුළුවක් පවත්වාගෙන යන ආකාරය ප්‍රජා ඉගෙනුම් සහයකයන්හට ඉගැන්වීම සහ විශේෂයෙන්ම ඡන්ද දායකයින්ගේ අධ්‍යාපන වැඩමුළු පවත්වන ආකාරය පිළිබඳව ප්‍රජා ඉගෙනුම් සහයකයන්හට ඉගැන්වීමයි. මෙම පුහුණු වැඩමුළු දේශීය තත්ත්වය, භාෂාව, වාර්ගික අධ්‍යාපන මට්ටම සහ නාගරික ග්‍රාමීය වෙනස්කම් අනුව සැලසුම් කළ යුතුය. වැඩමුළුව සැලසුම් කිරීමේ සහ සංවිධානය කිරීමේ ක්‍රියාවලිය පියවර පහකින් ඉදිරිපත් කළ හැකිය.

### පළමු පියවර:

ඔබෙන්ම මෙසේ අසන්න: වැඩමුළු වලදී ඔබට ලබා ගැනීමට අවශ්‍ය කුමක්ද? ඔබගේ ප්‍රධාන අරමුණු මොනවාද? ඔබගේ වැඩමුළු අවසන් වන විට තරුණයින් / මිනිසුන් දැන ගන්නේ, ඔවුන් සිතන්නේ, ඔවුන්ට දැනෙන්නේ, ඔවුන්ට කිරීමට හැකි වන්නේ කුමක්ද?

### දෙවන පියවර:

වැඩමුළුවට සහභාගිවන්නන් සම්බන්ධයෙන් ඔබට කළ හැකි සියල්ල සොයා ගන්න: මැතිවරණ සහ ඡන්දය පිළිබඳව ඔවුන් දන්නේ මොනවාද? ඔවුන් මීට පෙර වැඩමුළු පවත්වා තිබේද? ඔවුන්ගේ අධ්‍යාපනික පසුබිම කුමක්ද? ඔවුන් භාවිතා කිරීමට කැමති භාෂාව කුමක්ද? ඔවුන් ජීවත් වන්නේ නාගරික හෝ ග්‍රාමීය ප්‍රදේශවලද? ඔවුන් සංවිධානවලට අයත්ද? මෙය ඔබේ වැඩමුළු වැඩසටහන සකස් කිරීමට උපකාරී වන අතර එමඟින් ඔබේ සහභාගීවන්නන්ගේ අවශ්‍යතා මෙන්ම ඔබේ අරමුණු ද සපුරාලයි.

### තෙවන පියවර:

වැඩසටහන ව්‍යුහගත කරන්න: ඔබේ අරමුණු දෙස බලන්න. ඔබෙන්ම අසන්න - මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහභාගීවන්නන්ට අවශ්‍ය තොරතුරු සහ අත්දැකීම් මොනවාද? එක් සැසියකදී අවශ්‍ය ප්‍රමාණයට වඩා ආවරණය කිරීමට උත්සාහ නොකරන්න. බොහෝ නව අදහස් හා සිතුවිලි සමඟ මිනිසුන් ව්‍යාකූල කරනවාට වඩා කුඩා අදහස් ප්‍රමාණයක් ප්‍රවේශමෙන් හා හොඳින් ඉගැන්වීම වඩාත් සුදුසුය.

### සිව්වන පියවර:

සෑම සැසියක්ම ව්‍යුහගත කරන්න: ඔබ තොරතුරු ඉදිරිපත් කරන්නේ කුමන අනුපිළිවෙලටද යන්න තීරණය කරන්න. ඔබ ප්‍රථමයෙන්ම කරන්නේ කුමක්ද? ඔබ ඊළඟට කරන්නේ කුමක්ද? සියලුම සැසි සඳහා හැඳින්වීමක්, ප්‍රධාන විස්තරයක් සහ නිගමනයක් තිබිය යුතුය.

### පස්වන පියවර:

ඉන්පසු ඔබ එක් එක් ගැටලුව ඉදිරිපත් කරන්නේ කෙසේදැයි තීරණය කරන්න. ඔබ භාවිතා කරන ශිල්පීය ක්‍රම මොනවාද? කෙටි සාකච්ඡාවක්? කණ්ඩායම් සාකච්ඡාවක්? ක්‍රීඩාවක්? භූමිකා රංගනයක්? විවාදයක්?

**හයවන පියවර:**

සාකච්ඡාව සංවිධානය කිරීම

- ❖ දී ඇති තේමාවේ හෝ මාතෘකාවේ (ප්‍රජාතන්ත්‍රවාදය/දූෂණය) අර්ථය සාකච්ඡා කිරීමට සහභාගීවන්නන්ගෙන් ඉල්ලා සිටින්න.
- ❖ කතිකාවක් ලෙස පොදු මට්ටමින් ලබා දී ඇති තේමාව ඔස්සේ මොළය කම්පනය කිරීමේ ක්‍රියාවලිය සඳහා සහභාගීවන්නන්ට මග පෙන්වීම.
- ❖ විවේචනාත්මක තර්ක වර්ධනය කිරීමේදී පුරවැසියන්ගේ කාර්යභාරය සාකච්ඡා කිරීමට සහභාගීවන්නන්ගෙන් ඉල්ලා සිටින්න.
- ❖ ප්‍රධාන සටහන් භාවිතයෙන් සැසිය සාරාංශගත කරන්න.

## 8. වැඩමුළුව සැලසුම් කිරීමේදී සහ සංවිධානය කිරීමේදී විශේෂයෙන් සැළකිලිමත් විය යුතු කරුණු කිහිපයක්

1. සහභාගීවන්නන්ගේ දැනුම හා අත්දැකීම් වලට ගරු කරන්න.
2. කණ්ඩායමේ සාමූහික ප්‍රඥාව මත කටයුතු කරන්න.
3. අන් අයගේ අදහස් සඳහා ගරු කිරීම සහ ඉවසීම ගොඩනඟන්න.
4. සියලුම සහභාගීවන්නන් වැඩමුළුවට ක්‍රියාකාරීව සම්බන්ධ කර ගන්න.
5. සහභාගීවන්නන්ට කම්මැලි නොවන පරිදි ඔබේ ක්‍රියාකාරකම් වෙනස් කරන්න.
6. එක් එක් තේමාව හෝ ගැටලුව පැහැදිලිව ඉදිරිපත් කරන්න.
7. ප්‍රශ්න ඇසීමට මිනිසුන්ව දිරිමත් කරන්න.
8. සම්පූර්ණ අත්පොත හොඳින් කියවීමෙන් පසුව ඔබේ සැසිය සැලසුම් කරන්න
9. ඔබේ කාලය නිවැරදිව සකස් කර ඒ අනුව ක්‍රියා කරන්න.
10. සැසිය ආරම්භ වීමට පෙර ඔබට අවශ්‍ය සියල්ල පවතින බවට වග බලා ගන්න
11. වැඩමුළු සඳහා සහභාගීවන්නන් භාවිතා කිරීමට කැමති භාෂාව හෝ භාෂා මොනවාද යන්න පරීක්ෂා කරන්න.
12. හුරුපුරුදු වචන සහ නියමයන් භාවිත කරන්න.
13. නම්‍යශීලී වන්න. සහභාගීවන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඔබේ වැඩමුළුව සකස් කරන්න.
14. බොහෝ කණ්ඩායම් වලට හොඳින්ම වටහාගත හැකි භාෂාවක් භාවිතා කරන්න.
15. ඔබගේ සියලු සැලසුම් කටයුතු සිදු කිරීම අවසාන මොහොත දක්වා තබා නොගන්න.
16. දිගු දේශන පැවැත්වීමෙන් ඔබේ සහභාගීවන්නන් කම්මැලි නොකරන්න.
17. වැඩිහිටියන් හොඳින් ඉගෙන ගන්නේ ප්‍රයෝගික ක්‍රියාකාරකම් කිරීමෙන් බව මතක තබා ගන්න.
18. කිසිවෙකුට නොතේරෙන නුහුරු නුපුරුදු වචන භාවිතා නොකරන්න.

19. කිසිම පුද්ගලයෙකුට සාකච්ඡාවල ආධිපත්‍යය දැරීමට හෝ අන් අය බිය ගැන්වීමට ඉඩ නොදෙන්න.
20. ඔබේම දෘෂ්ටිකෝණය සම්බන්ධයෙන් පක්ෂග්‍රාහී නොවන්න - සවන් දෙන්න.

## 9. ඡන්දදායක අධ්‍යාපනය පුහුණු කිරීම සඳහා පහසුකම් සපයන්නන්ගේ මාර්ගෝපදේශය

### පහසුකම් සපයන්නාගේ මූලික කුසලතා

1. රැස්වීම් කල්තියා සංවිධානය කිරීම.
2. සියලුම සහභාගීවන්නන්ගේ ඒකාකාර සහභාගීත්වය දිරිමත් කිරීම.
3. කණ්ඩායම් අවබෝධය සඳහා ප්‍රශ්න හෝ සංකල්ප නැවත සකස් කිරීම.
4. සංවාද මෙහෙයවීම සහ අවධානය වෙනතකට යොමු වන අවස්ථා ඉවත් කිරීම.
5. කණ්ඩායමේ තීරණ ගැනීමට සහාය වීම.
6. සහයෝගයෙන් හා එක්සත්ව කණ්ඩායමක් පොදු ඉලක්කයක් කරා මෙහෙයවීම.
7. සහභාගීවන්නන් සමඟ හොඳ සම්බන්ධතාවයක් වර්ධනය කිරීම

### පහසුකම් සපයන්නා සහ සහභාගිවන්නන් අතර සම්බන්ධතාවය ගොඩනගා ගන්නේ කෙසේද

1. පහසුකම් සපයන්නාගේ ඇඳුම් පැළඳුම් භාවිතය සම්බන්ධයෙන් සැළකිලිමත් වන්න.
2. සරල, මිත්‍රශීලී, තාක්ෂණික නොවන භාෂාවක් භාවිතා කරන්න.
3. ආන්තික හෝ පෞද්ගලික කාරණා සම්බන්ධයෙන් කථා කිරීමෙන් හෝ ප්‍රශ්න කිරීමෙන් වළකින්න.
4. පහසුකම් සපයන්නා පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වෙනුවට සහභාගීවන්නන් තේරුම් ගැනීමට උත්සාහ කරන්න.
5. ඔවුන්ගේ ජීවන රටාවට සහ ආගමික විශ්වාසයන්ට ගරු කරන්න.
6. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වාර්ගිකත්වය සහ අනෙකුත් සමාජ බෙදීම් කෙරෙහි අපක්ෂපාතී වීමට උත්සාහ කරන්න.
7. දේශීය භෞතික හා පුහුණු පරිසරයට ගැලපීම සඳහා උත්සාහ කරන්න.
8. සහභාගීවන්නන් සමඟ අන්තර් ක්‍රියා කිරීමේදී කිසිවිටෙක ජංගම දුරකථන සහ ටැබ් යන්ත්‍ර භාවිතා නොකරන්න.
9. අවසරයකින් තොරව ඡායාරූප ගැනීමෙන් හෝ පටිගත කිරීමේ උපකරණ භාවිතයෙන් වළකින්න.
10. නියමිත වේලාවට අනුව කටයුතු කිරීමට සහ මිනිසුන්ගේ කාලය සහ වැඩ කාලසටහනට අනුව හැඩගැසීමට උත්සාහ කරන්න

### පහසුකම් සපයන්නාගේ විශේෂ ධාරිතාව

1. චින්තනය උත්තේජනය කිරීමේ හැකියාව සහ කණ්ඩායම් ගතිකත්වය කළමනාකරණය කිරීම.
2. සාකච්ඡා කෙරෙන දේට සවන් දීම සහ එම සාකච්ඡාව සාරාංශගත කිරීම.

3. සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා ශිල්පීය ක්‍රම හෝ ක්‍රියාකාරකම් පිළිබඳ හුරුපුරුදුකම.
4. කණ්ඩායම් සාකච්ඡා වලින් නිර්මාණාත්මක හා විවේචනාත්මක සාකච්ඡාවක් වර්ධනය කිරීම.
5. නැවත සකස් කිරීමට, සාකච්ඡාවේ හරය අල්ලා ගැනීමට සහ රුචිකත්වයන් හඳුනා ගැනීමට හැකි විශ්ලේෂණ කුසලතා.
6. සැසිය පුරාම පුහුණුවීම්වල ඉලක්ක සහ අපේක්ෂාවන් සපුරා ගැනීමට උත්සාහ කිරීම.
7. සදාචාරාත්මක සලකා බැලීම් සම්බන්ධයෙන් සැලකිලිමත් වීම.
8. නිසි පටිගත කිරීම සහ සාක්ෂි පවත්වා ගැනීම.

අදාළ මව් භාෂාවෙන් ක්‍රම හතරක් (04) භාවිතා කරමින් පුහුණුව පවත්වනු ලැබේ. (1) බෙදාගත යුතු දැනුම සහ (2) සරල ආකාරයෙන් බෙදා ගත යුතු ආකාරය පිළිබඳව පහසුකම් සපයන්නා සම්පූර්ණයෙන් දැනුවත් විය යුතුය.

## 1. දේශන පැවැත්වීම

පුහුණු විෂය මාලාව මත පදනම් වූ දේශන ඉදිරිපත් කිරීමේ විනිවිදක (presentation slides) සමඟ පුහුණුවේ සමස්ත තොරතුරු සහ අදාළ දත්ත හෝ විෂය කරුණු ඇතුළත් කර ඇත. පහසුකම් සපයන්නා විෂයමාලා සහ දේශන ද්‍රව්‍ය පිළිබඳව සම්පූර්ණයෙන් හුරුපුරුදු විය යුතුය. කිසියම් අවශ්‍යතාවයක් ඇත්නම්, දේශනයේ අන්තර්ගතය පැහැදිලි හා සරල ලෙස බෙදා ගැනීමට පහසුකම් සපයන්නා සූදානම් විය යුතුය. විෂයමාලාවේ සහ දේශන විනිවිදකවල ඇති සියලුම තාක්ෂණික නියමයන් සහ නිර්වචන පහසුකම් සපයන්නා දැන සිටිය යුතුය.

## 2. සහභාගිවන්නන් සමඟ සාකච්ඡා කිරීම

සහභාගීවන්නන් අතර අදාළ දැනුම බෙදාගැනීමේ දෙවන ආකාරය අන්තර්ක්‍රියාකාරී සාකච්ඡාවයි. මෙම සාකච්ඡාවට ඡන්දදායකයින්ගේ අධ්‍යාපනය සම්බන්ධ ගැටළු පිළිබඳ ප්‍රතිපෝෂණ, තර්ක සහ ප්‍රති තර්ක සමඟ සහයෝගය දැක්විය යුතුය. මෙහිදී පහසුකම් සපයන්නාගේ කාර්යභාරය ඉතා වැදගත් වේ. පහසුකම් සපයන්නා විසින් උපපරිපාලකවරයෙකුගේ භූමිකාවක් ඉටු කළ යුතු අතර සියලුම සහභාගීවන්නන්ට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට වඩා හොඳ පදනමක් සැපයිය යුතුය. සියලුම සහභාගීවන්නන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට සමාන අවස්ථා ඇති බවටත්, සාකච්ඡාවේ දී කිහිප දෙනෙකුට ප්‍රමුඛ වීමට ඉඩ නොදෙන බවටත් පහසුකම් සපයන්නා වග බලා ගත යුතුය.

## 3. අවිධිමත් කණ්ඩායම් / ප්‍රජා සිතියම්ගත කිරීම

මෙම ක්‍රමය PRA වෙතින් ව්‍යුත්පන්න වන අතර අනෙකුත් ආකාරයේ සහභාගීත්ව ප්‍රවේශයන් වල කොටසක් ලෙසද බහුලව භාවිතා වේ. පුහුණු කිරීමේ ප්‍රධාන අරමුණු ලෙස ඡන්ද දායකයින්ගේ

අධ්‍යාපනය ලබා ගැනීමේ ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සඳහා පහසුකම් සපයන්නා විසින් මෙම ක්‍රියාවලිය පැහැදිලි කළ යුතු අතර සියලුම සහභාගීවන්නන් මෙම සාමූහික අභ්‍යාසයට ක්‍රියාකාරීව සම්බන්ධ කර ගත යුතුය.

## 4. ක්‍රියාකාරී සැලැස්මක් සැලසුම් කිරීම

ක්‍රියාකාරී සැලැස්මක්, යම් අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය නිශ්චිත පියවර, කර්තව්‍ය සහ ඉලක්ක ගෙනහැර දැක්වීමට සැලසුම් කර ඇති උපායමාර්ගික මෙවලමක් ලෙස සේවය කරයි. එවැනි ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ ඡන්දදායකයින්ගේ අධ්‍යාපනයේ ගැටලු සහ අර්බුදයට ප්‍රායෝගික උපාය මාර්ගික සැලසුම් සහ ද්‍රව්‍යමය විසඳුම් ඉදිරිපත් කිරීමයි. අක්‍රිය පුරවැසිභාවය, දුර්වල දේශපාලන සාක්ෂරතාව සහ සමාජ අසමානතාවය වැනි අංග ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සැලසුම් කිරීම සඳහා පහසුකම් සපයන්නා විසින් සහභාගීවන්නන්ට සහාය විය යුතුය. පහසුකම් සපයන්නා විසින් කිසියම් ඉඟියක් හෝ සලකුණු ලබා නොදිය යුතු නමුත් මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා සහභාගීවන්නන්ට තාක්ෂණික වශයෙන් සහාය විය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Almond, G. A., & Verba, S. (1963). *The civic culture*. Princeton: Princeton University Press

Andrews, R. N. L. (2001). *Politics, economics, and perceptions*. Conservation Biology, 15, 1485–1487.

Barczyszyn-Madziarz, P., & Żukiewicz, P. (Eds.). (2022). Gender and LGBTQ Issues in Election Processes: Global and Local Contexts (1st ed.). Routledge. https://doi.org/10.4324/9781003204411

Bassett, Debra Lyn. (2003). The politics of the rural vote. Arizona State Law Journal, 35(3), 743-792.

Crick, B. (2003) The English citizenship order 1999: Context, content and presuppositions. In A. Lockyer, B. Crick, & J. Annette (Eds.), *Education for democratic citizenship* (pp. 15-29). Aldershot: Ashgate

Dalton, Russell J. (2008). T*he good citizen: How a younger generation is reshaping American politics*. Washington, DC: CQ Press.

Davis, F. L., Wurth, A. H., & Lazarus, J. C. (2008). The green vote in Presidential Elections: Past Performance and Future Promise. *The Social Science Journal*, *45*(4), 525–545. https://doi.org/10.1016/j.soscij.2008.09.012

Hoskins, Bryony Louise, Barber, Carolyn, Van Nijlen, Daniel, & Villalba, Ernesto (2011). Comparing civic competence among European youth: Composite and domain-specific indicators using IEA civic education study data. *Comparative Education Review*, 55(1), 82-110.

Indian Electoral Commission. (2013). Voter education for inclusive, informed & ethical participation

Kopra, S. (2020). Leadership in Global Environmental Politics.

Kamenou, N. (2024). Queering the ballot: the lesbian, gay, bisexual, trans* and queer vote in troubled times and contexts. *European Journal of Politics and Gender* (published online ahead of print 2024). Retrieved Aug 8, 2024, from https://doi.org/10.1332/25151088Y2024D000000038

Print, Murray & Lange, Dirk. (2013). Civic Education and Competences for Engaging Citizens in Democracies. 10.1007/978-94-6209-172-6.

Putnam, Robert D. (2000). *Bowling alone: The collapse and revival of American community*. New York: Simon and Schuster

Scala, D. J., & Johnson, K. M. (2017). Political Polarization along the Rural-Urban Continuum? The Geography of the Presidential Vote, 2000–2016. The ANNALS of the American Academy of Political and Social Science, 672(1), 162-184. https://doi.org/10.1177/0002716217712696

Transparency International. (2014). Introduction to electoral corruption.

Zeib, Fakhta. (2022). The Influence of Social Media Political Expression on Traditional Voting Behavior of University Students in Pakistan: Exploring the implications of Caste-based and Family pressure-based Voting. *Indian Journal of Economics and Business*. 20. 827-841.

යුරෝපා සංගමයේ මූල්‍ය අනුග්‍රහයෙන්, ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලයේ මූලිකත්වයෙන්, PAFFREL සංවිධානය සමග එක්ව ක්‍රියාත්මක කරන ලද මැතිවරණ සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සක්‍රිය පුරවැසියන් (ACED) ව්‍යාපෘතියේ කොටසක් ලෙස ඡන්දදායක අධ්‍යාපන වැඩසටහන සංවර්ධනය කරන ලදී. මෙම වැඩසටහනේ පරමාර්ථය වන්නේ දේශපාලන බහුත්වය ප්‍රවර්ධනය කිරීම, මහජන සහභාගීත්වය සඳහා වේදිකා නිර්මානය කිරීම සහ ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලීන්හි අඛණ්ඩතාව, විනිවිදභාවය සහ සාධාරණත්වය වැඩිදියුණු කිරීමයි. මෙම ව්‍යාපෘතිය මගින් මහජනතාවට මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙමින් ඔවුන් දැනුවත් කරන අතර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සක්‍රියව සහභාගී වීමට සහ ආරක්ෂා කිරීමට අවස්ථාව ලබා දීම.

16, බෙයාර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.
දුරකථන : (+94) 11 2 558 570 / 1
ෆැක්ස් : (+94) 11 2 558 572
විද්‍යුත් ලිපිනය : paffrel@sltnet.lk